*සැ. යු.* - 2018.10.05 දින පළ වූ අංක 2,092 දරන ගැසට් පත්‍රයේ IV(ආ) කොටස පළ නොවීය.

# ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රය

**අංක 2,093 - 2018 ඔක්තෝබර් මස 12 වැනි සිකුරාදා - 2018.10.12**

(රජයේ බලයපිට ප්‍රසිද්ධ කරන ලදී)

## IV(ආ) වැනි කොටස - පළාත් පාලනය

(වෙන වෙනම ගොනු කර ගත හැකි පරිදි සෑම කොටසකට ම අයත් එක් එක් භාෂාවකට වෙන වෙනම පිටු අංක යොදා ඇත)

| | පිටුව |
|---|---|
| තනතුරු- ඇබෑර්තු .... ... ... | 1546 |
| විභාග, විභාග ප්‍රතිඵල ආදිය ... ... ... | — |
| බඩුබාහිරාදිය විකිණීම් ... ... ... | — |
| පළාත් පාලන නිවේදන ... ... ... | 1576 |
| පළාත් පාලන සහ ඡන්ද ආඥාපනත යටතේ දැන්වීම් .. | — |
| ආදායම් හා වියදම් පිළිබඳ ප්‍රකාශන ... ... | — |
| අයවැය ලේඛන ... ... ... | 1594 |
| දේපළ විකිණීම් ... ... ... | — |
| විවිධ දැන්වීම් ... ... ... | 1609 |

**සතිපතා නිකුත් වන ගැසට් පත්‍රයෙහි පළකිරීම සඳහා භාරගනු ලබන දැන්වීම් පිළිබඳ**

**වැදගත් නිවේදනයයි**

ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ *ගැසට් පත්‍රයේ* අවසන් පිටුවේ සෑම මාසයක ම මුල් සතියේ දී පළ කරන නිවේදන භාරගන්නා දිනයන් සහ වේලාවන් පිළිබඳව මින් අවධානය යොමු කරනු ලැබේ.

*ගැසට් පත්‍රයේ* පළ කිරීම සඳහා දැන්වීම් භාරගැනීම *ගැසට් පත්‍රය* පළකරනු ලබන දිනයට සති දෙකකට පෙර සිකුරාදා දිනයෙහි දහවල් 12.00 ට අවසන් කරනු ලැබේ. තනතුරු - ඇබෑර්තු, විභාග, ටෙන්ඩර් සහ වෙන්දේසි පිළිබඳ දැන්වීම්වල අවසන් දින සහ වේලාවන් ඒ පිළිබඳව උනන්දුවක් දක්වන අයට ප්‍රමාණවත් කාල වේලාවක් ලැබෙන පරිදි යොදාගත යුතු බවට, සියලු ම දෙපාර්තමේන්තු, සංස්ථා සහ මණ්ඩල යනාදිය වගබලාගත යුතු බව මින් අවධාරණය කෙරේ. පළකිරීම සඳහා එවනු ලබන සෑම දැන්වීමක් ම තනි පැත්තේ පමණක් පැහැදිලිව පිටපත් කළ යුතු ය. **නිරවද්‍යතාවය පිළිබඳව කරන විමසීම් සහ පැමිණිලි ගැසට් පත්‍රය පළ වූ දින සිට තෙමසකට පසුව භාරගනු නොලැබේ.**

*ගැසට් පත්‍රයේ* පළ කරන සෑම දැන්වීමක් ම *ගැසට් පත්‍රය* පළකරනු ලබන දිනට සති දෙකකට පෙර එනම්, 2018 නොවැම්බර් මස 02 වැනි දින පළකරන *ගැසට් පත්‍රයේ* දැන්වීම් 2018 ඔක්තෝබර් මස 19 වැනි දින දහවල් 12.00ට හෝ ඊට පෙර තැපෑලෙන් හෝ ගෙනවිත් රජයේ මුද්‍රණාලයට භාරදිය යුතු ය.

**2006 අංක 19 දරන ඉලෙක්ට්‍රොනික ගනුදෙනු පනත - 9 වැනි වගන්තිය**

*"යම් ප්‍රකාශනයක්, රීතියක්, නියෝගයක්, නියමයක්, අතුරු ව්‍යවස්ථාවක්, නිවේදනයක් හෝ වෙනත් කිසිවක් ගැසට් පත්‍රයේ පළ කළ යුතු බවට යම් පනතකින් හෝ නීති ප්‍රඥප්තියකින් විධිවිධාන සලස්වා ඇති අවස්ථාවක, ඒ රීතිය, නියෝගය, නියමය, අතුරු ව්‍යවස්ථාව, නිවේදනය හෝ වෙනත් දෙය ඉලෙක්ට්‍රොනික ස්වරූපයේ වන ගැසට් පත්‍රයක පළ කරනු ලැබුවහොත් ඒ විධිවිධානය සම්පූර්ණ කර ඇත්තාක් සේ සැලකිය යුතු ය."*

**ගංගානි ලියනගේ,**
රජයේ මුද්‍රණාලයාධිපති

2018 ජනවාරි මස 01 වැනි දින,
කොළඹ 08,
රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ දී ය.

මෙම *ගැසට් පත්‍රය* *www. documents.gov.lk* වෙබ් අඩවියෙන් බාගත කළ හැක.

1545 - B 81458— 5,403 (2018/10)

# තනතුරු - ඇබෑර්තු

## කොටගල ප්‍රාදේශීය සභාව

### ප්‍රාථමික ශ්‍රේණියේ ශිල්පීය, අර්ධ ශිල්පීය, ශිල්පීය නොවන තනතුරු සඳහා බඳවා ගැනීම

මධ්‍යම පළාත් රාජ්‍ය සේවයේ කොටගල ප්‍රාදේශීය සභාවේ දැනට පුරප්පාඩු වී ඇති පහත සඳහන් තනතුරු වලට බඳවා ගැනීම සඳහා මෙම නිවේදනයේ සඳහන් සුදුසුකම් ඇති කොටගල ප්‍රාදේශීය සභා බල ප්‍රදේශයේ ස්ථිර පදිංචිය ඇති අයගෙන් අයදුම්පත් කැඳවනු ලැබේ. මෙම නිවේදනය අවසානයේ දැක්වෙන ආදර්ශ අයදුම්පත්‍රය අනුව සකස් කල අයදුම්පත් 2018.10.26 වැනි දිනට පෙර ලේකම්, කොටගල ප්‍රාදේශීය සභාව, කොටගල යන ලිපිනයට ලැබෙන පරිදි ලියාපදිංචි තැපෑලෙන් පමණක් එවිය යුතුය. ඉල්ලුම්පත් බහා එවන ලිපි කවරයේ වම් පස ඉහළ කෙළවරේ ඔබ විසින් ඉල්ලුම් කරන තනතුර සඳහන් කළ යුතුය. තනතුරු කිහිපයකට ඉල්ලුම් කරන්නේ නම් වෙන් වෙන් වශයෙන් අයදුම්පත් යොමු කළ යුතුය.

| *අනු. අංකය* | *තනතුරු නාමය* | *තනතුරු සංඛ්‍යාව* | *අනුයුක්ත කරන ස්ථානය හා කාර්යය* | *වැටුප් පරිමාණය* | *අධ්‍යාපන හා වෙනත් සුදුසුකම්* |
|---|---|---|---|---|---|
| 01 | රියදුරු III වන ශ්‍රේණිය | 02 | කොටගල ප්‍රාදේශීය සභාව මූලික අවශ්‍යතාවය වන ප්‍රවාහන සේවාවන්ට සම්බන්ධ ආයතන ප්‍රධානියා විසින් පවරනු ලබන රාජකාරි | රු. 25,790 - 10x270 - 10x 300 - 10x330 - 12x350 - රු. 38,990 (රා.ප.ච. 3/2016-PL3 වැටුප් පරිමාණයේ 1 පියවර ආරම්භක වැටුප් පියවර වශයෙන් සැලකේ. (4 වන වැටුප් පියවරට එළඹීමට පෙර කාර්යක්ෂමතා කඩඉමකි) | *අධ්‍යාපන සුදුසුකම් :* අධ්‍යයන පොදු සහතික පත්‍ර සාමාන්‍ය පෙළ විභාගයේ දී දෙවරකට නොවැඩි වාර ගණනක දී යටත් පිරිසෙයින් සම්මාන 02 ක් සහිතව විෂයයන් 06 ක් සමත්ව තිබීම. මින් විෂයයන් 5ක් එක් වරකදී සමත් වී තිබිය යුතුය.<br>*වෘත්තීය සුදුසුකම් :* තාර බර හොන්ඩර 34 ට වැඩි බර මෝටර් වාහන බර ට්‍රේලර් සහ මගීන් 32 ට නොවැඩි සංඛ්‍යාවක් ගෙන යා හැකි බස් රථ සඳහා රියදුරු බලපත්‍රයක් එනම් මෝටර් රථ ප්‍රවාහන කොමසාරිස් විසින් නිකුත් කරන ලද ඒ වාහන පන්තියේ බලපත්‍රයක් හෝ නව රියදුරු බලපත්‍රය අනුව ඒ1/ඒ බී1/බී/සී1/සී/සීඉ/ඩී1/ඩී/ජී1/ජී/ ජේ පන්තියේ බලපත්‍රයක් ලබා තිබීම.<br>*පළපුරුද්ද :* මෝටර් රථ පැදවීමේ බලපත්‍රය ලැබීමෙන් පසු අවම වසර 03 ක පළපුරුද්ද ලබා තිබීම (පළපුරුද්ද විධිමත් සහතිකයක් මඟින් සනාථ කළ යුතුය.)<br>*කායික සුදුසුකම් :* අවම උස අඩි 05 අඟල් 02 1/2ක් විය යුතුය.<br>මනා ඇස් පෙනීමක් තිබිය යුතු අතර දිවා කාලයේ දී සහ රාත්‍රී කාලයේදී සේවයේ යෙදීම පිණිස ප්‍රමාණවත් ශාරීරික හා මානසික යෝග්‍යතාවයෙන් යුක්ත විය යුතුය. මාර්ග නීති සංග්‍රහය ගැන මනා දැනුමකින් යුක්ත විය යුතුය.<br>බඳවා ගැනීමේ ක්‍රමය :<br>*ධාරාව* – *ප්‍රතිශතය*<br>විවෘත – 70%<br>සීමිත – 30% |

| අනු. අංකය | තනතුරු නාමය | තනතුරු සංඛ්‍යාව | අනුයුක්ත කරන ස්ථානය හා කාර්යය | වැටුප් පරිමාණය | අධ්‍යාපන හා වෙනත් සුදුසුකම් |
|---|---|---|---|---|---|
| 02 | මාර්ග කම්කරු III වන ශ්‍රේණිය | 13 | කොටගල ප්‍රාදේශීය සභා බල ප්‍රදේශයේ මාර්ග දෙපස කාණු පවිත්‍ර කිරීම, තණකොළ කැපීම, කහඉරි ඇඳීමට සහය වීම, තාර දැමීම,ප්‍රීමික්ස් සැකසීමට අත් උදව් දීම,මාර්ග අතුගෑම, පිරිසිදු කිරීම, කසල එකතුකර ලොරියට දැමීම, පොදු වැසිකිළි හා කැසිකිළි පවිත්‍ර කිරීමේ කාර්යයන් | රු. 24,250 - 10x250 - 10x 270 - 10x300 - 12x330 - රු. 36,410 (රා.ප.ච. 3/2016-PL1 වැටුප් පරිමාණයේ 1 පියවර ආරම්භක වැටුප් පියවර වශයෙන් සැලකේ. (4 වන වැටුප් පියවරට එළඹීමට පෙර කාර්‍යක්‍ෂමතා කඩඉමකි) | *අධ්‍යාපන සුදුසුකම් :*<br><br>අධ්‍යයන පොදු සහතික පත්‍ර සාමාන්‍ය පෙළ විභාගයේ දී දෙවරකට නොවැඩි වාර ගණනක දී යටත් පිරිසෙයින් විෂයයන් 02කට සම්මාන සහිතව විෂයයන් 06 ක් සමත්ව තිබීම. මින් විෂයයන් 5ක් එක් වරකදී සමත් වී තිබිය යුතුය. සුදුසුකම් සපුරා නොමැති අයදුම්කරුවන් නොමැති අවස්ථා වල 5 ශ්‍රේණිය සමත් අයවලුන් බඳවා ගැනීමට කටයුතු කරනු ලැබේ. |
| 03 | සෞඛ්‍ය කම්කරු III වන ශ්‍රේණිය | 06 | කොටගල ප්‍රාදේශීය සභා බල ප්‍රදේශයේ මාර්ග දෙපස කාණු පවිත්‍ර කිරීම, තණකොළ කැපීම, කහඉරි ඇඳීමට සහය වීම, තාර දැමීම,ප්‍රීමික්ස් සැකසීමට අත් උදවු දීම,මාර්ග අතුගෑම, පිරිසිදු කිරීම, කසල එකතුකර ලොරියට දැමීම, පොදු වැසිකිළි හා කැසිකිළි පවිත්‍ර කිරීමේ කාර්යයන් | රු. 24,250 - 10x250 - 10x 270 - 10x300 - 12x330 - රු. 36,410 (රා.ප.ච. 03/2016-PL1 වැටුප් පරිමාණයේ 1 පියවර ආරම්භක වැටුප් පියවර වශයෙන් සැලකේ. (4 වන වැටුප් පියවරට එළඹීමට පෙර කාර්‍යක්‍ෂමතා කඩඉමකි) | *අධ්‍යාපන සුදුසුකම් :*<br><br>අධ්‍යයන පොදු සහතික පත්‍ර සාමාන්‍ය පෙළ විභාගයේ දී දෙවරකට නොවැඩි වාර ගණනක දී යටත් පිරිසෙයින් විෂයයන් 02 කට සම්මාන සහිතව විෂයයන් 06 ක් සමත්ව තිබීම. මින් විෂයයන් 5ක් එක් වරකදී සමත් වී තිබිය යුතුය. සුදුසුකම් සපුරා නොමැති අයදුම්කරුවන් නොමැති අවස්ථා වල 5 ශ්‍රේණිය සමත් අයවලුන් බඳවා ගැනීමට කටයුතු කරනු ලැබේ. |
| 04 | ආදාහනාගාර ක්‍රියාකරු සහායක III වන ශ්‍රේණිය | 01 | කොටගල ප්‍රාදේශීය සභාවට අයත් ආදාහනාගාරයේ සියළුම කාර්යයන් සඳහා සහය වීම | රු. 24,250 - 10x250 - 10x 270 - 10x300 - 12x330 - රු. 36,410 (රා.ප.ච. 03/2016-PL1 වැටුප් පරිමාණයේ 1 පියවර ආරම්භක වැටුප් පියවර වශයෙන් සැලකේ. (4 වන වැටුප් පියවරට එළඹීමට පෙර කාර්‍යක්‍ෂමතා කඩඉමකි) | *අධ්‍යාපන සුදුසුකම් :*<br><br>අධ්‍යයන පොදු සහතික පත්‍ර සාමාන්‍ය පෙළ විභාගයේ දී දෙවරකට නොවැඩි වාර ගණනක දී යටත් පිරිසෙයින් විෂයයන් 02 කට සම්මාන සහිතව විෂයයන් 06 ක් සමත්ව තිබීම. මින් විෂයයන් 5ක් එක් වරකදී සමත් වී තිබිය යුතුය. |

| *අනු. අංකය* | *තනතුරු නාමය* | *තනතුරු සංඛ්‍යාව* | *අනුයුක්ත කරන ස්ථානය හා කාර්යය* | *වැටුප් පරිමාණය* | *අධ්‍යාපන හා වෙනත් සුදුසුකම්* |
|---|---|---|---|---|---|
| 05 | කාර්යාල කාර්ය සහායක III වන ශ්‍රේණිය | 02 | කොටගල ප්‍රාදේශීය සභාවේ දුරකථන ක්‍රියාකරු වශයෙන් කටයුතු කිරීම හෝ පොත් බැඳීමේ කාර්යය හෝ ලේඛන භාරකරු වශයෙන් ක්‍රියා කිරීම හෝ ඡායා පිටපත් යන්ත්‍ර ක්‍රියාකරු වශයෙන් ක්‍රියා කිරීම හෝ පණිවිඩකරු කාර්යයේ නිරතවීම හෝ පිළිගැනීමේ නිළධාරි වශයෙන් ක්‍රියා කිරීම හෝ කාර්යාල කාර්ය සහායක වශයෙන් කාර්යාල අභ්‍යන්තරයේ හෝ බාහිරව ක්‍රියා කිරීම | රු. 24,250 - 10x250 - 10x 270 - 10x300 - 12x330 - 36,410 (රා.ප.ච. 03/2016-PL1 වැටුප් පරිමාණයේ 1 පියවර ආරම්භක වැටුප් පියවර වශයෙන් සැලකේ. (4 වන වැටුප් පියවරට එළඹීමට පෙර කාර්යක්ෂමතා කඩඉමකි) | *අධ්‍යාපන සුදුසුකම් :*<br><br>අධ්‍යයන පොදු සහතික පත්‍ර සාමාන්‍ය පෙළ විභාගයේ දී දෙවරකට නොවැඩි වාර ගණනක දී යටත් පිරිසෙයින් විෂයයන් 02 කට සම්මාන සහිතව විෂයයන් 06 ක් සමත්ව තිබීම. මින් විෂයයන් 05ක් එක් වරකදී සමත් වී තිබිය යුතුය. |
| 06 | ජල කම්කරු III වන ශ්‍රේණිය | 02 | කොටගල ප්‍රාදේශීය සභා බල ප්‍රදේශයේ ජල නල එළීම හා අළුත්වැඩියා කිරීමේ කටයුතු හා කාණු කැපීමේ කටයුතු | රු. 24,250 - 10x250 - 10x 270 - 10x300 - 12x330 - 36,410 (රා.ප.ච. 03/2016-PL1 වැටුප් පරිමාණයේ 1 පියවර ආරම්භක වැටුප් පියවර වශයෙන් සැලකේ. (4 වන වැටුප් පියවරට එළඹීමට පෙර කාර්යක්ෂමතා කඩඉමකි.) | *අධ්‍යාපන සුදුසුකම් :*<br><br>අධ්‍යයන පොදු සහතික පත්‍ර සාමාන්‍ය පෙළ විභාගයේ දී දෙවරකට නොවැඩි වාර ගණනක දී යටත් පිරිසෙයින් විෂයයන් 02 කට සම්මාන සහිතව විෂයයන් 06 ක් සමත්ව තිබීම. මින් විෂයයන් 05ක් එක් වරකදී සමත් වී තිබිය යුතුය. |
| 07 | විදුලි කාර්මික III වන ශ්‍රේණිය | 01 | කොටගල ප්‍රාදේශීය සභාවට අයත් ගොඩනැගිලි හා වීදි පහන් නඩත්තු කටයුතු හා ආයතන ප්‍රධානියා විසින් නියම කරන රාජකාරි කටයුතු | රු. 25,250 - 10x270 - 10x 300 - 10x330 - 12x350 - 38,450 (රා.ප.ච. 03/2016-PL2 වැටුප් පරිමාණයේ 1 පියවර ආරම්භක වැටුප් පියවර වශයෙන් සැලකේ. (4 වන වැටුප් පියවරට එළඹීමට පෙර කාර්යක්ෂමතා කඩඉමකි.) | *අධ්‍යාපන සුදුසුකම් :*<br><br>අධ්‍යයන පොදු සහතික පත්‍ර සාමාන්‍ය පෙළ විභාගයේ දී දෙවරකට නොවැඩි වාර ගණනක දී සිංහල හෝ දෙමළ භාෂාව සමග අවම වශයෙන් විෂයයන් 02 කට සම්මාන සහිතව විෂයයන් 06 ක් සමත්ව තිබීම.<br><br>*ශිල්පීය නිපුනතා / ප්‍රවීණතා :*<br><br>වෘත්තියට අදාලව ජාතික වෘත්තීය සුදුසුකම් 02 වන මට්ටමේ (NVQ 2) හෝ 3 වන මට්ටමේ (NVQ 3) සහතිකය ලබා තිබීම.<br><br>*හෝ* |

| අනු. අංකය | තනතුරු නාමය | තනතුරු සංඛ්‍යාව | අනුයුක්ත කරන ස්ථානය හා කාර්යය | වැටුප් පරිමාණය | අධ්‍යාපන හා වෙනත් සුදුසුකම් |
|---|---|---|---|---|---|
| | | | | | කාර්මික අධ්‍යාපනය හා පුහුණු කිරීමේ දෙපාර්තමේන්තුවේ (DTET) වෘත්තියට අදාළව එක් වසරකට නොඅඩු පාඨමාලාවක් හදාරා සහතික ලබා තිබීම.<br>*හෝ*<br>ජාතික තරුණ සේවා සභාවේ (NYC) වෘත්තියට අදාළව එක් වසරකට නොඅඩු පාඨමාලාවක් හදාරා සහතිකය ලබා තිබීම.<br>*හෝ*<br>ශ්‍රී ලංකා වෘත්තීය පුහුණු කිරීමේ අධිකාරියේ (VTA) වෘත්තියට අදාළව එක් වසරකට නොඅඩු පාඨමාලාවක් හදාරා සහතිකය ලබා තිබීම.<br>*හෝ*<br>ජාතික ආධුනිකත්ව හා කාර්මික පුහුණු කිරීමේ දෙපාර්තමේන්තුවේ (NAITA) වෘත්තියට අදාලව එක් වසරක පාඨමාලාවක් හදාරා සහතිකය ලබා තිබීම.<br>*හෝ*<br>තෘතිය හා වෘත්තිය අධ්‍යාපන කොමිෂන් සභාවේ ලියාපදිංචි කාර්මික පුහුණු ආයතනයක වෘත්තියට අදාළව එක් වසරකට නොඅඩු පාඨමාලාවක් සම්පූර්ණ කර සහතිකය ලබා තිබීම.<br>**පළපුරුද්ද**<br>අදාල ක්ෂේත්‍රයේ අවුරුදු 02 ක පළපුරුද්දක් ලබා තිබීම. |

*02. බඳවා ගැනීමේ කොන්දේසි :*

1. අයදුම්කරුවන් පරම්පරාවෙන් හෝ ලියාපදිංචි වීමෙන් ශ්‍රී ලාංකික පුරවැසියෙකු විය යුතු ය.
2. අයදුම්කරුවන් මනා මානසික හා ශාරීරික යෝග්‍යතාවයකින් යුක්ත විය යුතු ය.
3. අයදුම්පත් කැඳවන දිනට පූර්වාසන්න වසර තුනක කාලයක් කොටගල ප්‍රාදේශීය සභා බල ප්‍රදේශයේ ස්ථිර පදිංචිකරුවෙකු විය යුතුය. (ඡන්ද හිමි නාමලේඛණයෙන් හෝ ප්‍රාදේශීය ලේකම් නිකුත් කරනු ලබන සහතිකයකින් පදිංචිය සනාථ කළ යුතු ය.)
4. අයදුම්පත් කැඳවන අවසාන දිනට වයස අවුරුදු 18 ට නොඅඩු අවුරුදු 45 ට නොවැඩි විය යුතුය. (දැනටමත් රාජ්‍ය සේවයේ හෝ කිසියම් පළාත් රාජ්‍ය සේවයක ස්ථිර සේවයේ නියුක්ත තැනැත්තන්ට උපරිම වයස් සීමාව අදාළ නොවේ.)
5. ඉහත දක්වා ඇති එක් එක් තනතුරට අදාළව ඉදිරියෙන් දක්වා ඇති අවම සුදුසුකම් සපුරා තිබිය යුතු ය.
6. බඳවා ගැනීමේ පටිපාටිය අනුව විධිමත් ව්‍යුහගත සම්මුඛ පරීක්ෂණයකට යොමු කරනු ලබන අතර, එහිදී ලබාගන්නා ඉහළම ලකුණු අනුව සුදුස්සන් තෝරා ගැනේ.
7. රියදුරු තනතුර සඳහා ඉල්ලුම්කරන අය ලිඛිත පරීක්ෂණයකට ඉදිරිපත් විය යුතු අතර, අවශ්‍ය සියලුම සුදුසුකම් සපුරා ඇති හා ඉහළම ලකුණු ලැබූ අපේක්ෂකයන්ගෙන් වෘත්තීය පරීක්ෂණයක ප්‍රථිඵල මත කුසලතා අනුපිළිවෙල අනුව බඳවා ගනු ලැබේ.

සීමිත බඳවා ගැනීමේ දී කායික මානසික යෝග්‍යතාවය සහ අධ්‍යාපන, වෘත්තීය හා පොදු සුදුසුකම් පරීක්ෂා කිරීම සඳහා වන සම්මුඛ පරීක්ෂණයක් සමඟ ව්‍යුහගත සම්මුඛ පරීක්ෂණයක් (අර්ධ ශිල්පීය හා ශිල්පීය නොවන තනතුරු සඳහා) මඟින් ලබා ගන්නා ප්‍රතිඵල මත සුදුසුකම් ලබන්නන් මෝටර් රථ පරීක්ෂක විසින් පවත්වන ප්‍රායෝගික පරීක්ෂණයක දී සුදුසුකම් ලබා ගත යුතු ය.

8. අයදුම්පත් කැඳවීමෙන් අනතුරුව හෝ අයදුම්පත් කැඳවන අතරතුර බඳවා ගැනීම ප්‍රමාද කිරීම හෝ වෙනස් කිරීම හෝ මෙම නිවේදනය සංශෝධනය කිරීම හෝ අවලංගු කිරීමේ බලය කොටගල ප්‍රාදේශීය සභාවේ ලේකම් සතු වේ.

9. දැනටමත් කොටගල ප්‍රාදේශීය සභාවේ එම තනතුරුවල අනියම්, ආදේශක, දීමනා, කොන්ත්‍රාත් හෝ කුළී පදනම යටතේ සේවයේ නියුතු වූවන් කෙරෙහි වැඩි සැලකිල්ලක් දක්වනු ලබන අතර, ඔවුන් ආයතන ප්‍රධානියා මගින් තම අයදුම්පත් ඉදිරිපත් කළ යුතු ය.

10. තෝරාගනු ලබන අයදුම්කරුවන් ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ නීති වලට ද පළාත් පාලන දෙපාර්තමේන්තුවේ රෙගුලාසි වලට ද කොටගල ප්‍රාදේශීය සභාව දැනට පනවා ඇති හා පනවනු ලබන නීතිවලට හා එකී නීති රීති සියල්ලට යටත් විය යුතු ය.

11. මූලික සුදුසුකම් සපුරා ඇති අයදුම්කරුවන් පමණක් සම්මුඛ පරීක්ෂණයට කැඳවනු ලැබේ.

12. යම් හෙයකින් අදාළ සුදුසුකම් සහිත ප්‍රමාණවත් අයදුම්පත් සංඛ්‍යාවක් නොලැබුනේ නම් අවට ප්‍රාදේශීය සභා බල ප්‍රදේශයෙන් ලැබුනු අයදුම්පත් කෙරෙහි අවධානය යොමු කරනු ඇත.

03. *සේවයේ නියුක්ත කරවීමේ කොන්දේසි :*

1. මෙම තනතුරු ස්ථිරය. විශ්‍රාම වැටුප් සහිත ය.
2. වැන්දඹු/ වැන්දඹු පුරුෂ හා අනත්දරු විශ්‍රාම වැටුප් අරමුදලට දායක විය යුතු ය.
3. බඳවා ගනු ලබන අය වසර 03 ක පරිවාස කාලයකට යටත් ය. එම කාලය තුළදී වැඩ පැමිණීම හා හැසිරීම සතුටුදායක වේ නම් පරිවාස කාලය අවසානයේ සේවය ස්ථිර කරනු ලැබේ.
4. රාජ්‍ය භාෂා ප්‍රතිපත්තිය අනුව අවශ්‍ය භාෂා ප්‍රවීණතාවය ලබා දිය යුතු ය.
5. බඳවා ගැනීමේ කොන්දේසිවලට අමතරව ආයතන සංග්‍රහයේ II පරිච්ඡේදයේ බඳවා ගැනීම සඳහා වන අනෙකුත් පොදු කොන්දේසිවලට යටත් විය යුතු ය.
6. යහපත් චරිතයකින් යුක්ත විය යුතු අතර කොටගල ප්‍රදේශයේ සේවය කිරීමට සුදුසු ශරීර සෞඛ්‍යයකින් යුක්ත තැනැත්තෙකු විය යුතු ය.
7. දණ්ඩ නීති සංග්‍රහය යටතේ උසාවියකින් වරදකරු වී දඬුවම් ලැබූවෙකු නොවිය යුතු ය.
8. රජයේ හෝ පළාත් රාජ්‍ය සේවයෙන් පහ කරනු ලැබූවෙකු නොවිය යුතු අතර රාජ්‍ය පරිපාලන චක්‍රලේඛ 44/90 යටතේ විශ්‍රාම ලැබූවෙකු නොවිය යුතුය. කොටගල ප්‍රාදේශීය සභා බල ප්‍රදේශය තුළ කෙරෙන ස්ථාන මාරුවීම්වලට යටත් වේ.
9. සේවයේ අකාර්යක්ෂමතාවයක් හෝ අසතුටුදායක තත්වයක් පෙනී ගියහොත් සභාවේ මනාපය පරිදි සේවය අවසන් කිරීමේ බලය ප්‍රාදේශීය සභාව සතුය.

04. අයදුම්පත් ඉදිරිපත් කළ යුතු ආකාරය :

මෙම නිවේදනය අවසානයේ දක්වා ඇති ආදර්ශ ආකෘතියට අනුව A4 ප්‍රමාණයේ කඩදාසියක දෙපැත්ත භාවිතා කරමින් අයදුම්පත් පිළියෙල කර ඉදිරිපත් කළ යුතු ය. අයදුම්පත් බහා එවන ලිපි කවරයේ වම්පස ඉහළ කෙලවරේ ඉල්ලුම්කරන තනතුර සඳහන් කර 2018.10.26 වැනි දින හෝ එදිනට පෙර ලැබෙන සේ "ලේකම්, ප්‍රාදේශීය සභාව, කොටගල" යන ලිපිනයට ලියාපදිංචි තැපෑලෙන් පමණක් එවිය යුතු ය. තැපෑලේ දී නැති වන හෝ වැරදි ලෙස ලිපිනය ලිවීමෙන් ආපසු හරවා යැවෙන අයදුම්පත් සම්බන්ධයෙන් වග කියනු නොලබන අතර, නියමිත දිනට පසුව ලැබෙන අයදුම්පත් ප්‍රතික්ෂේප කරනු ලැබේ.

අයදුම්පත සමඟ පහත සඳහන් ලිපි ලේඛනවල සහතික කළ පිටපත් අමුණා එවිය යුතුය.

1. උප්පැන්න සහතිකය,
2. ජාතික හැඳුනුම්පත,
3. අධ්‍යාපන සහතික,
4. ග්‍රාම නිලධාරි විසින් නිකුත් කළ පදිංචි සහතිකය (ප්‍රාදේශීය ලේකම් අනු අත්සන් කළ යුතුය),
5. වෘත්තීය සුදුසුකම් දක්වෙන සහතික,
6. සේවා පළපුරුද්ද පිළිබඳ සහතික ,
7. මෑතකදී ලබා ගත් චරිත සහතික 02.

වී. ශ්‍රී ගෞරි,
ලේකම්,
කොටගල ප්‍රාදේශීය සභාව,
කොටගල.

**කොටගල ප්‍රාදේශීය සභාවේ.............................................................. තනතුර සඳහා අයදුම්පත්‍රය**

1. සම්පූර්ණ නම :...............................................................
2. ලිපිනය :...............................................................
3. දුරකථන අංකය :...............................................................
4. උපන් දිනය :...............................................................
5. ජාතික හැඳුනුම්පත් අංකය :- (ඡායා පිටපතක් ඇමිණිය යුතුය.)
6. 2018. ............................ දිනට වයස :...............................................................
7. පුරවැසිභාවය :...............................................................
8. ස්ත්‍රී / පුරුෂ භාවය :...............................................................
9. විවාහක ද? /අවිවාහක ද? යන වග :...............................................................
10. දැනට තනතුරක් දරන්නේ නම් එම විස්තර :
    (i) එම තනතුරේ නම :...............................................................
    (ii) එයට පත් වූ දිනය :...............................................................
    (iii) පත්වීමේ ස්වභාවය (ස්ථිර/අනියම්/තාවකාලික) :...............................................................
    (iv) මැතිවරණ කොට්ඨාසය :...............................................................
    (v) පළපුරුද්ද හා සේවා කාලය :...............................................................

11. අධ්‍යාපන සුදුසුකම් :

(සමර්ථ වී ඇති උපරිම ශ්‍රේණිය සඳහන් සහතිකවල පිටපත් ඇමිණිය යුතුය.)
අ. පො. ස. (සා.පෙළ) විභාගය සමත් වර්ෂය :-.................................... විභාග අංකය :- .......................................

| *අනු. අංකය* | *විෂයය* | *සාමාර්ථය* | *අනු. අංකය* | *විෂයය* | *සාමාර්ථය* |
|---|---|---|---|---|---|
| | | | | | |
| | | | | | |
| | | | | | |
| | | | | | |
| | | | | | |

12. වෘත්තීය සුදුසුකම් :..................................................................
13. වෙනත් සුදුසුකම් :....................................... (තාක්ෂණික දැනුම පිළිබඳ සහතික වල පිටපත් ඇමිණිය යුතුය.)
14. ඔබ කවරදාක හෝ චෝදනාවක් සඳහා උසාවියකින් වරදකරු කරනු ලැබ තිබේ ද? :-
15. ඔබ දැනටමත් මෙම ප්‍රාදේශීය සභාවේ සේවයේ නියුක්තව සිටී ද? ඔව්/ නැත :-
(ඔව් නම් දැනට දරන තනතුර හා එම තනතුරට පත් වූ දිනය:-

ඉහත සඳහන් අංක 01 - 15 දක්වා කරුණු සත්‍ය හා නිවැරදි බවට සහතික කරන අතර යම් විටක දී මෙම තොරතුරු අසත්‍ය බව හෙළි වුවහොත් මා සේවයෙන් පහ කිරීමට යටත් වන බව තේරුම් ගෙන ඇති බවත්, ඉල්ලුපත්‍ර කැඳවීමේ කොන්දේසි වලට මම යටත් වන බවත් ප්‍රකාශ කරමි.

..............................
අයදුම්කරුගේ අත්සන.

දිනය :.....................

**දැනට රාජ්‍ය සේවයේ නියුක්ත අයදුම්කරුවන් සඳහා ආයතන ප්‍රධානියාගේ සහතිකය**

මෙම ඉල්ලුම්කරු වන ........................................... යන අය මෙම ආයතනයේ .................................................. වශයෙන් ............................ ............ දින සිට සේවය කරනු ලබයි. ඉල්ලා ඇති තනතුරට තෝරා ගතහොත් ඔහු/ ඇය දැනට දරන තනතුරෙන් නිදහස් කළ හැක./ නොහැක. ඔහු/ ඇය කිසිම නීත්‍යානුකූල දඬුවමකට භාජනය වී නොමැති බව මින් සහතික කරන අතර අයදුම්පත නිර්දේශ කර ඉදිරිපත් කරමි.

ආයතන ප්‍රධානියාගේ අත්සන
නිල මුද්‍රාව.

දිනය ..............................
නම :..............................
තනතුර :..............................
ආයතනය :..............................

10 - 368

---

## මිල්ලනිය ප්‍රාදේශීය සභාව

### තනතුරු පුරප්පාඩු

මිල්ලනිය ප්‍රාදේශීය සභාවේ පහත සඳහන් තනතුරුවල පුරප්පාඩු සඳහා මෙම නිවේදනයේ සඳහන් සුදුසුකම් සපුරා ඇති ශාරීරික හා මානසික යෝග්‍යතාවයකින් හෙබි බස්නාහිර පළාත තුළ ස්ථිර පදිංචිකරුවන්ගෙන් අයදුම්පත් කැඳවනු ලැබේ.

| *අනු. අංක* | *සේවා ශ්‍රේණිය හා තනතුරු නාමය* | *පුරප්පාඩු ගණන* | *අධ්‍යාපන හා වෙනත් සුදුසුකම්* | *වැටුප් පරිමාණය හා කේත අංකය* | *බඳවා ගැනීම* |
|---|---|---|---|---|---|
| 01 | ප්‍රාථමික ශිල්පීය නොවන සේවා ශ්‍රේණිය සෞඛ්‍ය කම්කරු III ශ්‍රේණිය | 03 | 8 වන ශ්‍රේණිය (9 වසර) සමත් වී තිබිය යුතුය. | රු. 24,250 - 10x250 - 10x270 - 10x300 - 12x330 රු. 36,410 PL 1- 2016 | ව්‍යුහගත සම්මුඛ පරීක්ෂණ මණ්ඩලයක් මගින් සිදු කෙරේ. (මෙහිදී පළාත් පාලන අයතනයක අනියම්, ආදේශක, කොන්ත්‍රාත් පදනම මත සේවා කර ඇති සේවා කාලය, තනතුරට අදාළව ලබා ඇති පළපුරුද්ද පිළිබඳ වෙනත් සහතික, ජාතික හා ජාත්‍යන්තර මට්ටමේ කාලීන සිදුවීම් පිළිබඳව සාමාන්‍ය අවබෝධය, පෞරුෂත්වය පිළිබඳ සලකා බැලේ.) |

| *අනු. අංක* | *සේවා ගණය හා තනතුරු නාමය* | *පුරප්පාඩු ගණන* | *අධ්‍යාපන හා වෙනත් සුදුසුකම්* | *වැටුප් පරිමාණය හා කේත අංකය* | *බඳවා ගැනීම* |
|---|---|---|---|---|---|
| 02 | ප්‍රාථමික ශිල්පීය නොවන සේවා ගණය වැඩ/ක්ෂේත්‍ර කම්කරු III ශ්‍රේණිය | 20 | 8 වන ශ්‍රේණිය (9 වසර) සමත් වී තිබිය යුතුය. | රු. 24,250 - 10x250 -10x270 - 10x300 - 12x330 රු. 36,410 PL 1- 2016 | ව්‍යුහගත සම්මුඛ පරීක්ෂණ මණ්ඩලයක් මගින් සිදු කෙරේ. (මෙහිදී පළාත් පාලන අයතනයක අනියම්, ආදේශක, කොන්ත්‍රාත් පදනම මත සේවා කර ඇති සේවා කාලය, තනතුරට අදාළව ලබා ඇති පළපුරුද්ද පිළිබඳ වෙනත් සහතික, ජාතික හා ජාත්‍යන්තර මට්ටමේ කාලීන සිදුවීම් පිළිබඳව සාමාන්‍ය අවබෝධය, පෞරුෂත්වය පිළිබඳ සලකා බැලේ.) |
| 03 | ප්‍රාථමික ශිල්පීය නොවන සේවා ගණය කාර්යාල සේවක සේවයේ මුරකරු III ශ්‍රේණිය | 04 | අධ්‍යයන පොදු සහතික පත්‍ර සාමාන්‍ය පෙළ විභාගයේ දී දෙවරකට නොවැඩි වාර ගණනක දී යටත් පිරිසෙයින් සම්මාන දෙකක් සහිතව විෂයයන් හයක් (06) සමත් වී තිබීම. (මින් විෂයයන් 05 ක් එකවර සමත් විය යුතුය.) | රු. 24,250 - 10x250 - 10x270 - 10x300 -12x330 රු. 36,410 PL 1- 2016 | ව්‍යුහගත සම්මුඛ පරීක්ෂණ මණ්ඩලයක් මගින් සිදු කෙරේ. (බඳවා ගැනීමේ දී අවශ්‍ය මූලික අධ්‍යාපන සුදුසුකම්වලට අමතරව ලබා ඇති අධ්‍යාපන සුදුසුකම්, ජාතික හා ජාත්‍යන්තර මට්ටමේ කාලීන සිදුවීම් පිළිබඳ සාමාන්‍ය අවබෝධය සලකා බැලේ. ඊට අමතරව තනතුරට හිමි පෞරුෂත්වය සලකා බැලේ.) |
| 04 | ප්‍රාථමික ශිල්පීය සේවා ගණය රියදුරු III ශ්‍රේණිය | 04 | අධ්‍යයන පොදු සහතික පත්‍ර සාමාන්‍ය පෙළ විභාගයේ දී දෙවරකට නොවැඩි වාර ගණනක දී යටත් පිරිසෙයින් සිංහල/දෙමළ භාෂාව ඇතුළුව සම්මාන සාමාර්ථ දෙකක් (02) සහිතව විෂයයන් හයක් (06) සමත් වී තිබීම. (එක් වරකදී විෂයයන් පහක් (05) අවම වශයෙන් සමත් වී තිබිය යුතුය.<br><br>*වෘත්තීය සුදුසුකම් :*<br><br>1. පෞද්ගලික / කුලී රථ සහ තාර බර හොණ්ඩර 24 ට අඩු ස්ටේෂන් වැගන් රථ පැදවීම පිළිබඳ මෝටර් රථ ප්‍රවාහන කොමසාරිස් ජනරාල් විසින් නිකුත් කළ මොටර් රථ පැදවීමේ බලපත්‍රයක් ලබා තිබීම. (බඳවා ගන්නා දිනට වසර තුනක (03) ට පෙර අවම වශයෙන් 'සී' සහ 'සී1' වාහන පන්තියේ බලපත්‍රයක් හෝ නව රියදුරු බලපත්‍රය අනුව 'බී' පන්තියේ බලපත්‍රයක් ලබා තිබිය යුතු ය.) | රු. 25,790 - 10x270 - 10x300 - 10x330 - 12x350 රු. 38,990 PL 3- 2016 | වෘත්තීය පරීක්ෂණයක් මගින් හා සාමාන්‍ය සම්මුඛ පරීක්ෂණයක් මගින් බඳවා ගැනීම සිදු කෙරේ. (පත්වීම් බලධාරියා විසින් පත් කරනු ලබන විධායක/ මාණ්ඩලික නිලධාරියෙකු, මෝටර් රථ ප්‍රවාහන කොමසාරිස් දෙපාර්තමේන්තුවේ මෝටර් රථ වාහන පරීක්ෂකයෙකු, පොලිස් රථ වාහන අංශයේ නිලධාරිකු පවත්වනු ලබන වෘත්තීය පරීක්ෂණයක් මගින් රිය පැදවීමේ, නිපුණත්වය, මාර්ග නීති පිළිබඳ ප්‍රායෝගික දැනුම මෝටර් යාන්ත්‍රික විද්‍යාව පිළිබඳ මූලික දැනුම පරීක්ෂා කෙරේ.) |

| අනු. අංක | සේවා ශ්‍රේණිය හා තනතුරු නාමය | පුරප්පාඩු ගණන | අධ්‍යාපන හා වෙනත් සුදුසුකම් | වැටුප් පරිමාණය හා කේත අංකය | බඳවා ගැනීම |
|---|---|---|---|---|---|
| | | | 2. මහා මාර්ග නීති සංග්‍රහය පිළිබඳ මනා දැනුමක් තිබිය යුතුය.<br><br>*පළපුරුද්ද :*<br><br>බලපත්‍ර ලැබීමෙන් පසු රියදුරෙකු ලෙස අවම වශයෙන් වසර තුනක (03) පළපුරුද්දක් තිබිය යුතුය. (පළපුරුද්ද විධිමත් සහතිකයක් මගින් සනාථ කළ යුතු ය.)<br><br>*කායික සුදුසුකම් :*<br><br>1. අවම උස අඩි (05) ක් විය යුතුය.<br>2. දිවා කාලයේ දී හා රාත්‍රී කාලයේ දී සේවයේ යෙදීම පිණිස ශාරීරික වශයෙන් සුදුසු තත්වයක සිටිය යුතු අතර, මනා ඇස් පෙනීමක් තිබිය යුතු ය. රජයේ වෛද්‍ය නිලධාරියෙකු විසින් නිකුත් කරන ලද වෛද්‍ය සහතිකයක් මගින් ඒ බැව්, සනාථ කළ යුතු ය. | | |
| 05 | ප්‍රාථමික ශිල්පීය නොවන පුස්තකාල සහායක III ශ්‍රේණිය | 02 | අ.පො.ස. (සා.පෙළ) විභාගයෙන් දෙවරකට නොවැඩි වාර ගණනකදී යටත් පිරිසෙයින් සම්මාන දෙකක් සහිතව විෂයයන් හයක් සමත් වී තිබීම. (මින් විෂයයන් 05 ක් එකවර සමත් විය යුතුය) | රු. 24,250 - 10x250 - 10x270 - 10x300 - 12x330 රු. 36,410 PL 1- 2016 | ව්‍යුහගත සම්මුඛ පරීක්ෂණ මණ්ඩලයක් මගින් සිදු කෙරේ. (මෙහිදී බඳවා ගැනීමේ දී අවශ්‍ය මූලික අධ්‍යාපන සුදුසුකම් වලට අමතරව ලබා ඇති අධ්‍යාපන සුදුසුකම් හා කාලීන සිදුවීම් පිළිබඳ අවබෝධය, පෞරුෂත්වය සලකා බැලේ.) |
| 06 | ප්‍රාථමික අර්ධ ශිල්පීය විදුලි කාර්මික III ශ්‍රේණිය | 01 | අධ්‍යයන පොදු සහතික පත්‍ර සාමාන්‍ය පෙළ විභාගයෙන් දෙවරකට නොවැඩි වාර ගණනක දී යටත් පිරිසෙයින් සම්මාන සාමාර්ථ දෙකක් (02) සහිතව විෂයයන් හයක් (06) සමත් වී තිබීම. (මින් විෂයයන් 05 ක් එකවර සමත් විය යුතුය) | රු. 25,790 - 10x270 - 10x300 - 10x330 - 12x350 රු. 38,990 PL 3- 2016 | මූලික සුදුසුකම් පරීක්ෂා කිරීම හා කායික යෝග්‍යතාවය පරීක්ෂා කිරීම ව්‍යුහගත සම්මුඛ පරීක්ෂණයක් මගින් සිදුකෙරේ. (මෙහි දී බඳවා ගැනීමේ දී අවශ්‍ය මූලික අධ්‍යාපන සුදුසුකම්වලට අමතරව ලබා ඇති අධ්‍යාපන සුදුසුකම්, තනතුරට අදාළ ප්‍රායෝගික දැනුම පෞරුෂත්වය පිළිබඳ සලකා බැලේ.) |

| අනු. අංක | සේවා ශ්‍රේණිය හා තනතුරු නාමය | පුරප්පාඩු ගණන | අධ්‍යාපන හා වෙනත් සුදුසුකම් | වැටුප් පරිමාණය හා කේත අංකය | බඳවා ගැනීම |
|---|---|---|---|---|---|
| | | | *වෘත්තීය සුදුසුකම් :*<br><br>අදාළ තනතුරට නියමිත පරිදි තෘතියික හා වෘත්තීය අධ්‍යාපන කොමිෂන් සභාව විසින් නිගමනය කරනු ලැබ ඇති පරිදි ජාතික වෘත්තීය කුසලතාවයන් හි (NVQ) අවම වශයෙන් දෙවන මට්ටමේ නිපුණතාවයක් ලබා ගෙන තිබීම හෝ අවම වශයෙන් අදාළ ක්ෂේත්‍රයේ මාස 06 කට නොඅඩු පළපුරුද්දක් ලබා තිබීම. (සහතික මඟින් සනාථ කළ යුතුය.)<br><br>*පළපුරුද්ද :*<br><br>අදාළ පළාත් පාලන ආයතනයක ප්‍රාථමික ශ්‍රේණියේ තනතුරක සේවය ස්ථිර කර ඇති සේවා කාලය වසර 05 සපුරා ඇති හා අදාළ කාර්යක්ෂමතා කඩඉම සමත් වසර 05 ක සතුටුදායක සේවා කාලය සපුරා ඇති සේවකයෙකු විය යුතුය. | | |
| 07 | ශිල්පීය සේවා ශ්‍රේණිය බර යන්ත්‍රෝපකරණ ක්‍රියාකරු III ශ්‍රේණිය | 02 | අධ්‍යන පොදු සහතික පත්‍ර (සාමාන්‍ය පෙළ) විභාගයේ දී දෙවරකට නොවැඩි වාර ගණනක දී යටත් පිරිසෙයින් සම්මාන දෙකක් සහිතව විෂයයන් හයක් (06) සමත් වී තිබීම. (මින් විෂයයන් පහක් (05) ක්, එකවර සමත විය යුතුය.<br><br>*වෘත්තීය සුදුසුකම් :*<br><br>(i) බර වාහන රියදුරු බලපත්‍රය තාර බර හොණ්ඩර 34 ට වැඩි බර මෝටර් වාහන සහ බර ට්‍රේලර් සහ මගීන් 32 ට වඩා ගෙන යා හැකි බස් රථ පැදවීම සඳහා මෝටර් රථ ප්‍රවාහන කොමසාරිස් ජනරාල් විසින් නිකුත් කරන ලද නිපුණතා පිළිබඳ සහතිකයක් හෝ 'ඒ' පන්තියේ බලපත්‍රයක් හෝ නව රියදුරු බලපත්‍රය අනුව 'ඩී' පන්තියේ බලපත්‍රයක් ලබා තිබිය යුතුය.<br><br>(ii) අවම උස අඩි 05 ක් විය යුතුය. | රු. 25,790 - 10x270 - 10x300 - 10x330 - 12x350 රු. 38,990 PL 3- 2016 | මූලික සුදුසුකම් පරීක්ෂා කිරීම ව්‍යුහගත සම්මුඛ පරීක්ෂණ මණ්ඩලයක් මඟින් සිදු කරනු ලැබේ. (එහිදී මාර්ග නීති පිළිබඳ දැනුම පරීක්ෂා කිරීම යාන්ත්‍රික ක්‍රියාකාරීත්වය හා එහි පැවැත්ම පිළිබඳ දැනුම පරීක්ෂා කිරීම, ප්‍රායෝගික පරීක්ෂණය, පෞරුෂත්වය පිළිබඳ සලකා බැලේ. ) |

| අනු. අංක | සේවා ගණය හා තනතුරු නාමය | පුරප්පාඩු ගණන | අධ්‍යාපන හා වෙනත් සුදුසුකම් | වැටුප් පරිමාණය හා කේත අංකය | බඳවා ගැනීම |
|---|---|---|---|---|---|
| | | | (iii) බර යන්ත්‍රෝපකරණ ක්‍රියා කරවීම පිළිබඳ තෘතීක හා වෘත්තීය අධ්‍යාපන කොමිෂන් සභාවෙන් නිකුත් කරන ලද NVQ 04 මට්ටමට අදාළ සහතිකයක් තිබිය යුතුය.<br><br>(iv) මෝටර් යාන්ත්‍රික විද්‍යාව පිළිබඳව මූලික අවබෝධයක් තිබිය යුතුය.<br><br>*පළපුරුද්ද :*<br><br>(i) පළාත් පාලන ආයතනයක PL1PL2 තනතුරක ස්ථිර කර තිබීම.<br>(ii) ඉහත I හි දැක්වෙන තනතුරක සේවා කාලය වසර 03 සම්පූර්ණ කර තිබීම.<br><br>(iii) බර යන්ත්‍රෝපකරණ ක්‍රියාකරු තනතුර සඳහා එම යන්ත්‍ර ක්‍රියාකරවීම පිළිබඳ වසරක පළපුරුද්දක් ලබා තිබීම. | | |
| 08 | කළමනාකරණ සහකාර තාක්ෂණික නොවන - ඛණ්ඩ 02 සේවා ගණය වැඩ ක්ෂේත්‍ර පරිපාලක III ශ්‍රේණිය | 02 | අ.පො.ස. (සා.පෙළ) විභාගයෙන් දෙවරකට නොවැඩි වාර ගණනක දී භාෂාවට හා ගණිතයට සම්මාන දෙකක් සහිතව විෂයයන් හයකින් (06) සාමාර්ථ ලබා තිබීම. (මින් විෂයයන් පහ (05) ක් එකවර සමත් වී තිබිය යුතුය.)<br><br>*පළපුරුද්ද:*<br><br>1. පළාත් පාලන ආයතනයක P-L-1/P-L-2 වැටුප් කේත අංක යටතේ වැටුප් ලබන, සේවය ස්ථිර කර ඇති හා ස්ථිර සේවා කාලය වසර පහ (05) සපුරා ඇති සේවකයින් විය යුතු අතර, සේවා කාලය ආයතන ප්‍රධානියා ලිඛිතව සනාථ කළ යුතු ය. | රු. 27,140 - 10x300 - 11x350 - 11x495 - 10x660 රු. 45,540 MN 1- 2016 | බඳවා ගැනීම් ලිඛිත විභාගයක් මඟින් හා ව්‍යුහගත සම්මුඛ පරීක්ෂණ මණ්ඩලයක් මඟින් සිදු කෙරේ.<br><br>*ලිඛිත විභාගය -*<br><br>1. සාමාන්‍ය දැනීම හා බුද්ධි පරීක්ෂණය<br><br>2. ක්ෂේත්‍රයට අදාළ දැනුම පරීක්ෂා කිරීමේ පරීක්ෂණයක්<br>ව්‍යුහගත සම්මුඛ පරීක්ෂණය මඟින් සපුරාලිය යුතු ස්ථිර සේවා කාලයට අමතරව සේවා කාලය, වැඩ බැලීම, හෝ රාජකාරී ඉටු කිරීම, ක්ෂේත්‍රයට අදාළව දැනුම පරීක්ෂා කිරීම, පෞරුෂත්වය පිළිබඳව සලකා බැලේ. |

| අනු. අංක | සේවා ගණය හා තනතුරු නාමය | පුරප්පාඩු ගණන | අධ්‍යාපන හා වෙනත් සුදුසුකම් | වැටුප් පරිමාණය හා කේත අංකය | බඳවා ගැනීම |
|---|---|---|---|---|---|
| 09 | කළමනාකරණ සහකාර තාක්ෂණික නොවන - බණ්ඩ 02 සේවා ගණය වැඩ සෞඛ්‍ය පරිපාලක III ශ්‍රේණිය | 01 | අ.පො.ස. (සා.පෙළ) විභාගයෙන් දෙවරකට නොවැඩි වාර ගණනක දී භාෂාවට හා ගණිතයට සම්මාන දෙකක් සහිතව විෂයයන් හයකින් (06) සාමාර්ථ ලබා තිබීම. (මින් විෂයයන් පහ (05) ක් එකවර සමත් වී තිබිය යුතුය.)<br>පළපුරුද්ද:<br>1. පළාත් පාලන ආයතනයක P-L-1/P-L-2 වැටුප් කේත අංක යටතේ වැටුප් ලබන, සේවය ස්ථිර කර ඇති හා ස්ථිර සේවා කාලය වසර පහ (05) සපුරා ඇති සේවකයින් විය යුතු අතර, සේවා කාලය ආයතන ප්‍රධානියා ලිඛිතව සනාථ කළ යුතු ය. | රු. 27,140 - 10x300 - 11x350 - 10x495 - 10x660 රු. 45,540 MN 1- 2016 | බඳවා ගැනීම් ලිඛිත විභාගයක් මඟින් හා ව්‍යුහගත සම්මුඛ පරීක්ෂණ මණ්ඩලයක් මඟින් සිදු කෙරේ.<br>ලිඛිත විභාගය -<br>1. සාමාන්‍ය දැනීම හා බුද්ධි පරීක්ෂණය<br>2. ක්ෂේත්‍රයට අදාළ දැනුම පරීක්ෂා කිරීමේ පරීක්ෂණයක්<br>ව්‍යුහගත සම්මුඛ පරීක්ෂණය මඟින් සපුරාලිය යුතු ස්ථිර සේවා කාලයට අමතරව සේවා කාලය, වැඩ බැලීම, හෝ රාජකාරී ඉටු කිරීම, ක්ෂේත්‍රයට අදාළව දැනුම පරීක්ෂා කිරීම, පෞරුෂත්වය පිළිබඳව සලකා බැලේ. |
| 10 | ප්‍රාථමික ශිල්පීය නොවන සේවා ගණය කාර්යාල සේවක සේවයේ කාර්යාල කාර්ය සහායක III ශ්‍රේණිය | 03 | අධ්‍යයන පොදු සහතික පත්‍ර සාමාන්‍ය පෙළ විභාගයේ දී දෙවරකට නොවැඩි වාර ගණනක දී යටත් පිරිසෙයින් සම්මාන දෙකක් සහිතව විෂයයන් හයක් (06) සමත් වී තිබීම. (මින් විෂයයන් 05 ක් එකවර සමත් විය යුතුය.) | රු. 24,250 - 10x250 - 10x270 - 10x300 - 12x330 රු. 36,410 PL 1- 2016 | ව්‍යුහගත සම්මුඛ පරීක්ෂණ මණ්ඩලයක් මඟින් සිදු කෙරේ. (බඳවා ගැනීමේ දී අවශ්‍ය මූලික අධ්‍යාපන සුදුසුකම් වලට අමතරව ලබා ඇති අධ්‍යාපන සුදුසුකම්, ජාතික හා ජාත්‍යන්තර මට්ටමේ කාලීන සිදුවීම් පිළිබඳ සාමාන්‍ය අවබෝධය සලකා බැලේ. ඊට අමතරව තනතුරට හිමි පෞරුෂත්වය පිළිබඳව සලකා බැලේ.) |
| 11 | ප්‍රාථමික ශිල්පීය නොවන ගණය ආදාහනාගාර ක්‍රියාකරු III ශ්‍රේණිය | 01 | 8 වන ශ්‍රේණිය (9 වසර) සමත් වී තිබිය යුතුය.<br>පළපුරුද්ද :<br>වසර 02 ක පළපුරුද්ද තිබිය යුතු අතර, සේවා කාලය ආයතන ප්‍රධානියා ලිඛිතව සනාථ කළ යුතුය. | රු. 25,250 - 10x270 - 10x300 -10x330 -12x350 රු. 38,450 PL 2- 2016 | ක්ෂේත්‍රයට අදාළ දැනුම පරීක්ෂා කිරීමේ පරීක්ෂණයක්<br>ව්‍යුහගත සම්මුඛ පරීක්ෂණය මඟින් සපුරාලිය යුතු ස්ථිර සේවා කාලයට අමතර සේවා කාලය, වැඩ බැලීම හෝ රාජකාරී ඉටු කිරීම, ක්ෂේත්‍රයට අදාළව දැනුම පරීක්ෂා කිරීම, පෞරුෂත්වය පිළිබඳව සලකා බැලේ.) |
| 12 | ප්‍රාථමික ශිල්පීය නොවන සේවා ගණය ආදාහනාගාර සහායක III ශ්‍රේණිය | 02 | 8 වන ශ්‍රේණිය (9 වසර) සමත් වී තිබිය යුතුය. | රු. 24,250 - 10x250 - 10x270 - 10x300 - 12x330 රු. 36,410 PL 1- 2016 | ක්ෂේත්‍රයට අදාළ දැනුම පරීක්ෂා කිරීමේ පරීක්ෂණයක්<br>ව්‍යුහගත සම්මුඛ පරීක්ෂණය මඟින් සපුරාලිය යුතු ස්ථිර සේවා කාලයට අමතර සේවා කාලය, වැඩ බැලීම හෝ රාජකාරී ඉටු කිරීම, ක්ෂේත්‍රයට අදාළව දැනුම පරීක්ෂා කිරීම, පෞරුෂත්වය පිළිබඳව සලකා බැලේ.) |

| අනු. අංක | සේවා ශ්‍රේණිය හා තනතුරු නාමය | පුරප්පාඩු ගණන | අධ්‍යාපන හා වෙනත් සුදුසුකම් | වැටුප් පරිමාණය හා කේත අංකය | බඳවා ගැනීම |
|---|---|---|---|---|---|
| 13 | කළමනාකරණ සහකාර තාක්ෂණික නොවන පෙර පාසල් ගුරු III ශ්‍රේණිය | 01 | 1. සිංහල/ දෙමළ / ඉංග්‍රීසි භාෂාව, ගණිතය සහ තවත් විෂයයන් දෙකකට සම්මාන සාමාර්ථයක් සහිතව එකවර විෂයයන් හයකින් (06) අධ්‍යයන පොදු සහතික පත්‍ර (සාමාන්‍ය පෙළ) විභාගය සමත් ව තිබීම.<br><br>2. අධ්‍යයන පොදු සහතික පත්‍ර (උසස් පෙළ) විභාගයේ දී අවම වශයෙන් විෂයයන් එකක්වත් (01) (සාමාන්‍ය පොදු පරීක්ෂණය හැර) සමත් ව තිබීම.<br><br>3. පෙර පාසැල් ගුරුවරුන් පුහුණු කිරීමේ රජයේ ආයතනයක් මඟින් හෝ රජය පිළිගත් (ලියාපදිංචි කරන ලද) පෙර පාසල් ගුරු පුහුණු ආයතනයක් මඟින් ළදරු අධ්‍යාපන හා ළමා සංවර්ධනය පිළිබඳ මාස 06 කට නොඅඩු කාලයක් පාඨමාලාවක් හදාරා සහතිකයක් ලබා තිබිය යුතුය. | රු. 27,140 - 10x300 - 11x350 - 10x495 - 10x660 රු. 45,540 MN 1- 2016 | බඳවා ගැනීම් ලිඛිත විභාගයක් මඟින් හා ව්‍යුහගත සම්මුඛ පරීක්ෂණ මණ්ඩලයක් මඟින් සිදු කෙරේ.<br><br>ලිඛිත විභාගය -<br><br>1. සාමාන්‍ය දැනීම හා බුද්ධි පරීක්ෂණය<br><br>2. ක්ෂේත්‍රයට අදාළ දැනුම පරීක්ෂා කිරීමේ පරීක්ෂණයක්<br><br>ව්‍යුහගත සම්මුඛ පරීක්ෂණය මගින් සපුරාලිය යුතු ස්ථිර සේවා කාලයට අමතර සේවා කාලය, වැඩ බැලීම, හෝ රාජකාරී ඉටු කිරීම, ක්ෂේත්‍රයට අදාළව දැනුම පරීක්ෂා කිරීම, පෞරුෂත්වය පිළිබඳව සලකා බැලේ. |
| 14 | කළමනාකරණ සහකාර තාක්ෂණික නොවන පෙර පාසැල් සහායිකා III ශ්‍රේණිය | 01 | අ. පො. ස. (සාමාන්‍ය පෙළ) විභාගයෙන් දෙවරකට නොවැඩි වාර ගණනක දී යටත් පිරිසෙයින් සම්මාන දෙකක් (02) සහිතව විෂයයන් හයක් (06) සමත් වී තිබීම. (මින් විෂයයන් පහ(05) ක් එකවර සමත් විය යුතුය.) | රු. 24,250 - 10x250 - 10x270 - 10x300 - 12x330 රු. 36,410 PL 1- 2016 | 1. ශ්‍රී ලංකාවේ පුරවැසියෙකු වීම.<br>2. අයදුම්පත් කැඳවන දිනට පූර්වාසන්න වසර 03 ක් අඛණ්ඩව බස්නාහිර පළාතේ ස්ථිර පදිංචිකරුවෙකු වීම.<br>3. යහපත් චරිතයකින් යුක්ත වීම.<br>4. තනතුරට බඳවා ගැනීම සඳහා අවශ්‍ය සියළුම සුදුසුකම් අයදුම්පත් කැඳවීමේ නිවේදනයේ / *ගැසට්* පත්‍රයේ සඳහන් වන දිනට සෑම ආකාරයකින් ම සම්පූර්ණ කර තිබිය යුතුය. |

02. *බඳවා ගැනීමේ කොන්දේසි :*

I. අයදුම්කරු ශ්‍රී ලංකාවේ පුරවැසියෙකු විය යුතුය.

II. අයදුම්පත් භාර ගන්නා අවසන් දිනට පූර්වාසන්න වසර තුනක (03) අඛණ්ඩ කාලයක් බස්නාහිර පළාත තුළ ස්ථිර පදිංචිකරුවෙකු විය යුතුය.

III. මිල්ලනිය ප්‍රාදේශීය සභා බල ප්‍රදේශය තුළ ස්ථිර පදිංචිකරුවන් සඳහා වැඩි සැලකිල්ලක් දක්වනු ලැබේ.

IV. අයදුම්පත් භාරගන්නා දිනට වයස අවුරුදු 18ට නොඅඩු 45ට නොවැඩි විය යුතුය.

(දැනට රාජ්‍ය සේවයේ ස්ථිර තනතුරක සේවයේ යෙදී සිටින අයට උපරිම වයස් සීමාව බලපානු නොලැබේ.)

V. මිල්ලනිය ප්‍රාදේශීය සභාවේ දැනට අනියම්, ආදේශක, කොන්ත්‍රාත් ලෙස සේවය කරනු ලබන සේවකයින් කෙරෙහි වැඩි අවධානයක් යොමු කරනු ලැබේ.

VI. අයදුම්කරුවන් විශිෂ්ඨ චරිතයකින් සහ තනතුරේ රාජකාරි ඉටු කිරීමට ප්‍රමාණවත් ශාරීරික හා මානසික යෝග්‍යතාවයකින් යුක්ත විය යුතුය.

VII. දණ්ඩ නීති සංග්‍රහය යටතේ උසාවියකින් වරදකරුවෙකු වී දඬුවම් ලැබූවෙකු නොවිය යුතුය.

VIII. රජයේ හෝ පළාත් පාලන ආයතනයක සේවයෙන් පහ කරනු නොලැබූ අයකු විය යුතුය.

IX. රාජ්‍ය පරිපාලන චක්‍රලේඛ අංක 44/90 යටතේ විශ්‍රාම ලැබූවෙකු නොවිය යුතුය.

X. සේවා අවශ්‍යතාවය අනුව විධිමත් සම්මුඛ පරීක්ෂණයකට හා ප්‍රායෝගික පරීක්ෂණයකට යොමු කරන අතර එහිදී ලබා ගන්නා ඉහළම ලකුණු අනුව සුදුස්සන් තෝරා ගනු ලැබේ.

XI. එක් එක් තනතුරට බඳවා ගැනීමට අවශ්‍ය සියළු අවම සුදුසුකම් *ගැසට් පත්‍රයේ* සඳහන් දිනට සෑම ආකාරයකින්ම සම්පූර්ණ කර තිබිය යුතුය.

XII. අනු අංක 06 සිට 09 යටතේ දක්වා ඇති තනතුරු පුරප්පාඩු සඳහා සීමිත අයදුම්කරුවන්ගෙන් පුරප්පාඩු පිරවීම සිදුකෙරේ.

XIII. අයදුම්පත් කැඳවීමෙන් පසු හෝ කැඳවන අතර, කාලසීමාවේ දී බස්නාහිර පළාතේ මෙම තනතුරුවලට අදාළ නව බඳවා ගැනීමේ පටිපාටිය ව්‍යවස්ථා සංශෝධන වීම් සහ ව්‍යවස්ථා ආදේශ කිරීම ද බඳවා ගැනීමේ ප්‍රමාද කිරීම් වෙනස් කිරීම හා මෙම නිවේදනය අවලංගු කිරීම හෝ සංශෝධනය කිරීම මිල්ලනිය ප්‍රාදේශීය සභාවේ ලේකම් සතුය.

03. *සේවයේ නියුක්ත කරවීමේ පොදු කොන්දේසි :*

I. මෙම තනතුර ස්ථිරය. විශ්‍රාම වැටුප් සහිතය. (විශ්‍රාම වැටුප් ක්‍රමය පිළිබඳව රජය විසින් ඉදිරියේ දී ගනු ලබන ප්‍රතිපත්තිමය තීරණයන්ට යටත්ව පත්වීම් ලබා දේ.)

II. බඳවා ගනු ලබන සේවකයින් තුන් අවුරුදු පරිවාස කාලයකට යටත් වේ. ස්ථිර සේවකයින් එක් අවුරුදු පරිවාස කාලයකට යටත් වේ.

III. රාජ්‍ය භාෂා ප්‍රතිපත්තියකට එකඟ විය යුතුය.

IV. තනතුරු වලට අදාළ වැටුප් පරිමාණය සඳහා 2018.01.01 දින සිට ගෙවීම් කරනු ලබන්නේ රාජ්‍ය පරිපාලන චක්‍රලේඛ 3/2016 හි II වන උපලේඛනය අනුව වේ. එම වැටුප් පරිමාණ පූර්ණ වශයෙන් ක්‍රියාත්මක වනුයේ 2020.01.01 දින සිටය.

V. මීට අමතරව ආයතන සංග්‍රහයේ විධිවිධාන වලටද මුදල් රෙගුලාසි වලටද බස්නාහිර පළාත් සභාවේ ගරු ආණ්ඩුකාරතුමාගේ නියෝග වලට පළාත් රාජ්‍ය සේවා කොමිෂන් සභාව විසින් වරින් වර පනවනු ලබන වෙනත් නියෝග වලටද දෙපාර්තමේන්තු නියෝග වලට මිල්ලනිය ප්‍රාදේශීය සභාව විසින් වරින් වර නිකුත් කෙරෙන රෙගුලාසි නියෝග වලටද අනුකූලව කටයුතු කිරීමට බැඳී සිටිය යුතු ය.

04. අයදුම්කළ යුතු ආකාරය :

අයදුම්කරුගේ ජීව දත්ත ඇතුළත් වන පරිදි ඒ4 ප්‍රමාණයේ අයදුම්පත් සකස් කර අයදුම්පත් බහාලන කවරයේ වම් පස ඉහළ කෙළවරෙ ඉල්ලුම් කරන තනතුරු සඳහන් කර 2018.10.25 දිනට පෙර "ලේකම්, ප්‍රාදේශීය සභාව, මිල්ලනිය" යන ලිපිනයට ලියාපදිංචි තැපෑලෙන් එවිය යුතුය. දැනටමත් රජයේ සේවයේ හෝ පළාත් රාජ්‍ය සේවයේ නියුතු අයදුම්කරුවන් තම ඉල්ලුම්පත් ආයතන ප්‍රධානියා මගින් එවිය යුතුය. නියමිත දිනට පසුව ලැබෙන අයදුම්පත් සහ අසම්පූර්ණ අයදුම්පත් කිසිදු දැනුම් දීමකින් තොරව ප්‍රතික්ෂේප කරනු ලැබේ.

අයදුම්පත් සමඟ පහත සඳහන් ලියකියවිලිවල පිටපත් එවිය යුතුය.

I. උප්පැන්න සහතිකය

II. ජාතික හැඳුනුම්පතෙහි ඡායා පිටපතක්

III. අධ්‍යාපන සහතික/ පාසල හැර යාමේ සහතිකය

IV. ප්‍රාදේශීය ලේකම් විසින් අනු අත්සන් කරන ලද ග්‍රාම නිලධාරි විසින් නිකුත් කළ පදිංචිය සනාථ කිරීමේ සහතිකය

V. වෙනත් සුදුසුකම් දක්වෙන සහතික

VI. සේවා පළපුරුද්ද පිළිබඳ සහතිකය

VII. මෑතකදී ලබාගත් චරිත සහතික දෙකක්

VIII. පොලිස් වාර්තාව

05. පුරප්පාඩු සංඛ්‍යාව අනුව සම්මුඛ පරීක්ෂණයට / ප්‍රායෝගික පරීක්ෂණයට කැඳවනු ලබන අතර, එම කැඳවීම් ලද පමණින් ඔබ පත්වීමක් ලැබීමට සුදුස්සෙකු ලෙස නොසැලකිය යුතුය.

මෙම බඳවා ගැනීම සම්බන්ධයෙන් විධිවිධාන සලසා නොමැති සියලුම කරුණු පිළිබඳව අවසන් තීරණය මිල්ලනිය ප්‍රාදේශීය සභාවේ ලේකම් සතු වන්නේය.

තවද, සිංහල, දෙමළ හා ඉංග්‍රීසි භාෂා වලින් පළ කරන මෙම නිවේදනයේ භාෂා පාඨ අතර කිසියම් අනනුකූලතාවයක් පවතී නම් එවැනි විටක සිංහල මාධ්‍ය නිවේදනය නිවැරදි ලෙස කටයුතු කරනු ලැබේ.

සුනීතා අබේසිංහ,
ලේකම්,
මිල්ලනිය ප්‍රාදේශීය සභාව,

2018 සැප්තැම්බර් 28 වැනි දින,
මිල්ලනිය ප්‍රාදේශීය සභා කාර්යාලයේ දීය.

10 - 357

---

## පස්බාගේ කෝරළේ ප්‍රාදේශීය සභාව

පස්බාගේ කෝරළේ ප්‍රාදේශීය සභාවේ පුරප්පාඩු වී ඇති පහත සඳහන් තනතුරු වෙනුවෙන් බඳවා ගැනීමට පස්බාගේ කෝරළේ ප්‍රාදේශීය සභා කොට්ඨාසය තුළ පදිංචි සුදුසුකම් ලත් අයදුම්කරුවන්ගෙන් අයදුම්පත් කැඳවනු ලැබේ.

| *අනු අංකය* | *තනතුරු නාමය* | *පවතින පුරප්පාඩු ගණන* | *සේවය* |
|---|---|---|---|
| 01 | රියැදුරු III | 01 | මධ්‍යම පළාතේ පළාත් පාලන ආයතනවල රියැදුරු (ප්‍රාථමික ශිල්පීය) |
| 02 | සෞඛ්‍ය කම්කරු III | 03 | මධ්‍යම පළාත් සහා රාජ්‍ය සේවයේ පළාත් පාලන ආයතනවල ප්‍රාථමික (ශිල්පීය නොවන) සේවය |
| 03 | ජල කම්කරු III | 02 | |

02. වැටුප් පරිමාණය:

මෙම තනතුරුවලට හිමි වාර්ෂික වැටුප් පරිමාණයන් පහත පරිදි වේ.

| *අනු අංකය* | *තනතුරු නාමය* | *වැටුප් කේතය* | *වැටුප් පරිමාණය* | *කාර්යක්ෂමතා කඩඉම* |
|---|---|---|---|---|
| 01 | රියැදුරු III | PL3-2016 | රු. 25,790-10x270-10 x 300-10 x 330-12 x 350-රු.38,990.00 (2016.02.25 දිනැති රාජ්‍ය පරිපාලන චක්‍රලේඛ 03/2016හි විධිවිධානවලට අනුකූලව එහි උපලේඛන 11 හි සඳහන් පරිදි වැටුප් හිමි වේ. මෙම වැටුප් පරිමාණයේ පූර්ණ වශයෙන් 2020.01.01 වන දින සිට ක්‍රියාත්මක වේ.) | බඳවා ගෙන වසර 03ක් ගත වීමට පෙර කාර්යක්ෂමතා කඩඉම සම්පූර්ණ කළ යුතුවේ. |
| 02 | සෞඛ්‍ය කම්කරු | PL1-2016 | රු. 24,250-10 x 250-10 x 270-10 x 300-12 x 330-රු. 36,410.00 (2016.02.25 දිනැති රාජ්‍ය පරිපාලන චක්‍රලේඛ 03/2016හි විධිවිධානවලට අනුකූලව එහි උපලේඛන 11 හි සඳහන් පරිදි වැටුප් පරිමාණය පූර්ණ වශයෙන් 2020.01.01 දින සිට ක්‍රියාත්මක වේ. | බඳවාගෙන වසර 03ක් ගත වීමට පෙර කාර්යක්ෂමතා කඩඉම සම්පූර්ණ කළ යුතුවේ. |
| 03 | ජල කම්කරු III | | | |

03. *සේවයේ නියුක්ත කිරීමේ කොන්දේසි :*

(i) මෙම තනතුර ස්ථිර ය. විශ්‍රාම වැටුප් සහිත අතර හිමි විශ්‍රාම වැටුප් ක්‍රමය පිළිබඳව රජය විසින් ඉදිරියේදී ගනු ලබන ප්‍රතිපත්තිමය තීරණ සඳහා යටත් විය යුතුය.
(ii) වැන්දඹු හා අනත්දරු/වැන්දඹු පුරුෂ හා අනත්දරු විශ්‍රාම වැටුප් ක්‍රමයට දායක විය යුතු අතර රජය මඟින් විටින් විට නියම කරනු ලබන ආකාරයට දයක මුදල් ගෙවිය යුතුය.
(iii) පත්වීම අවුරුදු 03ක පරිවාස කාලයට යටත් ය.
(iv) 2014.01.21 දිනැති රාජ්‍ය පරිපාලන චක්‍රලේඛ 01/2014 අනුව තනතුරට බැඳී වසර 05ක් ඇතුළත සේවයට බැඳුනු රාජ්‍ය භාෂාවට අතිරේක වශයෙන් එකී තනතුරට ආදළව අනෙක් රාජ්‍ය භාෂාව පිළිබඳව ප්‍රවීණතාවය ලබා ගත යුතුය.
(v) සේවා ව්‍යවස්ථාවන්, රාජ්‍ය සේවා කොමිෂන් සභා කාර්යය පටිපාටික රීති, ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආයතන සංග්‍රහය, රජයේ මුදල් රෙගුලාසි සහ ඊට අමතරව රජය, පළාත් සභාව පළාත් පාලන දෙපාර්තමේන්තුව සහ ප්‍රාදේශීය සභාවේ ලේකම්වරයා විසින් නිකුත් කරන නියෝග ද, මධ්‍යම පළාත් සභා රාජ්‍ය සේවා කොමිෂන් සභාව විසින් වරින්වර නිකුත් කරන රෙගුලාසි හා නියෝගවලටද මෙම පත්වීම යටත්ය.
(vi) ආයතන සංග්‍රහයේ II වන පරිච්ඡේදයේ බඳවා ගැනීම්වලට අදාළ වන අනෙකුත් පොදු කොන්දේසි අදාළ වේ.

04. *අවශ්‍ය සුදුසුකම් :*

1. 04.01 රියැදුරු තනතුරු සඳහා අවශ්‍ය සුදුසුකම් (විවෘත හා සීමිත වශයෙන් බඳවා ගැනීම සිදු කරනු ලැබේ.)

අධ්‍යාපන සුදුසුකම් :

1. අධ්‍යාපන පොදු සහතික පත්‍ර සාමාන්‍ය පෙළ විභාගයේදී දෙවරකට නොවැඩි වාර ගණනකදී යටත් පිරිසෙයින් සම්මාන 02ක් සහිතව විෂයයන් 06ක් සමත් වී තිබිය යුතුය. මින් විෂයයන් 05ක් එක් වරකදී සමත් වී තිබිය යුතුය.

වෘත්තීය සුදුසුකම් :

1. මෝටර් රථ රියදුරු, ජීප් රථ රියැදුරු, වෑන් රථ රියැදුරු, ලොරි රථ රියදුරු, ට්‍රැක්ටර් රථ රියදුරු

* පෞද්ගලික/කුලී රථ සහ තාර බර හෝන්ඩර 24ට අඩු ස්ටේෂන් වැගන් රථ පැදවීම පිළිබඳව මෝටර් රථ ප්‍රවාහන කොමසාරිස් විසින් නිකුත් කරන ලද නිපුණතාවය පිළිබඳ හා තාර බර හෝන්ඩර 34ට වැඩි බර මෝටර් වාහන බර ට්‍රේලර් සහ මගීන් 32ට නොවැඩි සංඛ්‍යාවක් ගෙන යා හැකි බස් රථ සඳහා රියදුරු බලපත්‍රයක් තිබීම. (බඳවා ගන්නා දිනට වසර 3කට පෙර අවම වශයෙන් මෝටර් රථ ප්‍රවාහන කොමසාරිස් විසින් නිකුත් කරන ලද C හා C1 වාහන පන්තියේ බලපත්‍රයක් හා A පන්තියේ බලපත්‍රයක් හෝ නව රියදුරු බලපත්‍රයක් අනුව B පන්තියේ බලපත්‍රයක් ලබා තිබීම).

කායික සුදුසුකම් :

(i) සෑම අපේක්ෂකයෙකුම මනා ඇසි පෙනීමකින් යුක්ත විය යුතු අතර ප්‍රමාණවත් ශාරීරික හා මානසික යෝග්‍යතාවයෙන් යුක්ත වීම.
(ii) අවම උස අඩි 05 අඟල් 02 1/2 විය යුතුය.

පළපුරුද්ද :

රියදුරු බලපත්‍රය ලැබීමෙන් පසු අවම වසර 03ක පළපුරුද්ද ලබා තිබිය යුතුය. (පළපුරුද්ද සහතික මගින් තහවුරු කළ යුතුය.)

වෙනත් සුදුසුකම් :

(i) ශ්‍රී ලාංකිකයෙකු විය යුතුයි.
(ii) අයදුම්පත් භාර ගන්නා අවසන් දිනට පස්බාගේ කෝරළේ ප්‍රාදේශීය සභා බල ප්‍රදේශය තුළ පූර්වාසන්න අඛණ්ඩ වසර 03ක ස්ථිර පදිංචිකරුවෙකු විය යුතුයි.
(iii) අයදුම්පත්‍ර භාර ගැනීමේ අවසාන දිනයට වයස අවුරුදු 18ට වැඩි විය යුතු අතර අවුරුදු 45ට අඩු විය යුතුයි.
(රජයේ හෝ පළාත් සභා රාජ්‍ය සේවයේ දැනටමත් සේවයේ නියුතු අය සම්බන්ධයෙන් මෙම උපරිම වයස් සීමාව අදළ නොවේ.)

(iv) විශිෂ්ට චරිතයෙන් යුක්ත විය යුතුය.
(v) මාර්ග නීති සංග්‍රහය පිළිබඳ මනා දැනුමකින් යුක්ත වීම.
(vii) බඳවා ගැනීම සඳහා අවශ්‍ය සියලුම සුදුසුකම් අයදුම්පත්‍ර කැඳවීමේ අවසාන දිනය වන විට සෑම ආකාරයෙන්ම සම්පූර්ණ වී තිබිය යුතුයි.

04.02 සෞඛ්‍ය කම්කරු සහ ජල කම්කරු තනතුරු සඳහා අවශ්‍ය සුදුසුකම්

මූලික සුදුසුකම් :

(i) ශ්‍රී ලංකාවේ පුරවැසියෙකු විය යුතු අතර විශිෂ්ට චරිතයකින් යුක්ත විය යුතුයි.
(ii) අයදුම්පත් භාර ගන්නා අවසාන දිනට රඹුක්පිටිය, පස්බාගේ කෝරළේ ප්‍රාදේශීය සභා බල ප්‍රදේශය තුළ පූර්වාසන්න අඛණ්ඩ වසර 03ක ස්ථිර පදිංචිකරුවෙකු විය යුතුයි. (පුරප්පාඩු සම්පූර්ණ කිරීම පිණිස ප්‍රමාණවත් සුදුස්සන් බල ප්‍රදේශය තුළ නොමැති වූ විටකදී පමණක් යාබද පළාත් පාලන ආයතනයේ බල ප්‍රදේශයේ පදිංචිකරුවන්ගේ අයදුම්පත් සලකා බලනු ලැබේ.)
(iii) අයදුම්පත භාර ගැනීමේ අවසාන දිනයට වයස අවුරුදු 18ට වැඩි විය යුතු අතර අවුරුදු 45ට අඩු විය යුතුය. (රජයේ හෝ පළාත් සහා රාජ්‍ය සේවයේ දැනටමත් සේවයේ නියුතු අය සම්බන්ධයෙන් මෙම උපරිම වයස් සීමාව අදාළ නොවේ.)
(iv) බඳවා ගැනීම සඳහා අවශ්‍ය සියලුම සුදුසුකම් අයදුම්පත්‍ර කැඳවීමේ අවසාන දිනය වන විට සෑම ආකාරයෙන් ම සම්පූර්ණ වී තිබිය යුතුයි.
(v) සෞඛ්‍ය කම්කරු තනතුර සඳහා රජයේ හෝ පෞද්ගලික ආයතනයක කසළ කළමනාකරණය කසළ බැහැර කිරීම හා මාර්ග හා කාණු පද්ධතිය පිරිසිදුකිරීම සම්බන්ධයෙන් සේවා පළපුරුද්ද ලබා තිබීම සහ ජල කම්කරු තනතුරු සඳහා රජයේ හෝ පෞද්ගලික ආයතනයක පළපුරුද්ද සහ ජල නඩත්තු කිරීම සම්බන්ධයෙන් සේවා පළපුරුද්ද ලබා තිබීම පිළිබඳව විශේෂ අවධානය සම්මුඛ පරීක්ෂණයේදී යොමු කරනු ලැබේ.

අධ්‍යාපන සුදුසුකම් :

(i) අධ්‍යාපන පොදු සහතික පත්‍ර සාමාන්‍ය පෙළ විභාගයේදී දෙවරකට නොවැඩි වාර ගණනකදී යටත් පිරිසෙයින් විෂයන් 02ක් සම්මාන සහිතව විෂයයන් 06ක් සමත් වී තිබිය යුතුය. මින් විෂයයන් 05ක් එක් වරකදී සමත් වී තිබිය යුතුය.
(ii) 2015.09.22 දිනැති සේවා ව්‍යවස්ථා සංශෝධන සෞඛ්‍ය කම්කරුවන් සඳහා අංක 01 පරිදි ඉහත සුදුසුකම් සපුරා ඇති අයදුම්කරුවන් නොමැති අවස්ථාවලදී පටිපාටියේ සඳහන් සුදුසුකම් 5 ශ්‍රේණිය සමත් වීම දක්වා අඩු කර සලකා බලනු ලැබේ.

කායික සුදුසුකම් :

(i) සෑම අපේක්ෂකයෙකුම මනා ඇස් පෙනීමකින් යුක්ත විය යුතු අතර ප්‍රමාණවත් ශාරීරික හා මානසික යෝග්‍යතාවයෙන් යුක්ත වීම.
(ii) දිවයිනේ කවර ප්‍රදේශයක වුවද සේවය කිරීමට සුදුසු ශරීර සෞඛ්‍යයකින් යුක්ත විය යුතුය.

05. බඳවා ගැනීමේ ක්‍රමය :

05.1 අයදුම්පත් ඉදිරිපත් කර ඇති හා බඳවා ගැනීමට අවශ්‍ය අවම සුදුසුකම් සහිත අයදුම්කරුවන් සියලු දෙනාටම ව්‍යුහගත සම්මුඛ පරීක්ෂණය පැවැත්වෙන දිනය ඉදිරියේදී දැනුම් දෙනු ලැබේ. එම සම්මුඛ පරීක්ෂණයට ඉදිරිපත් කිරීම සඳහා පහත සඳහන් ලිපි ලේඛන හා ඒවායේ ඡායාස්ථ පිටපත් සූදානම්ව තබා ගත යුතුය.

(i) උප්පැන්න සහතිකයේ මුල් පිටපත
(ii) ජාතික හැඳුනුම්පත
(iii) රියැදුරු තනතුර සම්බන්ධයෙන් රියදුරු බලපත්‍රය
(iv) අදාළ අධ්‍යාපන සහතිකයේ මුල් පිටපත
(v) පාසල හැර යාමේ සහතිකය
(vi) මෑතකදී ලබාගත් චරිත සහතික 02ක්
(vii) වෘත්තීය නිපුණත්වය සනාථ කිරීමට අවශ්‍ය සහතික
(viii) සේවා පළපුරුද්ද පිළිබඳ සහතික/ලිපි

05.2 සෞඛ්‍ය කම්කරු සහ ජල කම්කරු තනතුරු පුරප්පාඩු ගණන සඳහා සුදුසුකම් පරීක්ෂා කිරීමේ ව්‍යුහගත සම්මුඛ පරීක්ෂණයට ඉදිරිපත් වූ අයදුම්කරුවන් අතරින් වඩාත්ම සුදුසුකම් සපුරා ඇති අයදුම්කරුවන් ලකුණු අනුපිළිවෙලට තෝරාගෙන බඳවා ගනු ලැබේ.

05.3 රියදුරු තනතුරෙහි පුරප්පාඩු ගණන සඳහා සුදුසුකම් පරීක්ෂා කිරීමේ ව්‍යුහගත සම්මුඛ පරීක්ෂණයට ඉදිරිපත් වූ අයදුම්කරුවන් අතරින් සුදුසුකම් සපුරන සියලුම අපේක්ෂකයන් ලිඛිත පරීක්ෂණයකට යොමු කරනු ලැබේ. ලිඛිත පරීක්ෂණයේ ප්‍රතිඵල මත ඉහළම ලකුණු ලැබූ අපේක්ෂකයන් වෘත්තීය පරීක්ෂණයකට යොමු කර එහි ප්‍රතිඵල මත ඉහළම ලකුණු ලැබූවන් අතරින් කුසලතා අනුපිළිවෙල අනුව බඳවා ගනු ලැබේ.

06. *අයදුම්කළ යුතු ආකාරය :*

06.1 අයදුම්කරු තනතුරු කිහිපයක් සඳහා අයදුම් කරන්නේ නම් එක් තනතුරක් සඳහා එක් අයදුම්පතක් ඉදිරිපත් කළ යුතුය.

06.2 *ගැසට් නිවේදනයේ* සඳහන් ආදර්ශ අයදුම්පත පරිදි A4 ප්‍රමාණයේ කොළයක දෙපැත්තම භාවිතා කර සකස් කරන ලද අයදුම්පතක් 2018.11.03 දින හෝ ඊට පෙර ''ලේකම්, පස්බාගේ කෝරළේ ප්‍රාදේශීය සභාව, රඹුක්පිටිය.'' යන ලිපිනයට ලියාපදිංචි තැපෑලෙන් එවිය යුතු වේ. (අයදුම්පත පමණක් ඉදිරිපත් කිරීම ප්‍රමාණවත්ය.)

06.3 අයදුම්පත බහා එවන කවරයේ වම්පස ඉහළ කෙළවරේ ''. . . . . . . . . . . තනතුර අයදුම් කිරීම'' යනුවෙන් සඳහන් කළ යුතුය.

06.4 අසම්පූර්ණ හෝ නියමිත දිනය පසුවී ලැබෙන අයදුම්පත් දැනුම් දීමකින් තොරව ප්‍රතික්ෂේප කරනු ලැබේ.

06.5 අයදුම්පතේ අපේක්ෂකයාගේ අත්සන රජයේ විද්‍යාලයක විදුහල්පතිවරයෙකු, සාමාදාන විනිශ්චයකාරවරයෙකු, දිවුරුම් කොමසාරිස්වරයෙකු, ප්‍රසිද්ධ නොතාරිස්වරයෙකු, ත්‍රිවිධ හමුදාවේ අධිකාරි බලයලත් නිලධාරියෙකු පොලිස් සේවයේ ගැසට් කළ තනතුරක් දරන නිලධාරියෙකු හෝ වාර්ෂික වැටුප රු. 2,40,360.00 හෝ ඊට වැඩි රජයේ හෝ පළාත් රාජ්‍ය සේවයේ ස්ථිර තනතුරක් දරන නිලධාරියෙකු විසින් සහතික කරනු ලැබ තිබිය යුතුය.

06.6 දැනටමත් රාජ්‍ය සේවයේ නියුතු අයදුම්කරුවන් තම අයදුම්පත ආයතන ප්‍රධානියා මඟින් එවිය යුතුය.

07. බඳවාගනු ලබන අයගේ සංඛ්‍යාව හා පත්වීම ක්‍රියාත්මක වන දිනය පස්බාගේ කෝරළේ ප්‍රාදේශීය සභාවේ ලේකම් විසින් තීරණය කරනු ලැබේ. අයදුම්පත් කැඳවීමෙන් පසු හෝ කැඳවන කාලය අතරතුර කාල සීමාවේදී මෙම බඳවා ගැනීම් ප්‍රමාද කිරීමේ, මෙම නිවේදනය අවලංගු කිරීමේ හෝ සංශෝධනය කිරීමේ බලය හා මේ සම්බන්ධයෙන් වන ඕනෑම කරුණක් සම්බන්ධයෙන් අවසන් තීරණ ගැනීමේ බලය ප්‍රාදේශීය සභාවේ ලේකම්වරයා සතුය.

එච්. ටී. සරත් වික්‍රමසිංහ,
ලේකම්,
පස්බාගේ කෝරළේ ප්‍රාදේශීය සභාව,
රඹුක්පිටිය.

2018 සැප්තැම්බර් මස 21 වැනි දින,
රඹුක්පිටිය, පස්බාගේ කෝරළේ ප්‍රාදේශීය සභාවේදී ය.

**පස්බාගේ කෝරළේ ප්‍රාදේශීය සභාව - පස්බාගේ**

පස්බාගේ කෝරළේ ප්‍රාදේශීය සභාවේ ......................තනතුරු සඳහා අයදුම්පත

01. 1.1 මුලකුරු සමග නම :....................................
1.2 මුලකුරුවලින් හැඳින්වෙන නම් :....................................

02. 2.1 ස්ථිර ලිපිනය :....................................
2.2 දැනට රාජ්‍ය සේවයේ නිරත වූවකු නම් කාර්යාලයීය ලිපිනය :....................................

03. 3.1 උපන් දිනය :....................................
3.2 2018.03.23 දිනට වයස : අවුරුදු:............ මාස :............ දින:............

04. ජාතික හැඳුනුම්පත් අංකය :..........................................
05. දුරකථන අංකය :..........................................
06. ස්ත්‍රී/පුරුෂ භාවය:..........................................

07. අධ්‍යාපන සුදුසුකම් ඃ
7.1 අධ්‍යාපනය ලද පාසල ඃ
7.2 අ. පො. ස. (සාමාන්‍ය පෙළ) විභාගය ඃ

වසර:...................................... විභාග අංකය:......................................

| *විෂයය* | *සාමාර්ථය* |
|---|---|
| | |
| | |
| | |
| | |
| | |
| | |
| | |
| | |
| | |

08. වෘත්තීය සුදුසුකම් :
..........................................................................................................................
..........................................................................................................................

09. සේවා පළපුරුද්ද:
..........................................................................................................................
..........................................................................................................................

10. අයදුම්කරුගේ ප්‍රකාශය මෙම අයදුම්පත්‍රයේ මා විසින් සපයා ඇති තොරතුරු සත්‍ය හා නිවැරදි බව ප්‍රකාශ කරමි. මෙහි සඳහන් කරුණු කිසිවක් අසත්‍ය හෝ වැරදි බව අනාවරණය වුවහොත් මා සේවයට බඳවා ගැනීමට නුසුදුස්සකු වන බවත්, පත්වීමක් ලැබීමෙන් පසු ඒ බව අනාවරණය වුවහොත් සේවයෙන් පහ කිරීමට යටත් බවත්, මම දනිමි.

..............................;
අයදුම්කරුගේ අත්සන.

...............................
දිනය

11. අයදුම්කරුගේ අත්සන සහතික කිරීම මෙම අයදුම්පත ඉදිරිපත් කරන . . . . . . . . . . . . . . . (ලිපිනය) හි පදිංචි . . . . . . . . . . . . . . . . (නම) යන අය මම පෞද්ගලිකව හඳුනන බවත්, ඔහු/ඇය අද දින මා ඉදිරිපිට දී ඔහුගේ අත්සන තැබූ බවත්, සහතික කරමි.

..............................;
සහතික කරන්නාගේ අත්සන,
නිල මුද්‍රාව.

දිනය ඃ.............................
සහතික කරන්නාගේ සම්පූර්ණ නමඃ..............................;
තනතුරඃ..............................;
ලිපිනයඃ...............................

12. රාජ්‍ය හෝ පළාත් සේවාවන්හිද දැනට සේවයෙහි නියුතු අයදුම්කරුවෙකු නම් පහත සඳහන් සහතිකය දෙපාර්තමේන්තු ප්‍රධානියා විසින් කළ යුතුය.

මෙම ඉල්ලුම්කරුවන..................................................... (නම) යන අය මෙම අමාත්‍යාංශයේ/දෙපාර්තමේන්තුවේ/ආයතනයේ ................................... (තනතුර) වශයෙන් සේවය කරයි. පසුගිය වසර කිහිපය තුළ ඔහු මොනම ආකාරයක හෝ විනයානුකූල දඬුවමකට (අවවාද කිරීම් හැර) භාජනය වී නොමැති බව සහ ඉහත තනතුර සඳහා තෝරාගනු ලැබුවහොත් ඒ සඳහා මුදා හැරිය හැකි බවත් සහතික කරමි.

..............................;
අමාත්‍යාංශ/දෙපාර්තමේන්තු/ආයතන ප්‍රධානියාගේ අත්සන.

.............................
දිනය

10-266

## නවගත්තේගම ප්‍රාදේශීය සභාව

### නවගත්තේගම ප්‍රාදේශීය සභාවේ තනතුරු පුරප්පාඩු

නවගත්තේගම ප්‍රාදේශීය සභාවේ පුරප්පාඩු වී පවත්නා පහත සඳහන් තනතුරු වලට සුදුස්සන් තෝරා පත් කර ගැනීම සඳහා නියමිත සුදුසුකම් ඇති නවගත්තේගම ප්‍රාදේශීය සභා බල ප්‍රදේශය තුල ස්ථිර පදිංචිකරුවන්ගෙන් අයදුම්පත් කැඳවනු ලැබේ.

| අනු අංකය | තනතුරු නාමය | තනතුරු ගණන | වැටුප් ක්‍රමය මාසික | අධ්‍යාපන සුදුසුකම් |
|---|---|---|---|---|
| 01 | විදුලි කාර්මික | 01 | PL - 3 - 2016<br><br>රු. 25,790-10x270 - 10x300 - 10x330 -12x350 - රු. 38,990 | **බාහිර අයදුම්කරුවන් සඳහා**<br>අ.පො.ස. සාමාන්‍ය පෙළ විභාගයෙන් දෙවරකට නොවැඩි වාර ගණනක දී විෂයයන් 2 කට සම්මාන සහිතව විෂයයන් 6 ක් වත් සමත් වී තිබිය යුතුය. අවම වශයෙන් එක් වතාවකදී විෂයයන් 5ක් සමත් විය යුතුය. (වෛකල්පිත විෂයයන් හැර)<br><br>**අභ්‍යන්තර අයදුම්කරුවන් සඳහා**<br>පළාත් සභා රාජ්‍ය සේවයේ ස්ථිර තනතුරක සේවයේ නියුතු අයදුම්කරුවන් සඳහා රජය විසින් අනුමත කරන ලද පාසලකින් 8 ශ්‍රේණිය (9 වසර) සමත් විය යුතුය. (දැනට අනියම්, ආදේශක, කොන්ත්‍රාත් පදනමෙන් බඳවාගෙන ඇති සේවකයින්ට පමණක් එවකට පැවති බඳවා ගැනීමේ පරිපාටියේ අධ්‍යාපන සුදුසුකම් අදාළ වේ.)<br><br>**වෘත්තීය සුදුසුකම් හා පළපුරුද්ද**<br>1. තනතුරේ කාර්ය භාරයට අදාළව තෘතීය අධ්‍යාපන කොමිෂන් සභාව විසින් පිළිගනු ලබන කාර්මික/වෘත්තීය පුහුණු ආයතනයකින් නිකුත් කරන N.V.Q. 4 මට්ටමේ ප්‍රවීනතා සහතිකයක් ලබා තිබීම;<br>සහ<br>2. පිළිගත් ආයතනයක අදාළ ක්ෂේත්‍රයේ වසර 03 ක පළපුරුද්දක් තිබීම (සේවා සහතික මඟින් සනාථ කළ යුතුයි) |
| 02 | රියදුරු | 01 | රු. 25,790-10x270 - 10x300 - 10x330 - 12x350 - රු. 38,990 | **බාහිර අයදුම්කරුවන් සඳහා**<br>අ.පො.ස. සාමාන්‍ය පෙළ විභාගයෙන් දෙවරකට නොවැඩි වාර ගණනක දී විෂයයන් 2 කට සම්මාන සහිතව විෂයයන් 6 ක් වත් සමත් වී තිබිය යුතුය. අවම වශයෙන් එක් වතාවකදී විෂයයන් 5ක් සමත් විය යුතුය. (වෛකල්පිත විෂයයන් හැර)<br><br>**අභ්‍යන්තර අයදුම්කරුවන් සඳහා**<br>පළාත් සභා රාජ්‍ය සේවයේ ස්ථිර තනතුරක සේවයේ නියුතු අයදුම්කරුවන් සඳහා රජය විසින් අනුමත කරන ලද පාසලකින් 8 ශ්‍රේණිය (9 වසර) සමත් විය යුතුය. (දැනට අනියම්, ආදේශක, කොන්ත්‍රාත් පදනමෙන් බඳවාගෙන ඇති සේවකයින්ට පමණක් පෞද්ගලික වන සේ එවකට පැවති බඳවා ගැනීමේ පරිපාටියේ අධ්‍යාපන සුදුසුකම් අදාළ වේ.)<br><br>**වෘත්තීය සුදුසුකම් හා පළපුරුද්ද**<br>1. තාර බර හොන්ඩර 34 ට වැඩි බර මෝටර් වාහන සහ බර ට්‍රේලර් සහ මඟින් 32 ට වඩා, ගෙන යාමට හැකි බස් රථ පැදවීම සඳහා මෝටර් රථ ප්‍රවාහන කොමසාරිස්වරයා විසින් නිකුත් කරන ලද නිපුණත්වය පිළිබඳ සහතිකයක් ලබා තිබිය යුතුය. (ඒ පන්තියේ රියදුරු බලපත්‍රයක්) ;<br>සහ<br>2. වාහන රියදුරෙකු වශයෙන් වසර 3 ක පළපුරුද්දක් තිබිය යුතුය. (සේවා සහතික මඟින් සනාථ කළ යුතුය.) |

02. අවශ්‍ය වෙනත් සුදුසුකම් :

1. අයදුම්පත් භාර ගන්නා අවසන් දිනයට අවුරුදු 18ට නොඅඩු හා අවුරුදු 45 ට නොවැඩි විය යුතුය. (දැනට වයඹ පළාත් සභා රාජ්‍ය සේවයේ ස්ථිර තනතුරක සේවයේ නියුක්ත අයදුම්කරුවන් සඳහා උපරිම වයස් සීමාව බල නොපැවැත්වේ.)
2. අයදුම්කරු පරම්පරාවෙන් හෝ ලියාපදිංචි වීමෙන් ශ්‍රී ලංකා පුරවැසියෙකු විය යුතුය.
3. අයදුම්කරු නවගත්තේගම ප්‍රාදේශීය බල ප්‍රදේශය තුළ තුන් අවුරුද්දකට නොඅඩු කාලයක ස්ථිර පදිංචිකරුවෙක් විය යුතුය.(වසමේ ග්‍රාම නිලධාරි විසින් නිකුත් කරනු ලබන සහතිකයක් මත ප්‍රාදේශීය ලේකම් විසින් අනු අත්සන් කර සනාථ කර තිබිය යුතුය)
4. අයදුම්කරු යහපත් චරිතයකින් හා මනා ශරීර සෞඛ්‍ය තත්වයකින් යුක්ත විය යුතුය.
5. දණ්ඩ නීති සංග්‍රහය යටතේ උසාවියකින් වරදකරුවෙකු වී දඬුවම් ලැබූවෙකු නොවිය යුතුය.
6. පළාත් රාජ්‍ය සේවයේ ස්ථිර / අනියම් / තාවකාලික / කොන්ත්‍රාත් පදනම යටතේ දැනට සේවයේ නියුතු නිළධාරින්ට ද ඉහත තනතුරු සඳහා ඉල්ලුම් කළ හැකි අතර, ඉල්ලුම්පත් භාර ගන්නා අවසාන දිනට පූර්වාසන්න වන වසර 5 ක කාලය තුළ වරදකට (අවවාද කිරීමක් හැර) දඬුවමක් ලබා නැත්තා වූ ද මෙම කාලය තුළ සියළු වැටුප් වර්ධක නියමිත දිනට ලබා ගත්තා වූ ද සතුටුදායක සේවා කාලයක් තිබිය යුතුය.
7. අයදුම්කරුවන් ඒ ඒ තනතුරු ඉදිරියේ දක්වා ඇති අවම සුදුසුකම් සපුරා තිබිය යුතුය.

03. සේවය නියුක්ත කිරීමේ කොන්දේසි :

(i) මෙම තනතුර ස්ථිර, විශ්‍රාම වැටුප් සහිතය.

(ii) වැන්දඹු අනත්දරු / වැන්දඹු පුරුෂ හා අනත්දරු විශ්‍රාම වැටුප් අරමුදලට දායක විය යුතුය.

(iii) පත්වීම අවුරුදු 3ක පරිවාස කාලයකට යටත් වන්නේය.

(iv) මෙම බඳවා ගැනීම ශ්‍රී ලංකා ජන රජයේ ආයතන සංග්‍රහයේ රෙගුලාසි වලට ද මුදල් රෙගුලාසිවලට ද දෙපාර්තමේන්තු නියෝග වලට ද රජය හෝ පළාත් සභාව විසින් වරින් වර නිකුත් කරන වෙනත් රෙගුලාසි හා නියෝග වලටද අනුකූලව ක්‍රියා කිරීමට සියළු සේවකයින් හා බැඳී සිටිය යුතුය.

04. බඳවා ගැනීමේ ක්‍රමය :

1. අවශ්‍යතාවය අනුව ලිඛිත / ව්‍යුහගත හෝ සම්මුඛ පරීක්ෂණයක් මඟින් සුදුස්සන් තෝරා ගැනේ.
2. අයදුම්පත්‍රය සමඟ පහත සඳහන් සහතික පත්වල සහතික කළ පිටපත් අමුණා එවිය යුතු අතර මුල් පිටපත් සම්මුඛ පරීක්ෂණයේ දී ඉදිරිපත් කළ යුතුය.

   (අ) උප්පැන්න සහතිකය

   (ආ) අධ්‍යාපන සහතික
3. තම පදිංචිය සහතික කිරීම පිණිස ප්‍රාදේශීය ලේකම්වරයාගේ සහතිකය
4. මෑතක දී ලබා ගත් චරිත සහතික 02ක් (එක් සහතිකයක් ග්‍රාම නිලධාරියාගෙන් ලබා ගත් සහතිකයක් විය යුතුය.)
5. වෘත්තීය හෝ පළපුරුද්ද පිළිබඳ සහතික තිබේ නම් එම සහතික
6. රියදුරන් බඳවා ගැනීමේ දී පළාත් පාලන දෙපාර්තමේන්තුවේ එක් නියෝජනයෙකු, මෝටර් රථ ප්‍රවාහන දෙපාර්තමේන්තුවේ මෝටර් වාහන පරීක්ෂකවරයෙකු හා පොලිස් රථවාහන අංශයේ නිලධාරියෙකු ගෙන් සමන්විත මණ්ඩලයක් මඟින් පවත්වනු ලබන රිය පැදවීමේ නිපුණත්වය මැනීමේ පරීක්ෂණයෙන් සමත් විය යුතුය.
7. මූලික සුදුසුකම් සපුරා ඇති අයදුම්කරුවන් පමණක් සම්මුඛ පරීක්ෂණය සඳහා කැඳවනු ලැබේ.
8. අයදුම්කරුවන් මෙහි දක්වා ඇති ආදර්ශ අයදුම්පත්‍රයට අනුව පිළියෙල කරන ලද අයදුම්පත් 2018.11.16 දිනට හෝ ඊට ප්‍රථම ලැබෙන සේ "ලේකම්, ප්‍රාදේශීය සභාව, නවගත්තේගම"යන ලිපිනයට ලියාපදිංචි තැපැලෙන් එවිය යුතුය.

අයදුම්පත් බහාලන කවරයේ වම්පස ඉහළ කෙළවර අයදුම්කරන තනතුර පැහැදිළිව සඳහන් කළ යුතුය. අසම්පූර්ණ අයදුම්පත් ප්‍රතික්ෂේප කරනු ලැබේ.

අයදුම්පත් කැඳවීමෙන් පසුව හෝ කැඳවන අතරතුරේ හෝ මෙම බඳවා ගැනීම ප්‍රමාද කිරීම හෝ වෙනස් කිරීම හෝ සංශෝධනය කිරීමේ සම්පූර්ණ බලතල නවගත්තේගම ප්‍රාදේශීය සභාවේ ලේකම් සතුය.

එච්. එම්. එස්. හේරත්,
ලේකම්,
නවගත්තේගම ප්‍රාදේශීය සභාව.

2018 ක් ව සැප්තැම්බර් මස 26 දින දීය.
නවගත්තේගම ප්‍රාදේශීය සභාවේ දීය.

**ආදර්ශ අයදුම්පත්‍රය**

***නවගත්තේගම ප්‍රාදේශීය සභාව***

*.......................................... තනතුර සඳහා අයදුම්පත්‍රය*

01. අයදුම්කරුගේ නම මුලකුරු සමග :...................................................................
    මුලකුරුවලින් හැඳින්වෙන නම :...................................................................
02. තැපැල් ලිපිනය :...................................................................
03. උපන් දිනය :- වර්ෂය :............... මාසය :............ දිනය :............
04. අයදුම්පත භාරගන්නා අවසාන දිනට වයස :- අවුරුදු :............ මාස :............ දින:............
05. ජාතික හැඳුනුම්පත් අංකය :...................................................................
06. ස්ත්‍රී/පුරුෂ භාවය :...................................................................
07. විවාහක / අවිවාහක භාවය :..........................
08. ජාතිය :...................................................................
09. ඔබ ශ්‍රී ලාංකික පුරවැසියෙක් ද? එසේ නම් පරම්පරාවෙන් ද? / ලියාපදිංචි වීමෙන් ද යන වග :........................
10. අධ්‍යාපන සුදුසුකම් (සහතිකවල ඡායා පිටපත් අමුණා එවන්න) :....................................
11. ඔබ දැනටමත් රාජ්‍ය සේවයේ නියුක්ත ද? එසේ නම් තනතුර, සේවා ස්ථානය සහ පත්වීමේ ස්වභාවය
    ස්ථිර/ අනියම් /තාවකාලික :....................................
12. පළපුරුද්ද හා වෘත්තීය සුදුසුකම් :....................................

මෙම අයදුම්පත්‍රයෙහි මා විසින් සපයන ලද තොරතුරු සත්‍ය වූත්, නිවැරදි වූත්, ඒවා බව සහතික කරමි. මෙහි ඇතුළත් තොරතුරු වලින් කිසිවක් අසත්‍ය වුවහොත් හෝ වැරදි බව මෙම තනතුරට තෝරා ගැනීමට පෙර අනාවරණය වුවහොත් මා නුසුදුස්සෙකු බවට පත්වන බවත්, පත්වීම ලැබීමෙන් පසු එවැනි කරුණක් ඔප්පු වුවහොත් කිසිදු වන්දියක් නොගෙවා සේවයෙන් පහකරනු ලැබීමට යටත් වන බව ද දනිමි.

.......................................
අයදුම්කරුගේ අත්සන.

දිනය : .............................

13. ආයතන ප්‍රධානියාගේ සහතිකය

(දැනටමත් රාජ්‍ය සේවයේ/ පළාත් රාජ්‍ය සේවයේ ස්ථිර/ අනියම් / තාවකාලික / කොන්ත්‍රාත් පදනම යටතේ සේවය කරන අයදුම්කරුවන් සඳහා)

මෙම ඉල්ලුම්පත්‍රය ඉදිරිපත් කරන ............................................................. මහතා / මහත්මිය / මෙනවිය ....................................................... ................... වැනි දින සිට මෙම කාර්යාලයේ ............................................................... ස්ථිර / තාවකාලික / අනියම් / කොන්ත්‍රාත් පදනම යටතේ සේවය කරන බවත්, ඔහුගේ/ ඇයගේ වැඩ, පැමිණීම සහ හැසිරීම සතුටුදායක බවත්, ඉහත 1 සිට 8 දක්වා සඳහන් කර ඇති

තොරතුරු සියල්ලම මෙම කාර්යාලයේ ඇති වාර්තා ආශ්‍රයෙන් මම පෞද්ගලිකව පරීක්ෂා කර බැලූ බවත්, ඒවා නිවැරදි බවත් 2018 .. ............................... මස ............................... වැනි දින ඔහු/ ඇය මා ඉදිරිපිට දී අත්සන් කළ බවත් මෙයින් සහතික කරමි.

..................................................................
දෙපාර්තමේන්තු / ආයතන ප්‍රධානියාගේ අත්සන.

දිනය :..................................
සහතික කරන අයගේ සම්පූර්ණ නම :..................................
පදවිය :..................................
ලිපිනය :..................................

10 - 432

---

## හඟුරන්කෙත ප්‍රාදේශීය සභාව

### ප්‍රාථමික ශ්‍රේණියේ ශිල්පීය, අර්ධ ශිල්පීය හා ශිල්පීය නොවන තනතුරු සඳහා බඳවා ගැනීම

මධ්‍යම පළාත් රාජ්‍ය සේවයේ හඟුරන්කෙත ප්‍රාදේශීය සභාවේ දනට පුරප්පාඩු වී ඇති පහත සඳහන් තනතුරුවලට බඳවා ගැනීම සඳහා මෙම නිවේදනයේ සඳහන් සුදුසුකම් ඇති හඟුරන්කෙත ප්‍රාදේශීය සභා බල ප්‍රාදේශයේ ස්ථිර පදිංචිය ඇති අයගෙන් අයදුම්පත් කැඳවනු ලැබේ. මෙම නිවේදනය අවසානයේ දක්වෙන ආදර්ශ අයදුම්පත්‍රය අනුව සකස් කළ අයදුම්පත 2018.11.01 දිනට පෙර "ලේකම්, ප්‍රාදේශීය සභාව, හඟුරන්කෙත" යන ලිපිනයට ලැබෙන පරිදි ලියාපදිංචි තැපෑලෙන් පමණක් එවිය යුතුය. ඉල්ලුම්පත් බහා එවන ලිපි කවරයේ වම් පස ඉහළ කෙළවරේ ඔබ විසින් ඉල්ලුම් කරන තනතුර සඳහන් කළ යුතුය. තනතුරු කිහිපයකට ඉල්ලුම් කරන්නේ නම් වෙන් වෙන් වශයෙන් අයදුම්පත් යොමු කළ යුතුය.

| *අනු අංකය* | *තනතුරු නාමය* | *තනතුරු සංඛ්‍යාව* | *අනුයුක්ත කරන ස්ථානය හා කාර්යය* | *වැටුප් පරිමාණය* | *අධ්‍යාපන හා වෙනත් සුදුසුකම්* |
|---|---|---|---|---|---|
| 01 | රියදුරු III වන ශ්‍රේණිය | 02 | ප්‍රධාන කාර්යාලය ආශ්‍රිත කටයුතු | PL - 03 - 2016 රු. 25,790 - 10x270 - 10x300 - 10x330 - 12x350 - රු.38,990 | **අධ්‍යාපන සුදුසුකම් :** අධ්‍යයන පොදු සහතික පත්‍ර සාමාන්‍ය පෙළ විභාගයේ දී දෙවරකට නොවැඩි වාර ගණනක දී යටත් පිරිසෙයින් සම්මාන 02 ක් සහිතව විෂයයන් 6 ක් සමත්ව තිබීම. මින් විෂයයන් 05 ක් එක් වරක දී සමත් වී තිබිය යුතුය.<br><br>**වෘත්තීය සුදුසුකම් :** තාර බර හොණ්ඩර 34 ට වැඩි බර මෝටර් වාහන බර ට්‍රේලර් සහ මගීන් 32 ට නොවැඩි සංඛ්‍යාවක් ගෙන යා හැකි බස් රථ සඳහා රියදුරු බලපත්‍රයක් එනම් මෝටර් රථ ප්‍රවාහන කොමසාරිස් ජනරාල් විසින් නිකුත් කරන ලද ඒ වාහන පන්තියේ බලපත්‍රයක් හෝ නව රියදුරු බලපත්‍රය අනුව ඒ1/ඒ/බී1/බී/ සී1/සී/සීඉ/ ඩී1/ඩී/ජී1/ජී/ජේ පන්තියේ රියදුරු බලපත්‍රයක් ලබා තිබීම.<br><br>**පළපුරුද්ද :** මෝටර් රථ පැදවීමේ බලපත්‍රය ලැබීමෙන් පසු අවම වසර 03ක පළපුරුද්දක් ලබා තිබීම. (පළපුරුද්ද විධිමත් සහතිකයක් මගින් සනාථ කළ යුතුය.) |

| අනු අංකය | තනතුරු නාමය | තනතුරු සංඛ්‍යාව | අනුයුක්ත කරන ස්ථානය හා කාර්යය | වැටුප් පරිමාණය | අධ්‍යාපන හා වෙනත් සුදුසුකම් |
|---|---|---|---|---|---|
| | | | | | **කායික සුදුසුකම් :**<br>අවම උස අඩි 05 අඟල් 02 1/2 ක් විය යුතුය.<br>මනා ඇස් පෙනීමක් තිබිය යුතු අතර දිවා කාලයේදී සහ රාත්‍රී කාලයේ දී සේවයේ යෙදීම පිණිස ප්‍රමාණවත් ශාරීරික හා මානසික යෝග්‍යතාවයෙන් යුක්ත විය යුතුය.<br>**වෙනත් සුදුසුකම් :**<br>මහාමාර්ග නීති සංග්‍රහය ගැන මනා දැනුමකින් යුක්ත විය යුතුය.<br>*බඳවා ගැනීමේ ක්‍රමය :*<br>**විවෘත බඳවා ගැනීම :**<br>ලිඛිත පරීක්ෂණයක ප්‍රතිඵල මත ඉහළම ලකුණු ලැබූ අපේක්ෂකයන්ගෙන් වෘත්තිය පරීක්ෂණයක ප්‍රතිඵල මත අවශ්‍ය සියලුම සුදුසුකම් සපුරා ඇති අපේක්ෂකයන්ගෙන් ඉහළම ලකුණු ලැබූවන් අතුරින් කුසලතා අනුපිළිවෙළ අනුව බඳවා ගනු ලැබේ.<br>**සීමිත බඳවා ගැනීම :**<br>කායික මානසික යෝග්‍යතාවය සහ අධ්‍යාපන, වෘත්තීය හා පොදු සුදුසුකම් පරීක්ෂා කිරීම සඳහා වන සම්මුඛ පරීක්ෂණයක් සමඟ ව්‍යුහගත සම්මුඛ පරීක්ෂණයක් මගින් ලබා ගන්නා ප්‍රතිඵල මත සුදුසුකම් ලබන්නන් මෝටර් රථ පරීක්ෂක විසින් පවත්වන ප්‍රායෝගික පරීක්ෂණයක දී සුදුසුකම් ලබා ගත යුතුය.<br>බඳවා ගන්නා අනුපාතය<br>**ධාරාව ප්‍රතිශතය**<br>විවෘත 70%<br>සීමිත 30% |
| 02 | ආයුර්වේද ඖෂධ සංයෝජක III වන ශ්‍රේණිය | 01 | හඟුරන්කෙත ආයුර්වේද බෙහෙත් ශාලාව හා ඉඩම්පිටිය ආයුර්වේද බෙහෙත් ශාලාවල ඖෂධ සංයෝජන කටයුතු | PL - 02 - 2016<br>රු. 25,250 - 10x270 - 10x300 - 10x330 - 12x350 -<br>රු. 38,450 | **අධ්‍යාපන සුදුසුකම් :**<br>දෙවරකට නොවැඩි වාර ගණනක දී අධ්‍යයන පොදු සහතික පත්‍ර (සාමාන්‍ය පෙළ) විභාග යෙන් හෝ ජාතික අධ්‍යයන පොදු සහතික පත්‍ර (සාමාන්‍ය පෙළ) විභාගයෙන් සිංහල හෝ දෙමළ භාෂාව සමඟ අවම වශයෙන් විෂයයන් 02කට සම්මාන සහිතව විෂයයන් 06 කින් සාමාර්ථය ලබා තිබිය යුතුය.<br>**ශිල්පීය නිපුනතා / ප්‍රවීණතා :**<br>වෘත්තියට අදාළව ජාතික වෘත්තීය සුදුසුකම් 02 වන මට්ටමේ (NVQ 2) හෝ 3 වන මට්ටමේ (NVQ 3) සහතිකය ලබා තිබීම.<br>*හෝ* |

| *අනු අංකය* | *තනතුරු නාමය* | *තනතුරු සංඛ්‍යාව* | *අනුයුක්ත කරන ස්ථානය හා කාර්යය* | *වැටුප් පරිමාණය* | *අධ්‍යාපන හා වෙනත් සුදුසුකම්* |
|---|---|---|---|---|---|
| | | | | | කාර්මික අධ්‍යාපනය හා පුහුණු කිරීමේ දෙපාර්තමේන්තුවේ (DTET) වෘත්තියට අදාළව එක් වසරකට නොඅඩු පාඨමාලාවක් හදාරා සහතික ලබා තිබීම;<br>*හෝ*<br>ජාතික තරුණ සේවා සභාවේ (NYSC) වෘත්තියට අදාළව එක් වසරකට නොඅඩු පාඨමාලාවක් හදාරා සහතික ලබා තිබීම;<br>හෝ<br>ශ්‍රී ලංකා වෘත්තීය පුහුණු කිරීමේ අධිකාරියේ (VTA) වෘත්තියට අදාළව එක් වසරකට නොඅඩු පාඨමාලාවක් හදාරා සහතිකය ලබා තිබීම;<br>*හෝ*<br>ජාතික ආධුනිකත්ව හා කාර්මික පුහුණු කිරීමේ දෙපාර්තමේන්තුවේ (NAITA) වෘත්තියට අදාළව එක් වසරක පාඨමාලාවක් හදාරා සහතිකය ලබා තිබීම<br>*හෝ*<br>තෘතීය හා වෘත්තීය අධ්‍යාපන කොමිෂන් සභාවේ ලියාපදිංචි කාර්මික පුහුණු ආයතනයක වෘත්තියට අදාළව එක් වසරකට නොඅඩු පාඨමාලාවක් සම්පූර්ණ කර සහතිකය ලබා තිබීම.<br>*පළපුරුද්ද :*<br>අදාළ ක්ෂේත්‍රයේ පළපුරුද්දක් ලබා තිබීම, පුහුණු කාල සීමාව යටත් පිරිසෙයින් අවුරුදු 2 ක් වත් විය යුතුය. |
| 03 | මාර්ග කම්කරු III වන ශ්‍රේණිය | 11 | හගුරන්කෙත ප්‍රාදේශීය සභාවට අයත්<br>1. දියතිලක<br>2.උඩගම්පහ<br>3.කොහොක<br>4.ගන්නෑව<br>5.ගගපළාත<br>යන කෝරළයන්වල මාර්ග ආශ්‍රිත කටයුතු | PL 1 - 2016<br>රු. 24,250 - 10x250 - 10x270 - 10x300 - 12x330 - රු. 36,410 | ***අධ්‍යාපන සුදුසුකම් :***<br>අධ්‍යයන පොදු සහතික පත්‍ර සාමාන්‍ය පෙළ විභාගයේ දී දෙවරකට නොවැඩි වාර ගණනකදී යටත් පිරිසෙයින් විෂයයන් 02කට සම්මාන සහිතව විෂයයන් 06ක් සමත්ව තිබීම. මින් විෂයන් 05ක් එක් වරකදී සමත්වී තිබිය යුතුයි. සුදුසුකම් සපුරා ඇති අයදුම්කරුවන් නොමැති අවස්ථාවල දී මධ්‍යම පළාත් සභා රාජ්‍ය සේවයේ පළාත් පාලන ආයතනවල ප්‍රාථමික (ශිල්පීය නොවන) සේවා ව්‍යවස්ථා සංශෝධන අංක 01 අනුව 5 ශ්‍රේණිය සමත් අයවලුන් බඳවා ගැනීමට කටයුතු කරනු ලැබේ. |

| අනු අංකය | තනතුරු නාමය | තනතුරු සංඛ්‍යාව | අනුයුක්ත කරන ස්ථානය හා කාර්යය | වැටුප් පරිමාණය | අධ්‍යාපන හා වෙනත් සුදුසුකම් |
|---|---|---|---|---|---|
| 04 | ආදාහනාගාර ක්‍රියාකරු සහායක III වන ශ්‍රේණිය | 01 | හඟුරන්කෙත ආදාහනාගාරය ආශ්‍රිත කටයුතු | PL 1 - 2016 රු. 24,250 - 10x250 10x270 - 10x300 - 12x330 - රු. 36,410 | *අධ්‍යාපන සුදුසුකම් :* අධ්‍යයන පොදු සහතික පත්‍ර සාමාන්‍ය පෙළ විභාගයේ දී දෙවරකට නොවැඩි වාර ගණනකදී යටත් පිරිසෙයින් විෂයයන් 02කට සම්මාන සහිතව විෂයයන් 06ක් සමත්ව තිබීම. මින් විෂයයන් 05ක් එක් වරකදී සමත්වී තිබිය යුතුයි. |

02. **බඳවා ගැනීමේ කොන්දේසි :**

1. අයදුම්කරුවන් පරම්පරාවෙන් හෝ ලියාපදිංචි වීමෙන් ශ්‍රී ලාංකික පුරවැසියෙකු විය යුතුය.
2. අයදුම්කරුවන් මනා මානසික හා ශාරීරික යෝග්‍යතාවයකින් යුක්ත විය යුතුය.
3. අයදුම්කරු අදාළ පළාත් පාලන ආයතන බල ප්‍රදේශය තුළ වසර 03 කට නොඅඩු ස්ථිර පදිංචි අයකු විය යුතුය.
4. අයදුම්පත් කැඳවන අවසාන දිනට වයස අවුරුදු 18ට නොඅඩු හා අවුරුදු 45 ට නොවැඩි විය යුතුය. (දැනටමත් රාජ්‍ය සේවයේ හෝ කිසියම් පළාත් රාජ්‍ය සේවයක ස්ථිර සේවයේ නියුක්ත තැනැත්තන්ට උපරිම වයස් සීමාව අදාළ නොවේ.)
5. ඉහත දක්වා ඇති එක් එක් තනතුරට අදාළව ඉදිරියෙන් දක්වා ඇති අවම සුදුසුකම් සපුරා තිබිය යුතුය.
6. බඳවා ගැනීමේ පටිපාටිය අනුව ව්‍යුහගත සම්මුඛ පරීක්ෂණයකට යොමු කරනු ලබන අතර, එහි දී ලබාගන්නා ලකුණු අනුපිළිවෙල අනුව සුදුස්සන් තෝරා ගනු ලැබේ.
7. තෝරා ගනු ලබන අයදුම්කරුවන් ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ නීතිවලට ද පළාත් පාලන දෙපාර්තමේන්තුවේ රෙගුලාසිවලට ද හඟුරන්කෙත ප්‍රාදේශීය සභාව දැනට පනවා ඇති හා පනවනු ලබන නීතිවලට හා එකී නීති රීති සියල්ලට යටත් විය යුතු ය.
8. මූලික සුදුසුකම් සපුරා ඇති අයදුම්කරුවන් පමණක් සම්මුඛ පරීක්ෂණයට කැඳවනු ලැබේ.
9. අයදුම්පත් කැඳවීමෙන් අනතුරුව හෝ අයදුම්පත් කැඳවන අතරතුර බඳවා ගැනීම ප්‍රමාද කිරීම හෝ වෙනස් කිරීම හෝ මෙම නිවේදනය සංශෝධනය කිරීමේ හෝ අවලංගු කිරීමේ බලය හඟුරන්කෙත ප්‍රාදේශීය සභාවේ ලේකම් සතු වේ.

03. **සේවයේ නියුක්ත කරවීමේ කොන්දේසි :**

1. මෙම තනතුර ස්ථිරය. විශ්‍රාම වැටුප් සහිතය.
2. වැන්දඹු/වැන්දඹු පුරුෂ හා අනත්දරු විශ්‍රාම වැටුප් අරමුදලට දායක විය යුතුය.
3. බඳවා ගනු ලබන අය වසර 03 ක පරිවාස කාලයකට යටත් ය. එම කාලය තුළදී වැඩ පැමිණීම හා හැසිරීම සතුටුදායක වේ නම් පරිවාස කාලය අවසානයේ සේවයේ ස්ථිර කරනු ලැබේ.
4. රාජ්‍ය භාෂා ප්‍රතිපත්තිය අනුව අවශ්‍ය භාෂා ප්‍රවීනතාවය ලබා දිය යුතුය.
5. බඳවා ගැනීමේ කොන්දේසිවලට අමතරව ආයතන සංග්‍රහයේ II පරිච්ඡේදයේ බඳවා ගැනීම සඳහා වන අනෙකුත් පොදු කොන්දේසිවලට යටත් විය යුතුය.
6. යහපත් චරිතයකින් යුක්ත විය යුතු අතර කවර බල ප්‍රදේශයක් තුළ කවර ප්‍රදේශයක වුවද සේවය කිරීමට සුදුසු ශරීර සෞඛ්‍යයකින් යුක්ත තැනැත්තෙකු විය යුතුය.
7. දණ්ඩ නීති සංග්‍රහය යටතේ උසාවියකින් වරදකරු වී දඬුවම් ලැබූවෙකු නොවිය යුතුය.
8. රජයේ හෝ පළාත් රාජ්‍ය සේවයෙන් පහ කරනු ලැබූවෙකු නොවිය යුතු අතර රාජ්‍ය පරිපාලන චක්‍රලේඛ 44/90 යටතේ විශ්‍රාම ලැබූවෙකු නොවිය යුතුය. හඟුරන්කෙත ප්‍රාදේශීය සභා බල ප්‍රදේශය තුළ කෙරෙන ස්ථාන මාරුවීම්වලට යටත් වේ.
9. සේවයේ අකාර්යක්ෂමතාවයක් හෝ අසතුටුදායක තත්වයක් පෙනී ගියහොත් සභාවේ මනාපය පරිදි සේවය අවසන් කිරීමේ බලය ප්‍රාදේශීය සභාව සතුය.

04. *අයදුම්පත් ඉදිරිපත් කළ යුතු ආකාරය ඃ*

මෙම නිවේදනය අවසානයේ දක්වා ඇති ආදර්ශ ආකෘතියට අනුව ඒ4 ප්‍රමාණයේ කඩදාසියක දෙපැත්ත භාවිතා කරමින් අයදුම්පත් පිළියෙළ කර ඉදිරිපත් කළ යුතු අතර අංක 1 සිට 8 දක්වා පළමු පිටුවෙහි ද අංක 9 සිට 12 දක්වා දෙවන පිටුවට ද වන සේ සකස් කළ යුතුය. අයදුම්පත් බහා එවන ලිපි කවරයේ වම්පස ඉහළ කෙලවරේ ඉල්ලුම් කරන තනතුර සඳහන් කර 2018.10.22 වැනි දින හෝ එදිනට පෙර ලැබෙන සේ "ලේකම්, ප්‍රාදේශීය සභාව, හඟුරන්කෙත" යන ලිපිනයට ලියාපදිංචි තැපෑලෙන් පමණක් එවිය යුතුය. තැපෑලේ දී නැතිවන හෝ වැරදි ලෙස ලිපිනය ලිවීමෙන් ආපසු හරවා යැවෙන අයදුම්පත් සම්බන්ධයෙන් වග කියනු නොලබන අතර, නියමිත දිනට පසුව ලැබෙන අයදුම්පත් ප්‍රතික්ෂේප කරනු ලැබේ.

අයදුම්පත් සමග පහත සඳහන් ලිපි ලේඛනවල සහතික කළ පිටපත් අමුණා එවිය යුතුය ඃ

1. උප්පැන්න සහතිකය
2. ජාතික හැඳුනුම්පත
3. අධ්‍යාපන සහතික
4. ග්‍රාම නිලධාරී විසින් නිකුත් කළ පදිංචි සහතිකය (ප්‍රාදේශීය ලේකම් අනු අත්සන් කළ යුතුය)
5. වෘත්තීය සුදුසුකම් දක්වෙන සහතික
6. සේවා පළපුරුද්ද පිළිබඳ සහතික
7. මෑතකදී ලබා ගත් චරිත සහතික 02ක්

එම්. ආර්. එම්. ඒ. කේ. රත්නායක,
ලේකම්, *(වැ. බ.)*
ප්‍රාදේශීය සභාව,
හඟුරන්කෙත.

2018 සැප්තැම්බර් මස 21 වැනි දින,
හඟුරන්කෙත ප්‍රාදේශීය සභා කාර්යාලයේ දී ය.

**ආදර්ශ අයදුම්පත**

***හඟුරන්කෙත ප්‍රාදේශීය සභාවේ ........................................................................................ තනතුර සඳහා අයදුම්පත්‍රය***

1. 1.1 මුලකුරු සමග නම (සිංහලෙන්/ දෙමළෙන්) :...............................................................
   1.2 මුලකුරු සමග නම (ඉංග්‍රීසි කැපිටල් අකුරින්) :...............................................................
   1.3 සම්පූර්ණ නම (සිංහලෙන්/දෙමළෙන්) :...............................................................
   1.4 සම්පූර්ණ නම (ඉංග්‍රීසි කැපිටල් අකුරින්) :...............................................................
   1.5 ජාතික හැඳුනුම්පත් අංකය :| | | | | | | | | | | | |

2 2.1 ස්ථිර ලිපිනය :...............................................................
  2.2 දුරකථන අංකය :...............................................................

3. ස්ත්‍රී පුරුෂ භාවය :...............................................................
4. උපන් දිනය ඃ වර්ෂය :............... මාසය:............ දිනය:.........
   4.1 අයදුම්පත් භාර ගන්න අවසාන දිනය වන 2018.10.22 දිනට වයස ඃ
   අවුරුදු :............... මාස:............ දින:............
5. පුරවැසිභාවය :...............................................................
6. විවාහක/අවිවාහක බව :...............................................................
7. දැනට තනතුරක් දරන්නේ නම් එම විස්තර :
   (i) තනතුරේ නම :...............................................................
   (ii) එයට පත් වූ දිනය :...............................................................
   (iii) පත්වීමේ ස්වභාවය (ස්ථිර/අනියම්/තාවකාලික) :...............................................................
   (iv) පළපුරුද්ද හා සේවා කාලය :...............................................................

8. අධ්‍යාපන සුදුසුකම් :........................................
(සමර්ථ වී ඇති උපරිම ශ්‍රේණිය සඳහන් සහතිකවල පිටපත් ඇමිණිය යුතුය.)
අ.පො.ස. (සා.පෙළ) විභාගය :
පළමුවර වර්ෂය : ............................ දෙවනවර වර්ෂය : ....................................
විභාග අංකය : ...................................... විභාග අංකය : ......................................

| අනු. අංකය | විෂයය | ලබා ඇති සමාර්ථය | | අනු. අංකය | විෂයය | ලබා ඇති සමාර්ථය | |
|---|---|---|---|---|---|---|---|
| | | පළමුවර | දෙවනවර | | | පළමුවර | දෙවනවර |
| | | | | | | | |
| | | | | | | | |
| | | | | | | | |
| | | | | | | | |
| | | | | | | | |

9. වෘත්තීය සුදුසුකම් :............................................

10. වෙනත් සුදුසුකම් :..........................................
(තාක්ෂණික දැනුම පිළිබඳ සහතික වල පිටපත් ඇමිණිය යුතුය)

11. ඔබ කවරදාක හෝ චෝදනාවක් සඳහා උසාවියකින් වරදකරු කරනු ලැබ තිබේ ද? :............................................

12. ඔබ දැනටමත් මෙම ප්‍රාදේශීය සභාවේ සේවයේ නියුක්තව සිටීද? ඔව්/නැත :............................................
ඔව් නම් දැනට දරන තනතුර හා එම තනතුරට පත් වූ දිනය :............................................

ඉහත සඳහන් අංක 01 - 12 දක්වා කරුණු සත්‍ය හා නිවැරදි බවට සහතික කරන අතර යම් විටකදී මෙම තොරතුරු අසත්‍ය බව හෙලිවුවහොත් මා සේවයෙන් පහ කිරීමට යටත් වන බව තේරුම් ගෙන ඇති බවත් ඉල්ලුම්පත්‍ර කැඳවීමේ කොන්දේසි වලට මම යටත් වන බවත් ප්‍රකාශ කරමි.

......................................
අයදුම්කරුගේ අත්සන.

දිනය :....................

**දැනට රාජ්‍ය සේවයේ නියුක්ත අයදුම්කරුවන් සඳහා ආයතන ප්‍රධානියාගේ සහතිකය**

මෙම ඉල්ලුම්කරු වන .................................................................... යන අය මෙම ආයතනයේ ................................................ වශයෙන් ....... ................................................ දින සිට සේවය කරනු ලබයි. ඉල්ලා ඇති තනතුරට තෝරා ගත හොත් ඔහු/ ඇය දැනට දරන තනතුරෙන් නිදහස් කළ හැක/ නොහැක. ඔහු/ ඇය කිසිම නීත්‍යානුකූල දඬුවමකට භාජනය වී නොමැති බව මින් සහතික කරන අතර අයදුම්පත නිර්දේශ කර ඉදිරිපත් කරමි.

....................................................
ආයතන ප්‍රධානියාගේ අත්සන
නිල මුද්‍රාව

දිනය :................................
නම :................................
තනතුර :................................
ආයතනය :................................

10 - 431

## ගල්ගමුව ප්‍රාදේශීය සභාව

### ප්‍රාථමික ශිල්පීය නොවන සේවක ගණයේ III ශ්‍රේණියේ තනතුරු සඳහා බඳවා ගැනීම

වයඹ පළාත් රාජ්‍ය සේවයේ ගල්ගමුව ප්‍රාදේශීය සභාවේ පහත සඳහන් තනතුරුවලට බඳවා ගැනීම සඳහා මෙම නිවේදනයේ සඳහන් සුදුසුකම් ඇති ගල්ගමුව ප්‍රාදේශීය සභා බල ප්‍රදේශයේ ස්ථිර පදිංචිය ඇති අයගෙන් අයදුම්පත් කැඳවනු ලැබේ.

| *අනු. අංකය* | *තනතුරු නාමය* | *තනතුරු සංඛ්‍යාව* | *වැටුප් ක්‍රමය* | *අධ්‍යාපන/වෘත්තීය සුදුසුකම්* |
|---|---|---|---|---|
| 01 | වැඩ/ක්ෂේත්‍ර කම්කරු | 02 | (රා. ප. ච. 3/2016) PL-1-1 රු. 24,250 - 10x 250-10 x 270-10 x 300-12 x 330- රු. 36,410 | අ. පො. ස. (සා. පෙළ) විභාගයේ දී දෙවරකට නොවැඩි වාර ගණනකදී යටත් පිරිසෙයින් විෂයයන් 02ක් වත් සමත් වී තිබිය යුතුයි. (වෛකල්පිත විෂයයන් හැර) |
| 02. | සෞඛ්‍ය කම්කරු | 01 | (රා. ප. ච. 3/2016) PL -1-1 රු. 24,250 - 10 x 250 - 10x 270 - 10 x 300 - 12 x 330- රු. 36,410 | රජයේ අනුමත පාසලකින් 8 ශ්‍රේණිය (9 වසර) සමත් වී තිබීම ප්‍රමාණවත් වේ. |
| 03. | සෞඛ්‍ය කම්කරු (කොන්ත්‍රාත්) | 06 | (රා. ප. ච 3/2016) PL - 1-1 රු. 24,250 - 10 x 250 - 10 x 270 - 10 x 300 x 12 x 330- රු. 36,410 | රජයේ අනුමත පාසලකින් 8 ශ්‍රේණිය (9 වසර) සමත් වී තිබීම ප්‍රමාණවත් වේ. |

02. *අවශ්‍ය වෙනත් සුදුසුකම් :*

1. අයදුම්කරු ශ්‍රී ලංකාවේ පුරවැසියෙකු විය යුතුයි.
2. අයදුම්පත් භාර ගන්නා අවසාන දිනයට පූර්වාසන්න වසර තුනක් ගල්ගමුව ප්‍රාදේශීය සභා බල ප්‍රදේශය තුළ ස්ථිර පදිංචිකරුවෙකු විය යුතුයි. (පදිංචිය වසමේ ග්‍රාම නිළධාරී විසින් නිකුත් කරනු ලබන සහතිකයක් මත අදළ ප්‍රාදේශීය ලේකම් විසින් අනු අත්සන් කර සනාථ කර තිබිය යුතුයි.)
3. අයදුම්පත් භාර ගන්නා අවසාන දිනයට වයස අවු. 18ට නොඅඩු හා අවු. 45ට නොවැඩි විය යුතුයි. (දනට පළාත් සභා රාජ්‍ය සේවයේ ස්ථිර, අනියම්, තාවකාලික, ආදේශක, ස්වේච්ඡා තනතුරක සේවයේ නියුතු අයදුම්කරුවන් සම්බන්ධයෙන් උපරිම වයස් සීමාව අදාළ නොවේ.)
4. යහපත් චරිතයකින් හා මනා ශරීර සෞඛ්‍ය තත්වයෙන් විය යුතුයි.
5. දණ්ඩ නීති සංග්‍රහය යටතේ උසාවියකින් වරදකරුවෙකු කරනු ලැබූවෙකු හෝ රජයේ/පළාත් පාලන හෝ සංස්ථා සේවයෙන් පහකරනු ලැබූවෙකු නොවිය යුතුයි.

03. *බඳවා ගැනීමේ ක්‍රමය :*

1. සේවා අවශ්‍යතාවයට අනුව විධිමත් සම්මුඛ පරීක්ෂණ සහ ප්‍රායෝගික පරීක්ෂණ මගින් සුදුස්සන් තෝරාගනු ලැබේ.
2. සම්මුඛ පරීක්ෂණයට පැමිණෙන විට අයදුම්කරුවන් සියළුම සහතිකවල මුල් පිටපත් රැගෙන ආ යුතුය.
3. දනටමත් මෙම ප්‍රාදේශීය සභාවේ ස්ථිර/තාවකාලික/අනියම්/ආදේශක/දීමනා/ස්වේච්ඡා පදනම මත සේවයේ නියුතු අයදුම්කරුවන්ට වැඩි සැලකිල්ලක් දක්වනු ලැබේ.
4. නියමිත සුදුසුකම් සපුරා ඇති අයදුම්කරුවන්ට පමණක් සම්මුඛ පරීක්ෂණය සඳහා කැඳවීම් කරනු ලැබේ.
5. කොන්ත්‍රාත් පදනම මත බඳවා ගන්නා සෞඛ්‍ය කම්කරුවන් වසරක කාලයකට හෝ අදාළ වෘත්තීය/වැඩසටහන අවසන් වනතෙක් යන අවස්ථා දෙකෙන් පළමුව එළඹෙන අවස්ථාව දක්වා බඳවා ගැනේ.
6. සුදුස්සන් තෝරා ගැනීම පිළිබඳව ගල්ගමුව ප්‍රාදේශීය සභාවේ ලේකම්ගේ තීරණය අවසාන තීරණය වේ.

04. *සේවයේ නියුක්ත කරවීමේ කොන්දේසි :*

1. වැඩ/ක්ෂේත්‍ර කම්කරු හා සෞඛ්‍ය කම්කරු තනතුරු. ස්ථිරය. විශ්‍රාම වැටුප් සහිතය.
2. අදාළ පරිදි වැන්දඹු හා අනත්දරු/වැන්දඹු පුරුෂ හා අනත්දරු විශ්‍රාම වැටුප් අරමුදලට දායක විය යුතුයි.
3. බඳවා ගනු ලබන තැනැත්තන් වසර 03ක පරිවාස කාලයකට යටත් වන අතර - ශ්‍රේණිගත උසස්වීමක් නම් එක් අවුරුදු වැඩබැලීමේ කාලයකට යටත් වේ.
4. රජයේ භාෂා ප්‍රතිපත්තිය ක්‍රියාත්මක කරනු සඳහාත්, විශේෂයෙන්ම රාජ්‍ය භාෂා පනතේ විධිවිධාන ක්‍රියාත්මක කරනු සඳහාත්, දැනටමත් සම්පාදනය කොට ඇති හා මින් මතු සම්පාදනය කළ හැකි විධිවිධානයන්ට එකඟව ක්‍රියා කළ යුතුයි.
5. කොන්ත්‍රාත් පදනම මත බඳවා ගන්නා සෞඛ්‍ය කම්කරුවන් රාජ්‍ය සේවා අර්ථ සාධක අරමුදලට දායක විය යුතුය.
6. මෙම බඳවා ගැනීමේ කොන්දේසිවලට අමතරව වයඹ ගරු ආණ්ඩුකාරතුමා අනුමත කර ඇති සේවා ව්‍යවස්ථාවේ කොන්දේසිවලට ද, මුදල් රෙගුලාසිවලට ද, රජයේ දෙපාර්තමේන්තු නියෝගවලටද, වයඹ පළාත් සභාව හෝ වයඹ පළාත් රාජ්‍ය සේවා කොමිෂන් සභාව විසින් වරින්වර නිකුත් කරන රෙගුලාසි හා නියෝගවලටද, අනුකූලව කටයුතු කිරීමට ඉල්ලුම්කරු බැඳී සිටී.

05. *අයදුම්පත් ඉදිරිපත් කිරීම :-*

1. අයදුම්කරුවන් මෙහි දක්වා ඇති ආදර්ශ අයදුම්පත්‍රයට අනුව පිළියෙල කරන ලද අයදුම්පත් 2018.10.26 වැනි දින හෝ ඊට ප්‍රථම ''ලේකම්, ගල්ගමුව ප්‍රාදේශීය සභාව'' යන ලිපිනයට ලියාපදිංචි තැපෑලෙන් එවිය යුතුයි.
2. අයදුම්පත බහාලන කවරයේ වම් පස ඉහළ කෙළවරේ, තනතුර සඳහන් කර අයදුම්පත එවිය යුතුයි ෑ
3. අයදුම්පත සමග පහත සඳහන් සහතිකවල පිටපත් අමුණා එවිය යුතුයි.
   (i) උප්පැන්න සහතිකය;
   (ii) අධ්‍යාපන සහතික;
   (iii) තම පදිංචිය තහවුරු කිරීම පිණිස ප්‍රාදේශීය ලේකම්වරයාගේ සහතිකය;
   (iv) මෑතක දී ලබාගත් චරිත සහතික දෙකක් (එකක් ග්‍රාම නිලධාරීගෙන් ලබාගත් එකක් විය යුතුයි.);
   (v) වෘත්තීය පළපුරුද්ද පිළිබඳ සහතික. (රජයේ/පළාත් පාලන සේවයේ නියුක්ත වූවන් තම අයදුම්පත් දෙපාර්තමේන්තු/ආයතන ප්‍රධානියා මගින් ඉදිරිපත් කළ යුතුය.
   (vi) ජාතික හැඳුනුම්පතේ පිටපත.

ඒ. බී. නිමල් රත්නායක,
ලේකම්,
ගල්ගමුව ප්‍රාදේශීය සභාව.

2018 ඔක්තෝබර් මස 03 වැනි දින,
ගල්ගමුව ප්‍රාදේශීය සභාවේ දීය.

**වයඹ පළාත් රාජ්‍ය සේවයේ ගල්ගමුව ප්‍රාදේශීය සභාවේ ........................ තනතුර සඳහා අයදුම්පත්‍රය**

01. (i) අයදුම්කරුගේ මුලකුරු සමග නම :....................................................
    (ii) මුලකුරුවලින් හැඳින්වෙන නම :....................................................
02. ස්ථිර ලිපිනය :....................................................
03. (i) උපන් දිනය ෑ අවුරුද්ද:...............; මාසය:...............; දිනය:...............
    (ii) 2018.10.26 වැනි දිනට වයස : අවුරුදු:............... මාස:............... දින:...............
04. ජාතික හැඳුනුම්පත් අංකය :....................................................
05. ස්ත්‍රී/පුරුෂ භාවය :....................................................
06. විවාහක/අවිවාහක බව :....................................................
07. ජාතිය :....................................................

08. වයඹ පළාත තුළ ස්ථිර පදිංචි කාලය :..................................................

09. ඔබ ශ්‍රී ලංකාවේ පුරවැසියෙක් ද? එසේ නම් පරම්පරාවෙන් ද? ලියාපදිංචි වීමෙන් ද යන වග :..........................

10. අධ්‍යාපන සුදුසුකම් (සමත් වූ විභාග පිළිබඳ විස්තරය)

(i) සමත් වූ වසර/ශ්‍රේණිය :............... වර්ෂය :...............

(ii) අ. පො. ස. (සා. පෙළ) විභාගය ඃ

විභාග අංකය :........................ වර්ෂය :........................

| විෂයය | සාමාර්ථය | විෂයය | සාමාර්ථය |
|---|---|---|---|
| | | | |
| | | | |
| | | | |
| | | | |

(iii) අ. පො. ස. (උ/පෙළ) විභාගය ඃ

විභාග අංකය :........................ වර්ෂය :........................

| විෂයය | සාමාර්ථය |
|---|---|
| | |
| | |
| | |
| | |

11. වෘත්තීය සුදුසුකම් හා පළපුරුද්ද :..............................

12. ඔබ දැනටමත් මෙම ප්‍රාදේශීය සභාවේ සේවය කරන්නේ නම් එම සේවා කාලය හා විස්තර :..............................
.......................................................................................................................................

13. ඔබ කවරදාක හෝ උසාවියකින් වරදකරුවෙකු කරනු ලැබ තිබේ ද? :..............................

මෙම ඉල්ලුම්පත්‍රයෙහි මා විසින් සපයන ලද තොරතුරු මාගේ දැනීමේ හා විශ්වාසය පරිදි සත්‍ය හා නිවැරදි ඒවා බව මෙයින් සහතික කරමි. මෙහි ඇතුළත් තොරතුරු අසත්‍ය බව මා එම තනතුරට තෝරා ගැනීමට පෙර අනාවරණය වුවහොත් මා නුසුදුස්සෙකු බවට පත්වන බවත්, තෝරා ගැනීමෙන් පසු අනාවරණය වුවහොත් කිසිදු වන්දියක් නොගෙවා සේවයෙන් පහ කිරීමට යටත් වන බවත් දනිමි.

........................;
අයදුම්කරුගේ අත්සන.

දිනය........................

දෙපාර්තමේන්තු ප්‍රධානියාගේ සහතිකය.
(දැනට සේවයේ නියුක්ත වූවන්ට පමණි.)

අයදුම්කරු ඉහතින් දක්වා ඇති තොරතුරු නිවැරදි බවත්, තෝරාගනු ලැබුවහොත් සේවයෙන් මුදාහැරීමට එකඟ වන බවත් දැනට ................................................................වශයෙන් සේවය කරන බවත් සහතික කරමි.

........................;
දෙපාර්තමේන්තු/ආයතන ප්‍රධානියාගේ අත්සන.
(නිල මුද්‍රාව තැබිය යුතුයි)

දිනය :........................

10-1232

# පළාත් පාලන නිවේදන

## මතුගම ප්‍රාදේශීය සභාව

1987 අංක 15 දරන ප්‍රාදේශීය සභා පනතේ 24(3) වැනි වගන්තිය යටතේ කරනු ලබන දැන්වීම

1987 අංක 15 දරන ප්‍රාදේශීය සභා පනතේ 24(1) වගන්තිය ප්‍රකාරව බස්නාහිර පළාතේ කළුතර දිස්ත්‍රික්කයේ මතුගම ප්‍රාදේශීය සභාව විසින් අංක 1022 හා 2018.06.08 දිනැති *ගැසට් පත්‍රයේ* IV(ආ) කොටසෙහි ප්‍රකාශයට පත් කරන ලද පහත සඳහන් උපලේඛනයේ සඳහන් මාර්ග මෙම කාල සීමාව තුළ දී කිසිදු විරුද්ධත්වයක් ඉදිරිපත් වී නොමැති බැවින් මතුගම ප්‍රාදේශීය සභාව සතු මාර්ග ලෙස ප්‍රකාශයට පත් කරනු ලබන බව මෙයින් නිවේදනය කරනු ලැබේ.

මෙරිල් මුණසිංහ,<br>
සභාපති,<br>
මතුගම ප්‍රාදේශීය සභාව.

2018 සැප්තැම්බර් මස 27 වැනි දින.

| *අනු. අංකය* | *මාර්ගයේ නම* | *මාර්ගයේ දිග මීටර්* | *මාර්ග යේ පළල මීටර්* | *ආරම්භක ස්ථානය* | *අවසාන ස්ථානය* | *ග්‍රා.නි. වසම* |
|---|---|---|---|---|---|---|
| 01 | මඩවල තිත්තකැකිරිහේන පාර | 1000 | 3.65 | වැලිපැන්න ඌරගොඩ මාර්ගයේ පල්ලෙ මුල්ල | ගල්කඩුව-ඌරගොඩ මාර්ගය | 793 ඩී මඩවල |
| 02 | ඉද්දගොඩ මාස්ලියැද්ද පාර | 111 | 3.65 | ගුරුදොල පාර | කුසුමා ජයලත් මහත්මියගේ ඉඩම | 806 බී හිරිකැටිය |
| 03 | සෙන්ට්‍රල් ගාර්ඩන් ප්‍රධාන මාවත | 700 | 6.0 | ආදගල පාර | එච්. ඒ. සී. ඩී. ඒ. සෙනෙවිරත්න මහතාගේ ඉඩම | 805 මතුගම නැගෙනහිර |
| 04 | සෙන්ට්‍රල් ගාර්ඩන් 1 වන මාවත | 52 | 3.0 | සෙන්ට්‍රල් ගාර්ඩන් ප්‍රධාන මාවත | ජී.ඩී. පත්මසිරි මහතාගේ ඉඩම | 805 මතුගම නැගෙනහිර |
| 05 | සෙන්ට්‍රල් ගාර්ඩන් 2 වන මාවත | 43 | 3.0 | සෙන්ට්‍රල් ගාර්ඩන් ප්‍රධාන මාවත | බී.ඩී. පත්මසිරි මහතාගේ ඉඩම | 805 මතුගම නැගෙනහිර |
| 06 | සෙන්ට්‍රල් ගාර්ඩන් 3 වන මාවත | 61 | 4.57 | සෙන්ට්‍රල් ගාර්ඩන් ප්‍රධාන මාවත | රමණී කළුආරච්චි මහත්මියගේ ඉඩම | 805 මතුගම නැගෙනහිර |
| 07 | දෝනමුල්ල පාර | 234 | 3.6 | මතුගම කළුතර ප්‍රධාන මාර්ගයේ කඩවත ප්‍රදේශයෙන් වමට | ඩී. එච්. ජානක මහතාගේ ඉඩම | 844 ඒ වැලිමානාත |
| 08 | ගොඩහේන් කන්ද පාර | 254 | 3.6 | සුදන්ගෙදර හේවාගොඩ පාර | ඩබ්. ජී. අජිත් ප්‍රසන්න මහතාගේ ඉඩම | 795 ඕවිටිගල |
| 09 | කටුගහහේන ජයවර්ධන ගොඩ පළමු අතුරු මාර්ගය | 147 | 3.0 | කටුගහහේන හන්දියේ සිට කොටගෙදර දක්වා ගමන් කරන මාර්ගය | විල්ඩින් නෝනා මහත්මියගේ ඉඩම | 798 කොටගෙ දර |
| 10 | ඕවිටගල කට්ටඩි ගොඩැල්ල මාර්ගය | 77 | 6.0 | මතුගම අළුත්ගම මාර්ගයේ කඩිත්ත මංකඩ පාලම | කඩිත්ත මංකඩ ඇල හා කුඹුර | 795 ඕවිටිගල |

| අනු. අංකය | මාර්ගයේ නම | මාර්ගයේ දිග මීටර් | මාර්ග යේ පළල මීටර් | ආරම්භක ස්ථානය | අවසාන ස්ථානය | ග්‍රා.නි. වසම |
|---|---|---|---|---|---|---|
| 11 | නවුත්තුඩුව දෙල්ගස් ගොඩ මාර්ගය | 900 | 4.5 | නවුත්තුඩුව අළුත්ගම මාර්ගයේ නවුත්තුඩුව හන්දියේ සිට කීරන්තිඩිය දෙසට හමුවන පළමු පාලම අසලින් දකුණට | අයි. පී. බන්දුල ප්‍රේමසිරි මහතාගේ ඉඩම | 796 A අළුත් ගමේගොඩ |
| 12 | කුඩලිගම කන්ද පාර පලවන අතුරු මාර්ගය | 442 | 3.65 | කුඩලිගම කන්ද පාර | ඉද්දගොඩ දෙනිය 1 වන පටුමග | 806 ඉද්දගොඩ නැගෙනහිර |
| 13 | අළුබෝගහලන්ද මාර්ගය | 154 | 6.0 | මතුගම අගලවත්ත ප්‍රධාන පාර | ජී.වී. සිරිවිමල් මහතාගේ ඉඩම | 805D වැත්තෑව |
| 14 | අළුබෝගහලන්ද පළමු හරස් මාර්ගය | 80 | 3.6 | පිඹුරු අංක 1519 කැබලි අංක 10 දරන එස්.ඒ. චාන්දනී විනීතා මියගේ ඉඩම | ඩබ්ලිව්. ඒ. පුෂ්පා මියගේ ඉඩම | 805D වැත්තෑව |
| 15 | අළුබෝගහලන්ද දෙවන හරස් මාර්ගය | 64 | 3.0 | පිඹුරු අංක 1519 කැබලි අංක 1 දරන ඩබ්ලිව්. ඒ. පුෂ්පා මියගේ ඉඩම | ජී. වී. සිරිවිමල් මහතාගේ ඉඩම | 805D වැත්තෑව |
| 16 | සාමකන්ද හරහා පෙත්ත කන්දට වැටෙන මාර්ගය | 246 | 3.0 | දේවාල කන්ද පාර | ජී.ඩී. මාලනී මියගේ ඉඩම | 805D වැත්තෑව |
| 17 | නිවිතිගල වත්ත පාර පළමු පටුමග | 75 | 3.0 | නිවිතිගල වත්ත පාර | අයි. එච්. යමුනා උදයංගනී මහත්මියගේ ඉඩම | 805D වැත්තෑව |
| 18 | ඇටිකුකුළු ගොඩැල්ල පළමු පටුමග | 155 | 4.9 | මාවතගොඩ පාර | ඩබ්.ටී.ඩී. නන්දන වික්‍රමසිංහ මහතාගේ ඉඩම | 794C හොරවල බටහිර |
| 19 | බිලිංගහවත්ත පළවන පටුමග | 185.3 | 3.04 | පාන්තිය සාරානන්ද මාවතේ සම්පත් ෆුඩ් සිටි අසල | කේ. එම්. එස්. ගාමිණී මහතාගේ නිවස අසල | 805E යටිටෝවිට |
| 20 | මතුගම විලේගොඩ පල්ලිය පාර | 641 | 3.04 | විලේගොඩ පාරේ ඩබ්ලිව්. ඩී. මෛත්‍රීපාල මහතාගේ නිවස අසල | විලේගොඩ පල්ලිය අසල | 805E යටිටෝවිට |
| 21 | සාමකන්ද පාර දෙවන හරස් මාර්ගය | 90 | 3.04 | මතුගම සාමකන්ද පාර | ජයන්ත ලියනාරච්චි මහතාගේ ඉඩම | 805 B මතුගම උතුර |
| 22 | හිගුරාන බෝපිටිය වත්ත පාර | 242 | 3.65 | මතුගම කළුතර ප්‍රධාන පාර | රොෂාන් චමින්ද මහතාගේ ඉඩම | 804 A වැලිමානාන |
| 23 | කිරිපැලතුඩුව පාර | 220 | 3.0 | යටදොල අළුත්ගම ප්‍රධාන මාර්ගය | ඩබ්ලිව්. ඩී.ධර්මදාස මහතාගේ ඉඩම | 797 A පුස්සලමුල්ල |
| 24 | බකිනිගහලන්ද පාර | 75 | 2.74 | මතුගම අගලවත්ත ප්‍රධාන පාර | මතාතුගල සෙට්ටිආරච්චි මහතාගේ ඉඩම | 805A වැත්තෑව |
| 25 | අග්ගොනයාවත්ත පාර | 125 | 4.87 | සෙන්දනායක මාවත | කේ. ඒ. රංජිත් මහතාගේ ඉඩම | 805 B මතුගම බටහිර |
| 26 | ඇතුලත්මුදලිගම සමගි මාවත | 57 | 3.0 | ආඳගල පාර | කේ. ඩී. මංජුල ක්‍රිශාන්ත මහතාගේ ඉඩම | 805D මතුගම නැගෙනහිර |

| අනු. අංකය | මාර්ගයේ නම | මාර්ගයේ දිග මීටර් | මාර්ග යේ පළල මීටර් | ආරම්භක ස්ථානය | අවසාන ස්ථානය | ග්‍රා.නි. වසම |
|---|---|---|---|---|---|---|
| 27 | ඇතුලත්මුදලිගම එස්. ඒ. වෙල්ගම මාවත | 114 | 2.43 | ආදගල පාර | පී. ධම්මික ප්‍රියදර්ශන මහතාගේ ඉඩම | 805 D මතුගම නැගෙනහිර |
| 28 | ඇතුලත්මුදලිගම එස්.ඒ.වෙල්ගම 1 වන මාවත | 60 | 3.0 | ආදගල පාර | ඩබ්ලිව්. එල්. සුමනාවතී මහත්මියගේ ඉඩම | 805D මතුගම නැගෙනහිර |
| 29 | බදුගම 7 වන මාවතේ 3 වන පටුමග | 65.5 | 3.65 | බදුගම 7 වන මාවත | ඩී. ආර්. ටී. ලොකුකැටගොඩ මහත්මියගේ ඉඩම | 795 A බදුගම |
| 30 | පැරණි රෝහල් පටුමග | 100 | 3.65 | බණ්ඩාරනායක මාවත | පී. වී. විජේදාස මහතාගෙ ඉඩම | 805 මතුගම නැගෙනහිර |
| 31 | හොරවල සමගි මාවත | 300 | 3.0 | අළුත්ගම මතුගම ප්‍රධාන පාර | හේමන්ත පුෂ්පකුමාර මහතාගේ ඉඩම අවසානයේ | 794 C හොරවල බටහිර |
| 32 | දෙබරබැදිහේනට පිවිසෙන අතුරු මාර්ගය | 135 | 3.0 | බෝපිටිය සෝමපාල මාවත | කේ.ඩී. සී. මල්ලිකා ජයතිලක මහත්මියගේ ඉඩම | 802 බෝපිටිය නැගෙනහිර |
| 33 | දම්පරාවත්ත පාර | 130 | 2.13 | බෙල්ලන මාර්ගය | කේ. ඩී. මල්ලිකා මහත්මියගේ ඉඩම | 804 පාන්තිය |
| 34 | ගුරුපුරය 1 වන මාවත | 200 | 6.09 | ආදගල පාර | කසුන් එදිරිසිංහ මහතාගේ ඉඩම | 804 පාන්තිය |
| 35 | රත්නායක වත්ත පාර | 140 | 3.65 | වැල්කන්දල පාර | ඩබ්ලිව්. ඒ. සමන් උයදතිලක මහතාගේ ඉඩම | 804 පාන්තිය |
| 36 | මද්දේගෙදර වත්ත ස්ටෝරුව පාර | 367.8 | 3.65 | මද්දේගෙදර වත්ත පාර | ඩබ්ලිව්. ඒ. වීරසිංහ මහතාගේ ඉඩම | 805 සී මතුගම දකුණ |
| 37 | මද්දේගෙදර වත්ත ස්ටෝරුව පාර 1 වන පටුමග | 100 | 3.65 | මද්දේගෙදර වත්ත ස්ටෝරුව පාර | කේ. ඒ. රසික ලසන්ත මහතාගේ ඉඩම | 805 සී මතුගම දකුණ |
| 38 | අඹේමුල්ල මාර්ගය | 395 | 3.0 | අඹේමුල්ල මාර්ගයේ අගලවත්ත ප්‍රාදේශීය සභා මායිම | හැලඹ රජයේ වත්ත | 805 D වැත්තෑව |
| 39 | හොරකඳමුල්ල මුණසිංහ මාවත | 233 | 5.0 | හොරකඳමුල්ල පාර | ආර්. පී. ඩී. ඩී. එම්. රණවීර මහතාගේ ඉඩම | 805 බී මතුගම උතුර |
| 40 | කහටගහවත්ත මාර්ගය | 765 | 3.65 | හිජ්රා මාවත | වැලිපැන්න පාසල පාර | 793 B වැලිපැන්න නැගෙනහිර |
| 41 | කහටගහවත්ත පළමු අතුරු මාර්ගය | 182.6 | 4.57 | කහටගහවත්ත මාර්ගය | කහටගහවත්ත මාර්ගය | 793 B වැලිපැන්න නැගෙනහිර උතුර |
| 42 | කහටගහවත්ත දෙවන අතුරු මාර්ගය | 380 | 6.0 | කහටගහවත්ත මාර්ගය | කහටගහවත්ත වෙන්දේසි ඉඩම | 793 B වැලිපැන්න නැගෙනහිර උතුර |

| *අනු. අංකය* | *මාර්ගයේ නම* | *මාර්ගයේ දිග මීටර්* | *මාර්ග යේ පළල මීටර්* | *ආරම්භක ස්ථානය* | *අවසාන ස්ථානය* | *ග්‍රා.නි. වසම* |
|---|---|---|---|---|---|---|
| 43 | කහටගහවත්ත දෙවන අතුරු මාර්ගයෙන් පටන්ගන්නා පළවන අතුරු මාර්ගය | 225 | 6.0 | කහටගහවත්ත පාරේ දෙවන අතුරු මාර්ගය | කහටගහවත්ත පාරේ දෙවන අතුරු මාර්ගය | 793 බී වැලිපැන්න නැගෙනහිර උතුර |
| 44 | කහටගහවත්ත දෙවන අතුරු මාර්ගයෙන් පටන්ගන්නා තුන්වන අතුරු මාර්ගය | 105 | 6.0 | කහටගහවත්ත පාරේ දෙවන අතුරු මාර්ග යේ පළමු අතුරු මාර්ගය | කහටගහවත්ත මාර්ග යෙන් පටන්ගන්නා දෙවන අතුරු මාර්ග යෙන් ආරම්භවන පළමු අතුරු මාර්ගය | 793 බී වැලිපැන්න නැගෙනහිර උතුර |
| 45 | කහටගහවත්ත දෙවන අතුරු මාර්ගයෙන් පටනාගන්නා දෙවන අතුරු මාර්ගය | 69 | 4.57 | කහටගහවත්ත පාරේ දෙවන අතුරු මාර්ගය | දෙවන අතුරු මාර්ග යෙන් පටන් ගන්නා පළමු අතුරු මාර්ගය | 793 බී වැලිපැන්න නැගෙනහිර උතුර |
| 46 | කහටගහවත්ත මාර්ග යෙන් ආරම්භවන තුන්වන අතුරු මාර්ගය | 100 | 4.57 | කහටගහවත්ත මාර්ගය | කුඹුරු යාය | 793 බී වැලිපැන්න නැගෙනහිර උතුර |
| 47 | වැල්කන්දල උඩුමුල්ල පාර | 436 | 3.65 | වැල්කන්දල පාර | අයි. එච්. ඉරේෂා මහත්මියගේ ඉඩම | 804 පාන්තිය |
| 48 | ගුරුදොල වෙන්දේසිවත්ත පාර | 139 | 4.5 | ගුරුදොල පාර | කරුණාදාස වික්‍රමනායක මහතාගේ ඉඩම | 806 සී ගුරුදොල |
| 49 | නුගගහකුරුදුවත්ත පාර | 115 | 3.0 | කළුතර - මතුගම ප්‍රධාන පාර | ඩබ්ලිව්. කේ. විජේසේන මහතාගේ නිවස | 805 ඒ මතුගම බටහිර |
| 50 | උතුරු පල්ලියගොඩ මස්සලයාවත්ත පාර | 90 | 3.0 | පාන්තිය සෙන්දනායක මාවතේ කෝලිත සෙන්දනායක මහතාගේ නිවස | කේ. ඒ. රංජිත් මහතාගේ නිවස | 805 ඒ මතුගම බටහිර |
| 51 | හොරවල අම්බලන්දූව වත්ත පාර | 130 | 6.0 | හොරවල අළුත්ගම පාර RDA කාර්යාලය | සහන් කාරියවසම් මහතාගේ ඉඩම | 794 හොරවල |
| 52 | ඩී. ආර්. සමිත් වීරසිංහ මහතාගේ නිවසේ සිට වෛද්‍ය නාලක ජයසිංහ මහතාගේ නිවස දක්වා පාර (බක්මීගහලන්ද පාර) | 175 | 4.57 | ඩී. ආර්. සමිත් වීරසිංහ මහතාගේ නිවස | වෛද්‍ය නාලක ජයසිංහ මහතාගේ නිවස | 805 ඩී වැත්තෑව |
| 53 | පාන්තිය ධර්මරාජ මාවතේ පළමු අතුරු මාර්ගය | 100 | 4.5 | ධර්මරාජ මාවත | ඒ. ටී. රත්නපාල මහතාගේ නිවස | 805 ඒ මතුගම බටහිර |
| 54 | දෙල්ගහවත්ත පාර | 100 | 2.43 | සෙන්දනායක මාවත | පැන්සි සෙන්දනායක මහතාගේ ඉඩම | 805 ඒ මතුගම බටහිර |

**මතුගම ප්‍රාදේශීය සභාව**

1987 අංක 15 දරන ප්‍රාදේශීය සභා පනතේ 24(1) වගන්තිය යටතේ කරනු ලබන දැන්වීම

1987 අංක 15 දරන ප්‍රාදේශීය සභා පනතේ 24(1) වගන්තිය ප්‍රකාරව බස්නාහිර පළාතේ කළුතර දිස්ත්‍රික්කයේ මතුගම ප්‍රාදේශීය සභාව විසින් පහතින් සඳහන් කර ඇති මංමාවත් මතුගම ප්‍රාදේශීය සභාව සතු මංමාවත් වශයෙන් ප්‍රකාශයට පත් කරනු ලබන බව මෙයින් නිවේදනය කරනු ලැබේ.

02. මෙම මංමාවත් සම්බන්ධයෙන් අදාළ ඉඩම් අයිතිකරුවන් ලෙස හිමිකම් පාන පාර්ශවයන් විසින් යම් විරෝධතාවයක් පළ කරනු ලබන්නේ නම්, මෙම නිවේදනය පළ වූ දින සිට මසක් ඇතුළත තමාගේ අයිතිය ඔප්පු කිරීම සඳහා 1987 අංක 15 දරන ප්‍රාදේශීය සභා පනතේ 24(2) වගන්තිය ප්‍රකාර ක්‍රියා කරන ලෙසට මෙයින් දැනුම් දෙනු ලැබේ.

මෙරිල් මුණසිංහ,
සභාපති,
මතුගම ප්‍රාදේශීය සභාව

2018 සැප්තැම්බර් මස 27 වැනි දින,
මතුගම ප්‍රාදේශීය සභා ප්‍රධාන කාර්යාලයේ දී ය.

**උපලේඛනය**

| *අනු. අංකය* | *මාර්ගයේ නම* | *මාර්ගයේ දිග මීටර්* | *මාර්ගයේ පළල මීටර්* | *ආරම්භක ස්ථානය* | *අවසාන ස්ථානය* | *ග්‍රා.නි. වසම* |
|---|---|---|---|---|---|---|
| 1 | යට්ටෝවිට දිමුතු මිහිර මාවත | 90 | 3 | මතුගම යට්ටෝවිට පාර | බිලිංගහවත්ත කැට-කැරැල්ල මාවත | 805 ඊ යට්ටෝවිට |
| 2 | බොන්දුපිටිය මැස්සබැදි-හේන මාර්ගය | 1700 | 4.5 | අළුත්ගම මතුගම ප්‍රධාන පාර | බොන්දුපිටිය මැස්ස බැදිහේන | 771 බී බොන්දුපිටිය |
| 3 | ආඳවල මහවත්ත පාර | 250 | 3 | රිටිකැටිය මීගම පාර | එම්.ඒ. ප්‍රදීප් වසන්ත මහතාගේ ඉඩම | 776 ආඳවල |
| 4 | බක්මීගහලන්ද පාර | 175 | 4.57 | මතුගම අගලවත්ත ප්‍රධාන පාර | වෛද්‍ය නාලක ජයසිංහ මහතාගේ ඉඩම | 805 ඩී වැත්තෑව |

10-375

---

**කොත්මලේ ප්‍රාදේශීය සභාව**

1952 වසරේ අංක 06 දරන පළාත් පාලන ආයතන (සම්මත අතුරු ව්‍යවස්ථා) පනත

1952 වසරේ අංක 06 දරන පළාත් පාලන ආයතන (සම්මත අතුරු ව්‍යවස්ථා) පනතේ 3 වැනි වගන්තියේ (I) වැනි උප වගන්තිය යටතේ පැවරී ඇති බලතල ප්‍රකාරව 2018 වසරේ සැප්තැම්බර් මස 18 වැනි දින කොත්මලේ ප්‍රාදේශීය සභාව විසින් පහත සඳහන් පරිද්දෙන් තීරණය කර ඇති බව මෙයින් දැනුම් දෙමි.

සුසන්ත ප්‍රදීප් කුමාර ජයසුන්දර,
සභාපති,
කොත්මලේ ප්‍රාදේශීය සභාව.

2018 සැප්තැම්බර් මස 18 වැනි දින,
පූඩළුඔය,
කොත්මලේ ප්‍රාදේශීය සභා කාර්යාලයේ දී ය.

**1952 වසරේ අංක 06 දරන පළාත් පාලන ආයතන (සම්මත අතුරු ව්‍යවස්ථා) පනත**

1989 වසරේ අංක 12 දරන පළාත් සභා (අනුෂාංගික විධි විධාන) පනතේ 2 වැනි වගන්තියේ (1) වැනි උප වගන්තියේ (අ) වන ඡේදය සමග කියවිය යුතු 1952 අංක 06 දරන පළාත් පාලන ආයතන (සම්මත අතුරු ව්‍යවස්ථා) පනතේ 2 වැනි වගන්තියේ (1) වැනි උප වගන්තිය යටතේ මධ්‍යම පළාතේ පළාත් සභාවේ පළාත් පාලන විෂය භාර අමාත්‍යවරයා වෙත පැවරී ඇති බලතල ප්‍රකාරව මධ්‍යම පළාතේ පළාත් පාලන විෂය භාර අමාත්‍යවරයා විසින් පිළියෙල කරනු ලැබ 2016.02.23 දිනැති අංක 1955/7 ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික ජනරජයේ *අති විශෙෂ ගැසට් පත්‍රය* මගින් ප්‍රසිද්ධ කර ඇත්තාවූත් මධ්‍යම පළාතේ පළාත් සභාව විසින් 2017.02.21 වැනි දින අනුමත කර 2017.05.05 දිනැති අංක 2017/42 ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ *අති විශෙෂ ගැසට් පත්‍රයේ* iv (අ) වැනි කොටසේ පළ කරනු ලැබූ අතුරු ව්‍යවස්ථා අතුරින් පහත සඳහන් අතුරු ව්‍යවස්ථා ගැසට් පත්‍රය පළ කරන දිනයේ සිට පිළිගනිමින් කොත්මලේ ප්‍රාදේශීය සභාවේ බල ප්‍රදේශයේ ක්‍රියාත්මක කරන බව ඉහතකී 1952 වසරේ අංක 06 දරන (261 අධිකාරය) සම්මත අතුරු ව්‍යවස්ථා පනතේ 3 වැනි වගන්තියේ (1) වැනි උප වගන්තිය යටතේ කොත්මලේ ප්‍රාදේශීය සභාව විසින් තීරණය කර ඇත.

01. ප්‍රාදේශීය සභා සීමාව තුළ ගොඩනැගිලි ඉදි කිරීම සඳහා වූ සැළසුම් පරීක්ෂා කිරීම සහ ගාස්තු අය කිරීම පිළිබඳ වූ අතුරු ව්‍යවස්ථාව (නාගරික සංවර්ධන අධිකාරි බල ප්‍රදේශයෙන් පිටත)
02. සේවා සඳහා ගාස්තු අයකිරීම පිළිබඳ අතුරු ව්‍යවස්ථාව
03. මහජන පුස්තකාල පිළිබඳ අතුරු ව්‍යවස්ථාව
04. ආදහනාගාර පිළිබඳ අතුරු ව්‍යවස්ථාව
05. බදු අයකර ගැනීමේ කාර්යය සඳහා වාර වාර්තා හා තොරතුරු ලබාගැනීමේ අතුරු ව්‍යවස්ථාව
06. පීඩාකාරී ව්‍යාපාර, අන්තරාදයක ව්‍යාපාර හා පීඩාකාරී හා අන්තරාදයක ව්‍යාපාර පිළිබඳ අතුරු ව්‍යවස්ථාව
07. මාළු විකිණීම පිළිබඳ අතුරු ව්‍යවස්ථාව
08. ප්‍රාදේශීය සභා පොළ පිළිබඳ අතුරු ව්‍යවස්ථාව
09. සැරසිලි විධිමත් කිරීම හා පාලනය කිරීම සඳහා වන අතුරු ව්‍යවස්ථාව
10. පොදු වැසිකිලි පාවිච්චිය විධිමත් කිරීම සඳහා වන අතුරු ව්‍යවස්ථාව
11. ප්‍රචාරක දැන්වීම් පිළිබඳ අතුරු ව්‍යවස්ථාව
12. සත්ව ගොවිපලවල් පාලනය කිරීම හා විධිමත් කිරීම සඳහා වූ අතුරු ව්‍යවස්ථාව
13. මස් විකිණීම පිළිබඳ අතුරු ව්‍යවස්ථාව
14. පෞද්ගලික ඉගැනුම් ආයතන පිළිබඳ අතුරු ව්‍යවස්ථාව
15. ගෝ ඝාතකාගාර පිළිබඳ අතුරු ව්‍යවස්ථාව
16. ප්‍රාදේශීය සභා මංමාවත්වල ධාවනය කරනු ලබන වාහනවල බර හා වේගය පාලනය කිරීම පිළිබඳ අතුරු ව්‍යවස්ථාව

10-356

---

**මැදදුම්බර ප්‍රාදේශීය සභාව**

**වෙන්දේසිය පිළිබඳ නිවේදනය**

(1987 අංක 15 දරන ප්‍රාදේශීය සභා පනතේ 163 සහ 164 වගන්තිය යටතේ සිදු කෙරෙන වෙන්දේසිය)

ප්‍රාදේශීය සභා පනතේ 163 විධිවිධාන යටතේ හිඟ වරිපනම් ගෙවීම පැහැර හැරීම යන හේතුව මත මැදදුම්බර ප්‍රාදේශීය සභාව විසින් තහනමට ගනු ලැබූ පහත සඳහන් විස්තර දක්වා ඇති චංචල දේපළ ප්‍රසිද්ධ වෙන්දේසියේ විකුණනු ලබන බවයි.

| *දේපළ වර්ගය* | *කෙටි විස්තරය* | *නිෂ්පාදිතය මිලදී ගත් වර්ෂය* | *අවම ලංසුව* | *සටහන්* |
|---|---|---|---|---|
| පිත්තල බුලත් තට්ටු -01 (අඩි 21/2) | තෙල්දෙණිය නුවර පාරෙහි පදිංචි කේ.ජී. පියදාස මහතා වරිපනම් බදු ගෙවීම පැහැර හැරීම හේතුවෙන් | | | |

වෙන්දේසිය පවත්වන දිනය හා වේලාව : 2018.10.12 දින පෙ.ව. 9.00ට
වෙන්දේසිය පවත්වන ස්ථානය : මැදදුම්බර ප්‍රාදේශීය සභාව

ලේකම්,
මැදදුම්බර ප්‍රාදේශීය සභාව

10-541

## කෑගල්ල ප්‍රාදේශීය සභාව

1987 අංක 15 දරන ප්‍රාදේශීය සභා පනතේ 24 (1) ආ වගන්තිය යටතේ කරනු ලබන දැන්වීම

1989 අංක 12 දරන (අනුෂාංගික විධිවිධාන) පනතේ දෙවන වගන්තිය සමග කියවිය යුතු 1987 අංක 15 දරන ප්‍රාදේශීය සභා පනතේ 24(1) ආ වගන්තිය ප්‍රකාරව කටයුතු කරමින් සබරගමුව පළාත් ගරු ආණ්ඩුකාරතුමාගේ අනුමැතිය ලබා දී ඇති CLG5/4/K/4 හා 2018.01.04 දිනැති ලිපිය අනුව පහත උපලේඛනයේ සඳහන් මාර්ග කෑගල්ල ප්‍රාදේශීය සභාව සතු මාර්ග ලෙස මෙයින් ප්‍රකාශයට පත් කරනු ලැබේ.

මෙම මාවත් සළකුණු කරනු ලැබ ඇත්තේ යම් ඉඩමක් හරහාද, එම ඉඩමේ අයිතිකරු ලෙස හිමිකම්පාන යම් පාර්ශ්වයක් වේ නම් මෙම දැන්වීම පළ කළ දින සිට මාස 03 ක කාලයක් තුළ එම ඉඩමට ඇති අයිතිය ඔප්පු කිරීම සඳහා නිසි අධිකරණයෙහි නඩුවක් පවරා විරෝධතා ඉදිරිපත් කළ යුතු බව ප්‍රාදේශීය සභා පනතේ 24(2) වගන්තිය ප්‍රකාරව මෙයින් දැනුම් දෙනු ලැබේ.

අයි. ජගත් රවීන්ද්‍ර ජයසිංහ,
සභාපති,
කෑගල්ල ප්‍රාදේශීය සභාව,
බුළුරුප්ප, හෙට්ටිමුල්ල.

| | | | |
|---|---|---|---|
| 01 | පාරේ නම | : | මාරපන ඇඹුල්මීදෙනිය පාර |
| | වසම | : | නිල්මල්ගොඩ වසම |
| | දිග | : | අඩි 644 |
| | පළල | : | අඩි 10 |

*පාරේ වම්පස*

1. මාරපන පන්සල
2. ජී.ජී. ගාමිණී වීරසිංහ
3. ඩබ්.ජේ. ජයසිංහ - ලිබගහමඩිත්ත

*පාරේ දකුණු පස*

1. කේ.ජී. කරුණාරත්න
2. එච්.පී. කරුණාතිලක
3. එච්.පී. නිමල්
4. ජානක
5. ඩී. චම්පා
6. එච්.පී. ජයතිලක
7. ගුණදාස
8. ඒ.එල්. ඩේවිඩ් ලියනගේ
9. එච්.පී. ජානක
10. ඩබ්.ජේ. ජයසිංහ
11. ඩබ්. වසන්තා රංජනී-ලිබගහමඩිත්ත
12. අශෝකා නන්දනී-ලිබගහමඩිත්ත


P.P.C. Jayasena (MSI)
Licensed Surveyor , Leveller
& Court Commissioner
Higgoda
Undugoda
Telephone No: 035-2278728
LSC Reg. No. 19991017
Plan No : 2265
To Embulmeedeniya
Limbagahemadiththa of Jayasinghe
Land of Asoka Nandani
Land of W.Wasantha Ranjani
Land of Jayasinghe
Land of G.G.Gamini Weeravansa
Land of H.P.Janaka
Land of David Liyanage
Land of Gunadasa
Land of Marapona Temple
Already Concreted
Land of Jayathilaka
Land of Champa
Land of Janaka
Land of M.P.Nimal
Land of H.P.Nimal
Land of Karunarathna
Land of Karunathilaka
From Marapona Road To Pitiduwa
Length of the Road A-B | 206 M | 644ft.
Width of Road A-B | 3.125 M | 10 ft.
Scale :- 1:2000
PLAN
Shown "Marapona - Embulmeedeniya Road" Situated at Embulmeedeniya
Village ( in No 50A Nilmalgoda GS Division of Kegalle Secretariat
Division within the Pradeseeya Sabha Area of Kegalle) in Mawatha Paththu of
Paranakuru Korale, Kegalle District
SABARAGAMUWA PROVINCE
Reference:-
ST- Stake
SF- Stone Fence
CP - Concreet Post
Bounded as described above
Date of Survey:- 2017.01.13
Licensed Surveyor
2017.02.20
P. P. C. Jayasena
Licensed Surveyor
Leveller & Court Commissioner
Reg. No. 19991017

| | | | |
|---|---|---|---|
| 02 | පාරේ නම | : | දෙමටගොල්ල සිට තැඹිලිහේන්පිට දක්වා මාර්ගය |
| | වසම | : | 54 B හපුවිට පල්ලේගම වසම |
| | දිග | : | අඩි 640 |
| | පළල | : | අඩි 8 |

*පාරේ වම්පස*

1. කේ.ඩී. ගාමිණි වීරසිංහ - දෙමටගොල්ල
2. කේ.ඩී. ආනන්ද - තැඹිලිහේනපිට
3. එච්.පී. අමරසිංහ - තැඹිලිහේනපිට
4. එච්.පී. ආතර් - තැඹිලිහේනපිට

*පාරේ දකුණු පස*

1. කේ.ඩී. පුංචිමලි - දෙමටගොල්ල
2. කේ.ඩී. ප්‍රේමතිලක - දෙමටගොල්ල
3. කේ.ඩී. සුනිල් ප්‍රේමරත්න - දෙල්ගහමුලහේන
4. එච්.පී. ප්‍රේමදාස - තැඹිලිහේනපිට
5. එච්.පී. රණසිංහ - තැඹිලිහේනපිට

P.P.C. Jayasena (MSI)
Licensed Surveyor , Leveller
& Court Commissioner
Higgoda
Undugoda
Telephone No: 035-2278728
LSC Reg. No. 19991017

Plan No :2507




Note:-
Road Shown in red is the Proposed part

Scale :- 1:1000

PLAN

Shown , Dematagolla Adipara From Moronthota - Kehelwaththe Road, Situated at Hapuwita Pallegama Village (in No 54B Hapuwita Pallegama GS Division of Kegalle Secretariat Division within the Pradeseeya Sabha Area of Kegalla) in Kanduaha Paththu of Paranakuru Korale, Kegalle District

SABARAGAMUWA PROVINCE

| | | |
|---|---|---|
| Length of the Road | 200 M | 640 ft |
| Width of Road | 2.50 M | 8 ft |

Bounded as described above

Date of Survey:- 2014.07.20

සැබෑ පිටපතකි.
..............................
ලේකම්
කෑගල්ල ප්‍රාදේශීය සභාව

Licensed Surveyor
2017.09.19

P. P. C. Jayasena
Licensed Surveyor
Leveller & Court Commissioner
Reg. No. 19991017

| | | | |
|---|---|---|---|
| 03 | පාරේ නම | : | මල්වත්තකන්ද බෝධිය අසලින් දිවෙන මාර්ගයේ පාලම අසලින් ඇති පාර |
| | වසම | : | ඇවුණුගල්ල වසම |
| | දිග | : | අඩි 114 |
| | පළල | : | අඩි 10 |

| *පාරේ වම්පස* | *පාරේ දකුණුපස* |
|---|---|
| 1. දිවෙල ඔය රක්ෂිතය | 1. දිවෙල ඔය රක්ෂිතය |

## සංවර්ධනය කරගැනීමට යෝජිත රජයට අයත් රක්ෂිතයට අයත් මාර්ග කොටස දැක්වෙන මැනුම් අනුරේඛනය

කෑගල්ල ප්‍රාදේශීය ලේකම්ගේ අංක 100/05/03/02/4-11 සහ 2013-10-31 දිනැති ලිපිය හා සැඳේ.

ගම — ඇඹිරියගල
ප්‍රා.ලේ.කොට්ඨාශය — කෑගල්ල
දිස්ත්‍රික්කය — කෑගල්ල
පළාත — සබරගමුව




යොමුව:-
ග — මායිම් ගල
පැවැ — පැල වැට
මාර්ග (ප්‍රා.ස) — මාර්ග (ප්‍රාදේශීය සභා)

සැලසුම් සටහන්
ලේකම්
කෑගල්ල ප්‍රාදේශීය සභාව

පරිමාණය 1:1000

| අනුරේඛනයේ කැබලි අංකය | ඉඩමේ නම | විස්තරය | බිම් ප්‍රමාණය හෙක්. | අ. | රූ. | ප. | හිමිකම් කියන අය | වෙනත් කිවයුතු කරුණු |
|---|---|---|---|---|---|---|---|---|
| A | බඩගොරස්සේ වත්ත | විවෘත භූමිය (මාර්ගය) | 0.01063 | 0 | 0 | 04.20 | රජය | මූලික පිඹුරු A 82 හි කැබලි අංක 2 හි කොටසකි. දිමෙල ඔය දිගේ වෙන්කල රක්ෂිත බිම - රජය. අඩි 10 පළල මාර්ග කොටස මාර්ගය සංවර්ධන කටයුතු සඳහා ප්‍රාදේශීය සභාවට පැවරීම සඳහා. |
| | | එකතුව | 0.01063 | 0 | 0 | 04.20 | | |

මැනීම කළ දිනය:- 2017-09-28

එච්.ටී.ආර්. නාලිකා පියසේන
ප්‍රාදේශීය ලේකම්
කෑගල්ල

මැනීම හා ඇඳීම:-
එස්.එම්.ටී.කේ. සේනානායක
රජයේ/වු.කො.වූ. මිනින්දෝරු
ස.වු.කො. කාර්යාලය ගලිගමුව
2017-11-30

04 මාර්ගයේ නම : පුවක්දෙනිය හත්පෙත්තාව මාර්ගයේ සිට අම්බලන්පිටිය දක්වා මාර්ගය

වසම : දිඹුල්ගමුව වසම

දිග : අඩි 128.5

පළල : අඩි 08

| *පාරේ වම්පස* | *පාරේ දකුණු පස* |
|---|---|
| 1. එච්.පී. කුලතුංග - මොරගහදෙනිය කුඹුරු ඉඩම | 1. එච්.පී. කුලතුංග - මොරගහදෙනිය කුඹුර ඉඩම |
| 2. ආර්.පී. සෝමපාල | 2. එච්.පී. ගුණතිලක - අම්බලන්පිටිය වත්ත |
| 3. යූ.ජී. ජයසේන | 3. එච්.පී. කුලතුංග |

T.B.S.Sangarandeniya
Registered Licd. Surveyor & Leveller
No. 61/A ,Weralugasanga,
Dabakotuwa,
Kengalla.

Plan No. 11906




**Reference**

St - Stake
M - Mark
EB - Earth Bank
LF - Wire Live Fence
SF - Stone Fence
RW - Retaining Wall
Road(PS) - Road (Pradeshiya Saba)

SCALE :- 1 : 500

# PLAN

Of

An Allotment of land called ' Ambalapitiyewatta '
Situated In Dimbulgamuwa Village
Within 14 B Dimbulgamuwa Grama Niladari Division
In Kegalle Divisional Secretariat Area
In Deyala Dahamunu Pattuwa of Kinigoda Korale

## KEGALLE DISTRICT
## SABARAGAMUWA PROVINCE

සැබෑ පිටපතකි.
ලේකම්
කෑගල්ල ප්‍රාදේශීය සභාව

| Lot No | Extent | | | Hectares | Remarks |
|---|---|---|---|---|---|
| | A | R | P | | |
| 1 | 0 | 0 | 03.70 | 0.0094 | Reserved For Road ( Wide 8 Feet, Length 128.5 feet ) |

Bounded as described above

Surveyed on: 24-05-2018

T.B.S. SANGARANDENIYA
Registered Licensed Surveyor

| | | | |
|---|---|---|---|
| 05 | පාරේ නම | : | ඇකිරියගල ප්‍රාදේශීය සභා මාර්ගය නොහොත් පාසල් මාවතෙන් හැරී යන පළමු පටුමග |
| | වසම | : | ඇකිරියගල |
| | දිග | : | අඩි 478 |
| | පළල | : | අඩි 08 |

| *වම්පස* | *දකුණු පස* |
|---|---|
| 1. ටී.ඒ. පොඩිනිලමේ - ගලගාවවත්ත | 1. ජේ.ඒ.කේ. බංඩාර තිබ්බටුමුණුව - හිටිනාවත්ත |
| 2. ටී.ඒ. ජයතිලක - ගලගාවවත්ත | |
| 3. ටී.ඒ.කේ.එස්. තිබ්බටුමුණුව - ගලගාවවත්ත | |

A.B.Wasalatantri,
Licensed Surveyor,
Leveller and Valuer,
Kegalla.

PLAN NO: 2280




Reference
WF - Wire fence
CP - Cement post
B - Bank
LF - Live fence
St - Stake
(PS) - Pradeshiya Sabha

Scale : 1 : 1000

— PLAN —

of Proposed 8' wide Means of Access
from Ekiriyagala Pradeshiya Sabha Road to Houses
(3' wide extension to the 5' wide Existing Foot Path)
Situated in the Village of Ekiriyagala
In Mawatha Pattu of Paranakuru Korale
— Kegalla District —
SABARAGAMUWA PROVINCE

Gazette

2018

Containing in Extent:

| Lot No: | Hectares | A. R. P. | Remarks |
|---|---|---|---|
| 1 | 0.01098 | 0. 0. 04.34 | The Road marked A-B 5' wide Means of access with 3' extension |
| 2 | 0.00683 | 0. 0. 02.70 | The Road marked B-C 5' wide Means of access with 3' wide extension |
| 3 | 0.00488 | 0. 0. 01.93 | The Road marked C-D 5' wide Means of access with 3' wide extension (1½' wide each both side) |
| 4 | 0.01244 | 0. 0. 04.92 | The Road marked D-E 5' wide Means of access with 3' wide extension (½' wide from Rubber land and 2½' wide Galwalagawawatta) |
| Total | 0.03513 | 0. 0. 13.89 | |

| DISTANCE OF PROPOSED ROAD | |
|---|---|
| SECTION | DISTANCE |
| A – B | 46.0 m ( 151 Ft.) |
| B – C | 28.6 m ( 94 Ft.) |
| C – D | 31.8 m ( 104 Ft.) |
| D – E | 39.4 m ( 129 Ft.) |
| TOTAL | 145.8 m ( 478 Ft.) |

Note:
Proposed extension showing in Red lines.
Bounded as described above.

Surveyed on: 09. 06. 2018

Licensed Surveyor

A. B. WASALATHANTRI.
Licened Surveyor, Leveller
& Court Commissioner
KEGALLA.

සැබෑ පිටපතකි.

..............................
ලේකම්
කෑගල්ල ප්‍රාදේශීය සභාව

10-267

# අතුරු ව්‍යවස්ථා

## ඝන අපද්‍රව්‍ය කළමනාකරණය පිළිබඳ අතුරු ව්‍යවස්ථාව කාත්තාන්කුඩි නගර සභාව

මින් මතු නගර සභාව ලෙස හඳුන්වනු ලබන කාත්තාන්කුඩි නගර සභා සීමාවන් ඇතුළත ප්‍රසිද්ධ ස්ථානයන්හි, පෞද්ගලික පරිශ්‍රයන්හි, වීදිවල, මංමාවත්වල ජනනය වන ඝන අපද්‍රව්‍ය වෙන්කිරීම, ගබඩා කිරීම, එක්රැස් කිරීම, ප්‍රවාහනය කිරීම, සැකසීම, පිරියම් කිරීම හා බැහැර කිරීම නියාමනය කිරීම, අධීක්ෂණය කිරීම, පරීක්ෂා කිරීම හා පාලනය කිරීම සඳහා වූ අතුරු ව්‍යවස්ථාවකි.

නගර සභා ආඥාපනතේ (255 පරිච්ඡේදය) 157 හා 118 (ආ) සහ (ඇ) වගන්තියේ විධිවිධාන හා (IX) උප වගන්තිය සමග කියවිය යුතු 153 දරන වගන්තියට අනුව කාත්තාන්කුඩි නගර සභාව විසින් සම්පාදනය කරන ලද මෙම අතුරු ව්‍යවස්ථාව එකී නගර සභාවේ 28.06.2018 දිනැති රැස්වීමේ අංක 2018/98 දරන තීරණයට අනුව පනවනු ලැබේ.

එස්. එච්. එම්. අස්ෆර්,<br>
නගර සභාව,<br>
කාත්තාන්කුඩි.

2018 ජුනි මස 29 වැනි දින,<br>
නගර සභා කාර්යාලය,<br>
කාත්තාන්කුඩි.

| පොදු : | | |
|---|---|---|
| 01. | | මෙම අතුරු ව්‍යවස්ථා ඝන අපද්‍රව්‍ය කළමනාකරණය පිළිබඳ අතුරු ව්‍යවස්ථා ලෙස සඳහන් කරනු ලැබේ. |
| 02. | | මෙම අතුරු ව්‍යවස්ථාවේ නගර සභා සීමාවන් ඇතුළත ප්‍රසිද්ධ ස්ථානයන්හි, පෞද්ගලික පරිශ්‍රයන්හි, වීදිවල, මංමාවත්වල ජනනය වන ඝන අපද්‍රව්‍ය වෙන් කිරීම, ගබඩා කිරීම, එක්රැස් කිරීම, ප්‍රවාහනය කිරීම, මාරු කරන ස්ථාන ක්‍රියාත්මක කිරීම හා පවත්වාගෙන යාම, සැකසීම, පිරියම් කිරීම හා බැහැර කිරීම සම්බන්ධයෙන් වන නියාමනය, අධීක්ෂණය, පරීක්ෂාව හා පාලනය සඳහා මෙම අතුරු ව්‍යවස්ථාව පනවනු ලැබේ. |
| 03. | | නගර සභා බල ප්‍රදේශය තුළ පිහිටි යම් පරිශ්‍රයක සෑම හිමිකරුවෙක් ම හෝ පදිංචිකරුවෙක් ම තම පරිශ්‍රය අපද්‍රව්‍ය වලින් තොර සෞඛ්‍ය සම්පන්න හා ප්‍රසන්න තත්ත්වයෙන් තබා ගත යුත්තේ ය. |
| 04. | | මෙම අතුරු ව්‍යවස්ථාවේ විධිවිධානවලට යටත්ව නගර සභා ප්‍රදේශයේ පිහිටි යම් පරිශ්‍රයක හිමිකරු හෝ පදිංචිකරු තම පරිශ්‍රය ඇතුළත ජනනය වන්නා වූ අපද්‍රව්‍ය එක්රැස් කිරීම, වෙන්කිරීම, ගබඩා කිරීම, ප්‍රවාහනය කිරීම හා බැහැර කිරීම හෝ එසේ කිරීමට හේතු විය යුත්තේ ය. |
| 05. | (i) | පරිශ්‍රයක සෑම හිමිකරුවෙක් ම හෝ පදිංචිකරුවෙක් ම තමාගේ පරිශ්‍රය තුළ ජනනය වන්නා වූ ඝන අපද්‍රව්‍ය දෛනිකව නැතිනම් ඊට වඩා අඩු කාලාන්තරයෙන් අතුගෑමෙන් හෝ වෙනත් ක්‍රමයක් භාවිතා කරමින් හෝ එක් රැස් කළ යුත්තේ ය. |
| | (ii) | සෑම හිමිකරුවෙක් ම හෝ පදිංචිකරුවෙක් ම එක්රැස් කරනු ලැබූ අපද්‍රව්‍ය මෙම අතුරු ව්‍යවස්ථාවේ පූර්වගාමී උප වගන්තිය සහ මින් මතු විස්තර වන විධිවිධානවලට යටත්ව වෙන් කිරීම හෝ එසේ කිරීමට හේතු විය යුත්තේ ය. |
| | (iii) | මින් මතු අතුරු ව්‍යවස්ථා 8 සිට 20 දක්වා විස්තර කර ඇති ආකාරව කිසියම් හිමිකරුවකු හෝ පදිංචිකරුවකු විසින් අපද්‍රව්‍ය ගබඩා කිරීම හෝ මුදාහැරීම සඳහා භාවිතා කරනු ලබන යම් මල්ලක්, උරයක්, විශාල බඳුනක් හෝ වෙනත් බහාලුමක් හොඳ තත්ත්වයෙන් නඩත්තු කරනු ලැබිය යුතු අතර ඒවා ඉරී, සිදුරුවී, කැඩී හෝ එක දිගට තෙතමනයට නිරාවරණය වීම නිසා මොලොක් වී හෝ වෙන යම් හේතුවක් නිසා සාධාරණ ලෙස පරිහරණය කරන විට කඩා වැටීමට හෝ බිඳී යාමට හැකි තත්ත්වයේ තිබේ නම් එක්රැස් කරනු ලැබීම පිණිස භාවිතා නොකළ යුතු අතර නගර සභාව එවැනි යම් මල්ලක්, උරයක්, විශාල බඳුනක් හෝ වෙනත් බහාලුමක් කලින් කලට සභාව විසින් ලබා ගන්නා වූ තීරණය අනුව සහනාධාර ක්‍රමය යටතේ ලබාදිය හැකි ය. |
| | (iv) | හිමිකරුට හෝ පදිංචිකරුට නගර සභාව විසින් කලින් කලට ප්‍රසිද්ධ කරනු ලබන ක්‍රියාපටිපාටි සහ කාලසටහන අනුව එක්රැස් කරනු ලැබූ අපද්‍රව්‍ය බැහැර කළ හැක. |

| | | |
|---|---|---|
| | (v) | හිමිකරුවන්, පදිංචිකරුවන්, අමුත්තන්ගේ සහ අසල්වැසියන්ගේ සෞඛ්‍ය හෝ එම ප්‍රදේශයේ සනීපාරක්ෂක තත්ත්වයට හානිකර හෝ අන්තරායකාරී වන අපද්‍රව්‍ය හිමිකරු හෝ පදිංචිකරුවන් විසින් එක්රැස් කිරීම, ගබඩා කිරීම හෝ බැහැරලීම නොකළ යුත්තේය. |
| | (vi) | උපවගන්ති 10, 11, 12, 13, 15, 16, 17 සහ 18 යටතේ විස්තර කර ඇති හිමිකරුවන් හෝ පදිංචිකරුවන් උපලේඛනයේ සඳහන් කළ ප්‍රකාරව සේවා ගාස්තුවක් පහත සඳහන් ආකාරයෙන් 01 ගෙවිය යුතුය. |
| | (vii) | උපවගන්ති 08, 09 සහ 19 යටතේ විස්තර කර ඇති හිමිකරුවන් හෝ පදිංචිකරුවන් හිමිකරුට උපලේඛනයේ සඳහන් කළ ප්‍රකාරව සේවා ගාස්තුවක් පහත සඳහන් ආකාරයෙන් 02 ගෙවිය යුතුය. |
| 06. | (i) | කිසියම් තැනැත්තෙක්, වීදියකට, පාරකට, මංමාවතකට, පටු මාවතකට, මාවතකට හෝ වෙනත් පොදු ස්ථානයකට හෝ පරිශ්‍රයකට හෝ කාණුවකට හෝ ජල මාර්ගයකට හෝ ජලාශයකට හෝ මුහුදට අපද්‍රව්‍ය මුදාහැරීම නොකළ යුත්තේ ය. |
| | (ii) | කිසියම් තැනැත්තෙක් විවෘත භූමියක අපද්‍රව්‍ය පිළිස්සීමෙන් පරිසරයට හානි නොකළ යුත්තේ ය. |
| | (iii) | කිසියම් හිමිකරුවෙක් හෝ පදිංචිකරුවෙක් යම් අපද්‍රව්‍ය වර්ගයක්, මුදාහැරීම, පිරියම් කිරීම, සැකසීම හෝ බැහැරලීම සඳහා අංක 7 දරන අතුරු ව්‍යවස්ථාවේ විධිවිධාන ප්‍රකාර අවසර ලබා නොමැතිනම් එවැනි අපද්‍රව්‍ය බලයලත් අපද්‍රව්‍ය එක්රැස් කරන්නෙකුට භාරදිය යුතු ය. |
| | (iv) | අංක 7 දරන අතුරු ව්‍යවස්ථාවේ විධිවිධානවලට යටතේ සැකසීම, පිළියම් කිරීම හෝ බැහැරලීම නොකරනු ලැබූ යම් අපද්‍රව්‍ය ඉහත (iii)හි විධිවිධාන වලට යටත්ව බලයලත් අපද්‍රව්‍ය එක්රැස් කරන්නෙකු විසින් එක්රැස් නොකරන ලද අවස්ථාවක දී එවැනි අපද්‍රව්‍ය අංක 8 සිට 20 දක්වා වන අතුරු ව්‍යවස්ථාවල විධිවිධානවලට අනුකූලව ඉවත් කරනු ලැබිය යුත්තේ ය. |
| 07. | (i) | කිසියම් හිමිකරුවෙකු හෝ පදිංචිකරුවෙකු පහත දැක්වෙන අවස්ථාවන් හැර අපද්‍රව්‍ය තම පරිශ්‍රය ඇතුළතම බැහැර කළ හැකි ය.<br>(අ) නගර සභාව විසින් එවැනි ප්‍රදේශයන් අපද්‍රව්‍ය බැහැරලීම තහනම් කර ඇති ප්‍රදේශයක් ලෙසට ප්‍රකාශයට පත් කිරීම; හෝ<br>(ආ) නගර සභාව විසින් කිසියම් නිශ්චිත අපද්‍රව්‍ය බැහැර කිරීමට තහනම් කරන ලද ප්‍රදේශයක් ලෙසට ප්‍රකාශයට පත් කිරීම. |
| | (ii) | කිසියම් පරිශ්‍රයක හිමිකරුවන් හෝ පදිංචිකරුවන් නගර සභාව විසින් අනුමත කරන ලද ප්‍රමිතියට අනුකූලව ඉදිකරනු ලැබූ දාහකයක හෝ පෝරණුවක පිළිස්සිය හැකි ය. නැතිනම් නගර සභාවේ ලේකම්වරයාගේ අනුමැතිය පරිදි අපද්‍රව්‍ය පිරියම් කිරීම, සැකසීම හෝ වැළලීම කළ හැකි ය. |
| | (iii) | හිමිකරු හෝ පදිංචිකරු තම පරිශ්‍රය තුළ ජනනය වන අපද්‍රව්‍ය නගර සභාව විසින් අනුමත කරන ලද ආකාරයට සැකසීම හෝ පිරියම් කිරීම හෝ කළ යුත්තේය. එසේ නොමැතිනම් නගර සභාව විසින් කලින් කලට තීරණය කරනු ලබන පරිදි නියමිත ගාස්තුවක් ගෙවීම මත නගර සභා අපද්‍රව්‍ය එක්රැස් කරන්නාට භාරදිය යුත්තේය. |
| | (iv) | යම් තැනැත්තෙක් නගර සභා ලේකම්ගේ එකඟතාවය මත ඔහුගේ පරිශ්‍රයේ හෝ වීදියක හෝ මංමාවතක යාබදව පිහිටි යම් ගසක් හෝ ගසක කොටසක් හෝ යම් පැළෑටියක් කපන්නේ නම් එවැනි අපද්‍රව්‍ය නගර සභා අපද්‍රව්‍ය එක්රැස් කරන්නාට භාර දිය යුත්තේ ය. නගර සභා ලේකම් විසින් තීරණය කරනු ලබන සේවා ගාස්තුවක් ඉවත් කරනු ලබන අපද්‍රව්‍ය ප්‍රමාණය මත නගර සභාවට ගෙවිය යුත්තේ ය. |

| | | |
|---|---|---|
| | (v) | සෑම තැනැත්තෙක්ම තමාගේ පාලනය යටතේ සිටින යම් සතෙකු වීදියක, මංමාවතක හෝ පොදු ස්ථානයක මළපහ කිරීම වැළැක්වීමට පියවර ගත යුත්තේය. එසේ මළපහ කරනු ලැබුවහොත් අංක 08 සිට 20 දක්වා වන අතුරු ව්‍යවස්ථාවලට අනුකූලව එය පවිත්‍ර කොට බැහැරලීම ඒ තැනැත්තාගේ වගකීම වන්නේය. |
| | (vi) | කිසිම තැනැත්තෙක් නගර සභා බල ප්‍රදේශය තුළ කුමන වර්ගයක හෝ අපද්‍රව්‍යයක් වාහනයක සිට වීදියකට, මංමාවතට, පොදු ස්ථානයකට මුදාහැරීම හෝ එහි තැන්පත් කිරීම හෝ නොකළ යුත්තේ ය. |
| | (vii) | නිවෙසක් හෝ කිසියම් ඉදිකිරීමක් හෝ අලුත්වැඩියා කිරීමට නගර සභාවට අයදුම් කරන යම් කෙනෙක් එවැනි ඉදි කරන කාල වකවානුව තුළ තමාගේ ජනනය වන ඝන අපද්‍රව්‍ය ගබඩා කිරීම, පිරියම් කිරීම, මුදා හැරීම, සැකසීම හා බැහැරලීම සම්බන්ධ න්‍යාය අයදුම්පත්‍රයේ ඇතුළත් කළ යුත්තේ ය. |
| | | **නිවාස පරිශ්‍රයන් :** |
| 08. | (i) | සෑම හිමිකරුවෙක්ම හෝ පදිංචිකරුවෙක්ම තම පරිශ්‍රය තුළ එකතු වන අපද්‍රව්‍ය අතුගෑමේ හෝ වෙනත් ක්‍රමයකින් පහත දැක්වෙන පරිදි වෙන් කළ යුත්තේ ය.<br><br>(අ) ආහාර අපද්‍රව්‍ය හා වෙනත් ජෛව ජීර්ණනීය අපද්‍රව්‍ය,<br>(ආ) ප්‍රතිභාවිතාකරණීය හා ප්‍රතිචක්‍රීකරණීය අපද්‍රව්‍ය,<br>(ඇ) අවශේෂමය අපද්‍රව්‍ය,<br>(ඈ) සුවිශේෂී අපද්‍රව්‍ය. |
| | (ii) | සෑම හිමිකරුවෙක් ම හෝ පදිංචිකරුවෙක් ම එසේ වෙන් කරනු ලැබූ අපද්‍රව්‍ය වෙන වෙනම මලුවලට බඳුන්වලට හෝ වෙනත් බහාලුම්වලට දැමිය යුතු අතර, ඒවා ඉවත් කරනු ලබන තෙක් ඒ සඳහා වෙන්කර ඇති ස්ථානයක තැබිය යුත්තේ ය. (i) ඡේදය (අ) සහ (ආ) වලින් සඳහන් සියලු අපද්‍රව්‍ය මීයන්, කෘමීන් හා අනෙකුත් සතුන් ඇතුලුවීම වළකමින් නිසි පරිදි වසනු ලැබූ බහාලුමක තැබිය යුත්තේ ය. සතුන්ගේ මළකුණු, ශරීර කොටස් හෝ අසූචි ආශ්‍රිත අපද්‍රව්‍ය වහා නගර සභා අපද්‍රව්‍ය එක්රැස් කරන්නෙකුට භාරදිය යුත්තේ ය. |
| | (iii) | සෑම හිමිකරුවෙකුටම හෝ පදිචිකරුවෙකුටම (i) ඡේදයේ (අ) සහ (ආ) ආයිතමයන්හි විශේෂයෙන් සඳහන් කර ඇති අපද්‍රව්‍ය වර්ග බලයලත් අපද්‍රව්‍ය එක්රැස් කරන්නෙකුට භාරදිය හැකිය. හිමිකරුට හෝ පදිංචිකරුට එසේ කිරීමට අතපසු වන්නේ නම් තමා (ඇ) සහ (ඈ) අයිතමයේ සඳහන් කර ඇති අපද්‍රව්‍ය වර්ගය ද සමග අදාළ අපද්‍රව්‍ය නගර සභාවේ අපද්‍රව්‍ය එක්රැස් කරන්නන්ට භාරදිය යුතු ය. |
| 09. | (i) | කුලී නිවැසියන් ගණනාවක් සහිත බහු මහල් ගොඩනැගිල්ලක සෑම අයිතිකරුවෙක්ම හෝ පදිංචිකරුවෙක්ම ඔවුන්ගේ අපද්‍රව්‍ය පහත දැක්වෙන අයුරු තෝරා වෙන් කිරීමට හේතු විය යුත්තේ ය.<br><br>*(අ)* ආහාර අපද්‍රව්‍ය හා වෙනත් ජෛව ජීර්ණනීය අපද්‍රව්‍ය,<br>*(ආ)* ප්‍රතිභාවිතාකරණීය හා ප්‍රතිචක්‍රීකරණීය අපද්‍රව්‍ය,<br>*(ඇ)* අවශේෂමය අපද්‍රව්‍ය,<br>*(ඈ)* සුවිශේෂී අපද්‍රව්‍ය. |
| | (ii) | (i) වැනි ඡේදය නිශ්චිතව සඳහන් කර ඇති ගොඩනැගිල්ලක පදිංචිකරු නගර සභාව විසින් අනුමත කරන ලද ප්‍රමිතීන්ට හා පිරිවිතරයන්ට අනුකූලව බඳුන් හෝ බහාලුම් තමන් සතුව තබා ගත යුතු අතර ඒවා සනීපාරක්ෂක තත්ත්වයෙන් නඩත්තු කළ යුතුය. |
| | (iii) | (i) වැනි උපවගන්තියේ දක්වා ඇති ගොඩනැගිල්ලක හිමිකරු හෝ පදිංචිකරු (i), (ii) වැනි උපවගන්තියේ විධිවිධානවලට අනුකූල වීමට අතපසු අවස්ථාවක දී එම ගොඩනැගිල්ලේ පදිංචිකරුවෙකුට අදාල බඳුන් හෝ බහාලුම් නියමිත දිනයක දී හෝ ඊට පෙර තමන් සතුව තබා ගැනීමට උපදෙස් දීම හෝ පදිංචිකරුවන් එලෙස ක්‍රියා කිරීමට හේතු වීමට අයිතිකරුවන්ට උපදෙස් දීම නගර සභාවට කාර්යභාරය විය යුතු අතර එම උපදෙස් අනුව ක්‍රියාකිරීම හිමිකරුවන්ට හෝ පදිංචිකරුවන්ට තමන්ගේ යුතුකම විය යුතුය. |

| | | |
|---|---|---|
| | (iv) | ගොඩනැගිල්ලේ බිමක හෝ මහලක හිමිකරු හෝ පදිංචිකරු වෙන් කරන ලද අපද්‍රව්‍ය ඒ සඳහා තබා ඇති අදාළ බඳුනකට හෝ බහාලුමකට දැමිය යුතුය. |
| | (v) | මෙම අතුරු ව්‍යවස්ථාවේ (i) වැනි උපවගන්තියේ (අ) සහ (ආ) අයිතමයන්හි සඳහන් කරනු ලැබ ඇති අපද්‍රව්‍ය වර්ග ඉවත් කිරීම බලයලත් එක්රැස් කරන්නෙකුගේ රාජකාරිය වන්නේ ය. එසේ ඉවත් කරනු නොලැබූ යම් අපද්‍රව්‍ය (ඇ) සහ (ඈ) අයිතමයන්හි සඳහන් කර ඇති අපද්‍රව්‍ය වර්ග සමග නගර සභා අපද්‍රව්‍ය එක්රැස් කරන්නෙකුට භාරදිය යුත්තේ ය. |
| | | **සාප්පු හා කාර්යාල** |
| 10. | (i) | සාප්පුවක හෝ කාර්යාලයක සෑම හිමිකරුවෙක්ම හෝ පදිංචිකරුවෙක් ම එක් එක් සංකීර්ණයේ එකතු වන අපද්‍රව්‍ය පහත දැක්වෙන ආකාරයට වෙන් කළ යුත්තේ ය.<br>*(අ)* ආහාර අපද්‍රව්‍ය හා වෙනත් ජෛව ජීර්ණනීය අපද්‍රව්‍ය,<br>*(ආ)* ප්‍රතිභාවිතාකරණීය හා ප්‍රතිචක්‍රීකරණීය අපද්‍රව්‍ය,<br>*(ඇ)* අවශේෂමය අපද්‍රව්‍ය,<br>*(ඈ)* සුවිශේෂී අපද්‍රව්‍ය. |
| | (ii) | වෙන් කරනු ලැබූ අපද්‍රව්‍ය ඉවත් කරනු ලබන තුරු වෙන් වෙන් වශයෙන් බඳුන්වලට හෝ බහාලුම්වලට දමා සුදුසු ස්ථානයක ගබඩා කරනු ලැබිය යුත්තේ ය. |
| | (iii) | සාප්පුවක හෝ කාර්යාලයක හිමිකරුට හෝ පදිංචිකරුට මෙම අතුරු ව්‍යවස්ථාවේ (i) වැනි උපවගන්තියේ (අ), (ආ), (ඇ) සහ (ඈ) අයිතමයන්හි සඳහන් කරනු ලැබ ඇති අපද්‍රව්‍ය වර්ග බලයලත් අපද්‍රව්‍ය එක්රැස් කරන්නෙකුට භාරදිය හැකි ය. |
| | (iv) | මහල් කිහිපයක් හා මහල් බිම් කිහිපයකින් යුක්ත සාප්පු හෝ කාර්යාල සංකීර්ණයක හිමිකරු හෝ පදිංචිකරු එක් එක් සාප්පුවකට හෝ කාර්යාලයකට අවශ්‍ය ප්‍රමාණය ලේකම් විසින් අනුමත කරන ලද ප්‍රමිතීන්ට අනුකූලව එවැනි අපද්‍රව්‍ය එක්රැස් කිරීම හෝ තැන්පත් කිරීම සඳහා අපද්‍රව්‍ය බඳුන් හෝ බහාලුම් සැපයිය යුත්තේ ය. |
| | (v) | (iv)වැනි උපවගන්තියේ දක්වා ඇති සාප්පුවක හෝ කාර්යාලයක සෑම හිමිකරුවෙක්ම හෝ පදිංචිකරුවෙක් ම වෙන් කරන ලද අපද්‍රව්‍ය වෙන් වෙන්ව බඳුන් හෝ බහාලුම් තුළට දැමීය යුතු වන්නේ ය. |
| | (vi) | මෙම අතුරු ව්‍යවස්ථාවේ (i) වැනි උපවගන්තයේ (අ), (ආ), (ඇ) සහ (ඈ) අයිතමයන්හි සඳහන්ව ඇති අපද්‍රව්‍ය බලයලත් අපද්‍රවය එක්රැස් කරන්නෙකුට භාර දීමට හැකි ය. එසේ කිරීම නොකළ හොත් එම අපද්‍රව්‍ය නගර සභාවේ අපද්‍රව්‍ය එක්රැස් කරන්නෙකුට භාරදිය යුතු ය. |
| | (vii) | අසල්වාසීන්ට හෝ එකී සාප්පුවේ හෝ කාර්යාලයේ සේවයේ නියුතු තැනැත්තන්ට යම් සෞඛ්‍ය හෝ සනීපාරක්ෂක ගැටළුවක් ඇති නොවීම පිණිස අපද්‍රව්‍ය ඉවත් කිරීමත් මෙම අතුරු ව්‍යවස්ථාවේ නියම කර ඇති අපද්‍රව්‍ය බඳුන් හෝ බහාලුම් නඩත්තු කිරීමත් යම් සාප්පුවක හෝ කාර්යාලයක සෑම හිමිකරුවෙකුගේම හෝ පදිංචිකරුවකුගේම වගකීම වන්නේ ය.<br><br>මෙම අතුරු ව්‍යවස්ථාවේ කාර්යයන් සඳහා පද සම්බන්ධය අනුව අන්‍යාර්ථයක් අවශ්‍ය වන්නේ නම්,<br><br>"පදිංචිකරු" යන්නෙන් අදහස් කෙරෙන්නේ නගර සභා ප්‍රදේශයේ සාප්පුවක හිමිකරු හෝ පදිංචිකරු හෝ ව්‍යාපාරයක හෝ කාර්යාලයක භාරකරුය.<br><br>"කාර්යාලය" යන්නට 1954 අංක 19 දරන සාප්පු සහ කාර්යාල සේවා නියුක්තියන් පිළිබඳ පනතේ දී ඇති අර්ථයම ඇත.<br><br>"සාප්පුව" යන්නෙන් අදහස් කෙරෙන්නේ තොග හෝ සිල්ලර වෙළඳාම සඳහා භාණ්ඩ තබා ඇති ස්ථානයක් වන අතර ආහාරපාන අලෙවියට තබා ඇති ස්ථානයක් සහ බාබර් සාප්පුවක් හෝ රූපලාවන්‍ය සැලෝන් එකක් පවත්වාගෙන යනු ලබන ස්ථානයක් ද ඊට ඇතුළත් වේ. |

| | | |
|---|---|---|
| | | **භෝජනාගාරය** |
| 11. | (i) | යම් භෝජනාගාර භාරකරුවෙකු හෝ ඔහු විසින් බලය දෙනු ලැබූ යම් තැනැත්තෙක් තම පරිශ්‍රයේ එක්රැස් වන අපද්‍රව්‍ය පහත දැක්වෙන ආකාරයට තෝරා වෙන් කිරීම හෝ කිරීමට හේතු විය යුත්තේ ය.<br><br>*(අ)* ආහාර අපද්‍රව්‍ය හා වෙනත් ජෛව ජීර්ණනීය අපද්‍රව්‍ය,<br>*(ආ)* ප්‍රතිභාවිතාකරණීය හා ප්‍රතිචක්‍රීකරණීය අපද්‍රව්‍ය,<br>*(ඇ)* අවශේෂමය අපද්‍රව්‍ය,<br>*(ඈ)* සුවිශේෂී අපද්‍රව්‍ය. |
| | (ii) | කිසියම් භෝජනාගාර භාරකරුවෙක්ම හෝ ඔහු විසින් බලය දෙනු ලැබූ යම් තැනැත්තෙක් වෙන් කරන ලද අපද්‍රව්‍ය ඉවත් කරනු ලබන තෙක් වෙන් වෙන් වශයෙන් යෝග්‍ය බඳුන්වල හෝ බහාලුම්වලට දමා සුදුසු ස්ථානයක ගබඩා කළ යුත්තේ ය. |
| | (iii) | කිසියම් භෝජනාගාර භාරකරුවෙක් හෝ ඔහු විසින් බලය දෙනු ලැබූ යම් තැනැත්තෙක් මැස්සන්, මීයන්, කෘමීන් හෝ යම් වෙනත් සතෙකු ඇතුළු වීම වළකමින් සියලු ආහාර අපද්‍රව්‍ය සහ ජෛව ජීර්ණීය ප්ලාස්ටික් හෝ ලෝහ ද්‍රව්‍යයකින් සාදන ලද සහ පියනක් යොදා නිසි ලෙස ආරක්ෂාකාරී කරන ලද බඳුනක හෝ වෙනත් බහාලුමක ඇසිරිය යුත්තේ ය. |
| | (iv) | (i) වැනි උප වගන්තියේ (අ), (ආ), (ඇ) සහ (ඈ) අයිතමයන්හි සඳහන් කරනු ලැබ ඇති අපද්‍රව්‍ය වර්ග බලයලත් අපද්‍රව්‍ය එක්රැස් කරන්නෙකුට භාරදිය හැකි ය. |
| | (v) | (i) වැනි උප වගන්තියේ සඳහන් කර ඇති අපද්‍රව්‍ය වර්ග, (iv) වැනි උප වගන්තිය යටතේ විස්තර වන ආකාරයට භාරදෙනු නොලැබූ විටෙක නගර සභා අපද්‍රව්‍ය එක්රැස් කරන්නෙකුට භාරදිය යුත්තේ ය.<br><br>මෙම අතුරු ව්‍යවස්ථාවේ කාර්යයන් සඳහා පද සම්බන්ධය අනුව අන්‍යාර්ථයක් අවශ්‍ය වන්නේ නම් මිස,<br><br>"භෝජනාගාරය" යන්නෙන් නිදන පහසුකම් සහිතව හෝ රහිතව මුදල් ගෙවීම මත පරිභෝජනය සඳහා ආහාරපාන හා මධ්‍යසාර සපයනු ලබන ස්ථානයක් අදහස් කෙරේ. එයට ආපනශාලාවක්, ආගන්තුක නිවාසයක්, ලැගුම්හලක්, තානායමක්, වන්දනාකරුවන්ගේ විශ්‍රාම ශාලාවක්, බත් කඩයක් හෝ භෝජනාගාරයකට සමාන ආකාරයෙන් ව්‍යාපාරයක් පවත්වාගෙන යනු ලබන යම් වෙනත් පරිශ්‍රයක් ද ඇතුළත් වේ. |
| | | **එළවළු සහ පළතුරු ගබඩා සහ වෙළඳසැල්** |
| 12. | (i) | සෑම එළවළු හේ පළතුරු ගබඩා හෝ වෙළඳසැලක හිමිකරු හෝ එය භාරව සිටින තැනැත්තා තම පරිශ්‍රයේ එක්රැස් වන අපද්‍රව්‍ය පහත දැක්වෙන ආකාරයට වෙන් කළ යුත්තේ ය.<br><br>*(අ)* ආහාර අපද්‍රව්‍ය හා වෙනත් ජෛව ජීර්ණනීය අපද්‍රව්‍ය,<br>*(ආ)* ප්‍රතිභාවිතාකරණීය හා ප්‍රතිචක්‍රීකරණීය අපද්‍රව්‍ය,<br>*(ඇ)* අවශේෂමය අපද්‍රව්‍ය,<br>*(ඈ)* සුවිශේෂී අපද්‍රව්‍ය. |
| | (ii) | මෙම අතුරු ව්‍යවස්ථාවේ (i)වැනි උපවගන්තියේ (අ) අයිතමයන්හි සඳහන් කර ඇති අපද්‍රව්‍ය වර්ග තෙතමනය කාන්දු නොවන ප්ලාස්ටික් හෝ ලෝහ ද්‍රව්‍යයකින් සාදන ලද වෙනම බහාලුමක තැබිය යුතු අතර, එය තුළට මැස්සන්, මීයන්, කෘමීන් හෝ යම් වෙනත් සතුන් ඇතුල්වීම වළකමින් නිසි ලෙස සුරක්ෂිත කර වෙන වෙනම තැබිය යුත්තේ ය. අනෙකුත් අපද්‍රව්‍ය සුදුසු යම් බඳුනකට හෝ වෙනත් බහාලුමකට හෝ දැමිය යුත්තේ ය. |

| | | |
|---|---|---|
| | (iii) | මෙම අතුරු ව්‍යවස්ථාවේ (i) වැනි උපවගන්තියේ (අ), (ආ), (ඇ) සහ (ඈ) අයිතමයන්හි සඳහන් කර ඇති අපද්‍රව්‍ය වර්ග බලයලත් අපද්‍රව්‍ය වර්ග එක්රැස් කරන්නෙකුට භාරදිය හැකි ය. එසේ භාරදෙනු නොලැබූ යම් අපද්‍රව්‍ය වර්ගයක් නගර සභා බල ප්‍රදේශයේ එක්රැස් කරන්නෙකුට භාරදිය යුත්තේ ය.<br><br>මෙම අතුරු ව්‍යවස්ථාවේ කාර්යයන් සඳහා පද සම්බන්ධය අනුව අර්ථයක් අවශ්‍ය වන්නේ නම් මිස,<br><br>"එළවළු හා පළතුරු ගබඩා සහ වෙළඳසැල්" යන්නෙන් අදහස් කරන්නේ එළවළු හා පළතුරු ගබඩා කර ඇති හෝ විකිණීමට තබා ඇති ස්ථානයකි. |
| | | **මාළු, කුකුල් මස් හෝ බිත්තර වෙළඳ කුටි** |
| 13. | (i) | කුකුල් මස්, මාළු හෝ බිත්තර අලෙවි කිරීම සඳහා ඇති කුටියක හිමිකරු හෝ එම ව්‍යාපාර කරගෙන යන අය හෝ ඔවුන්ගේ අපද්‍රව්‍ය පහත දැක්වෙන ආකාරයට තෝරා වෙන් කළ යුත්තේ ය :-<br><br>(අ) මිනිස් පරිභෝජනයට නුසුදුසු සත්ව මළකුණු හෝ මළකුණුවල කොටස් හෝ බිත්තර,<br>(ආ) ප්‍රතිභාවිතාකරණීය හා ප්‍රතිචක්‍රීකරණීය අපද්‍රව්‍ය,<br>(ඇ) අවශේෂමය අපද්‍රව්‍ය,<br>(ඈ) සුවිශ්ෂී අපද්‍රව්‍ය. |
| | (ii) | මෙම අතුරු ව්‍යවස්ථාවේ (i) වැනි උපවගන්තියේ (අ) හි සඳහන් අපද්‍රව්‍ය වෙනම බහාලුමක තැබිය යුතු අතර (ආ), (ඇ) හා (ඈ) හි සඳහන් කර ඇති අපද්‍රව්‍ය සුරක්ෂිතව පරිසරයට නිරාවරණය නොවන පරිදි මැස්සන්, මීයන්, කෘමීන් හෝ යම් වෙනත් සතුන් ඇතුල් නොවන ලෙස වෙන වෙනම භාජනයක හෝ බහාලුමක තබාගත යුතු ය. |
| | (iii) | මෙම අතුරු ව්‍යවස්ථාවේ (i) වැනි උපවගන්තියේ (අ) අයිතමයන්හි සඳහන් කර ඇති අපද්‍රව්‍ය වර්ග අවසරලත් අපද්‍රව්‍ය වර්ග එක්රැස් කරන්නෙකුට භාරදිය හැකි ය. එසේ භාරදෙනු නොලැබූ යම් අපද්‍රව්‍ය වර්ගයක් මෙම අතුරු ව්‍යවස්ථාවේ (ආ), (ඇ) සහ (ඈ) අයිතමයන්හි සඳහන් කර ඇති අපද්‍රව්‍ය වර්ග ද සමග නගර සභාව විසින් කලින් කලට තීරණය කරනු ලබන පරිදි ගාස්තුවක් ලේකම්වරයාට ගෙවීම මත දුර්ගන්ධන පැතිරයාමට පෙර නගර සභා එක්රැස් කරන්නෙකුහට භාරදිය හැක්කේ ය.<br><br>මෙම අතුරු ව්‍යවස්ථාවේ කාර්යයන් සඳහා පද සම්බන්ධය අනුව අර්ථයක් අවශ්‍ය වන්නේ නම් මිස,<br><br>"මාළු, කුකුල් මස් හෝ බිත්තර වෙළඳ කුටියන්හි" යන්නෙන් එවැනි ද්‍රව්‍යයන් ගබඩා කරන ස්ථාන හෝ විකිණීම සඳහා ගබඩා කරන ස්ථානයන් අදහස් කෙරේ. |
| | | **පදික වෙළඳාම** |
| 14. | (i) | නගර සභාව විසින් ලබා ගන්නා ලද ලිඛිත බලපත්‍රයක් නොමැතිව කිසියම් පදික වෙළෙන්දෙකුට පදික වෙළඳාමේ යෙදී සිටිය නොහැක. |
| | (ii) | මෙම අතුරු ව්‍යවස්ථාවේ (i) වැනි උපවගන්තිය ප්‍රකාරව අවශ්‍යතාවයන් නගර සභාව විසින් කලින් කලට තීරණය කරනු ලබන ගාස්තුවක් නගර සභාව විසින් අයකර ගෙන තාවකාලික බලපත්‍රයක් නිකුත් කරන අතර අදාළ වෙළඳාම සඳහා වූ දින ගණන සහ ජනනය වන්නා වූ අපද්‍රව්‍ය සම්බන්ධව සේවා ගාස්තුවක් අත්තිකාරමක් වශයෙන් ගෙවන ලෙස තාවකාලික බලපත්‍ර හිමියාගෙන් ඉල්ලුම් කළ යුතු ය. |
| | (iii) | උපවගන්ති (i) හි සඳහන් බලපත්‍ර කාලය ඉක්මවා යෑමෙන් පසුව නගර සභාව විසින් තීරණය කරනු ලබන ආකාරයට ඒ සඳහා වූ සේවා ගාස්තුව උපවගන්ති (ii)හි ලබාගත් අත්තිකාරමෙන් අඩු කර ඉතිරි මුදල බලපත්‍ර හිමියාට ගෙවනු ලබයි. |

| | | |
|---|---|---|
| | (iv) | අපද්‍රව්‍ය ජනනය වන්නා වූ ව්‍යාපාරයක් කරගෙන යන පදික වෙළෙන්දෙක් ලේකම්වරයා විසින් අනුමත කරනු ලබන ප්‍රමිතීන්ට අනුකූලව එම අපද්‍රව්‍ය දැමීම සඳහා බඳුනක් හෝ බහාලුමක් තබා ගත යුත්තේ ය. එවැනි කිසියම් අපද්‍රව්‍යයක් පදික වේදිකාවේ මහා මාර්ගයේ හෝ පොදු ස්ථානයේ නොදැමිය යුත්තේ ය. |
| | (v) | පදික වෙළෙන්දෙක් වාහනවල හෝ පදිකයන්ගේ ගමනාගමනයට බාධා ඇතිවන ආකාරයේ බඳුනක් හෝ වෙනත් බහාලුමක් නොතැබිය යුත්තේ ය. |
| | (vi) | සෑම පදික වෙළෙන්දෙක්ම ඔහුගේ ව්‍යාපාරය හේතුවෙන් ජනනය වන්නා වූ අපද්‍රව්‍ය පහත දැක්වෙන ආකාරයට තෝරා වෙන් කළ යුත්තේ ය :-<br><br>*(අ)* ආහාර අපද්‍රව්‍ය හා වෙනත් ජීර්ණනීය අපද්‍රව්‍ය,<br>*(ආ)* ප්‍රතිභාවිතාකරණීය හා ප්‍රතිචක්‍රීකරණීය අපද්‍රව්‍ය,<br>*(ඇ)* අවශේෂමය අද්‍රව්‍ය,<br>*(ඈ)* සුවිශේෂී අපද්‍රව්‍ය. |
| | (vii) | වෙන්කරනු ලැබූ අපද්‍රව්‍ය සෑම පදික වෙළෙන්දෙක්ම සුදුසු වෙනත් බඳුනක් හෝ බහාලුමක් තුළට දැමිය යුත්තේ ය. මෙම අතුරු ව්‍යවස්ථාවේ (vi) වැනි උපවගන්තියේ (අ) අයිතමයේ සඳහන් කර ඇත්තා වූ කෘමීන්, මීයන් හෝ සතුන් විසින් කා දමනු ලැබිය හැක්කාවූත් අපද්‍රව්‍ය සතුන්ට ඇතුල්විය නොහැකි ලෙස බඳුනක හෝ බහාලුමක අභ්‍යන්තරයේ ආරක්ෂාකාරීව තැබිය යුතු ය. |
| | (viii) | සෑම පදික වෙළෙන්දෙක්ම මෙම අතුරු ව්‍යවස්ථාවේ (vi) වන උප වගන්තියේ (අ), (ආ), (ඇ) සහ (ඈ) අයිතමයන්හි විශේෂයෙන්ම සඳහන් කර ඇති අපද්‍රව්‍ය වර්ග බලයලත් අපද්‍රව්‍ය වර්ග එක්රැස් කරන්නෙකුට හෝ නාගරික අපද්‍රව්‍ය එක්රැස් කරන්නෙකුට භාරදිය යුත්තේ ය.<br><br>මෙම අතුරු ව්‍යවස්ථාවේ කාර්යයන් සඳහා පද සම්බන්ධය අනුව අර්ථයක් අවශ්‍ය වන්නේ නම් මිස,<br><br>"පදික වෙළෙන්දා" යන්නෙන් අදහස් කෙරෙන්නේ පදික වේදිකාවේ හෝ පාර අයිනේ භාණ්ඩ විකුණන්නා වූ හෝ සේවාවක් සපයන්නා වූ තැනැත්තෙකි. |
| | | **කර්මාන්තශාලා** |
| 15. | (i) | සෑම කාර්මාන්තශාලා හිමිකරුවෙක්ම හෝ නිෂ්පාදකයෙක්ම කර්මාන්තශාලා පරිශ්‍රය තුළ ජනනය වන්නා වූ අපද්‍රව්‍ය එක්කාසු කර පහත දැකවෙන ආකාරයට තෝරා වෙන්කළ යුත්තේ ය :-<br><br>*(අ)* ආහාර අපද්‍රව්‍ය හා වෙනත් ජීර්ණනීය අපද්‍රව්‍ය,<br>*(ආ)* ප්‍රතිභාවිතාකරණීය හා ප්‍රතිචක්‍රීකරණීය අපද්‍රව්‍ය,<br>*(ඇ)* අවශේෂමය අද්‍රව්‍ය,<br>*(ඈ)* උපද්‍රවකාරි අපද්‍රව්‍ය. |
| | (ii) | මෙම අතුරු ව්‍යවස්ථාවේ (i) වැනි උපවගන්තියේ (අ), (ආ), (ඇ) සහ (ඈ) අයිතමයන්හි සඳහන් කරනු ලැබ ඇති සියලුම අපද්‍රව්‍ය වර්ග බලයලත් අපද්‍රව්‍ය එක්රැස් කරන්නෙකුට භාරදිය හැකි ය. එසේ භාරදෙනු නොලැබූ යම් අපද්‍රව්‍යයක් මෙම අතුරු ව්‍යවස්ථාවේ (i) වැනි උපවගන්තියේ (ඈ) අයිතමයෙහි විශේෂයෙන් සඳහන් කරනු ලැබ ඇති අපද්‍රව්‍ය වර්ග හැර නගර සභා බල ප්‍රදේශයේ අපද්‍රව්‍ය එක්රැස් කරන්නෙකුට භාරදිය යුත්තේ ය. |
| | (iii) | 1980 අංක 17 දරන ජාතික පාරිසරික පනත යටතේ එම ව්‍යාපාරය සඳහා නිකුත් කරනු ලබන පරිසර ආරක්ෂණ බලපත්‍රයේ දක්වා ඇති කොන්දේසිවලට අනුකූලව උපද්‍රවකාරී අපද්‍රව්‍ය ඉවත් කළ යුතු වන්නේ ය.<br><br>මෙම අතුරු ව්‍යවස්ථාවේ කාර්යයන් සඳහා පද සම්බන්ධය අනුව අර්ථයක් අවශ්‍ය වන්නේ නම් මිස,<br><br>"කර්මාන්තශාලාව" යන්නට 1942 අංක 45(128 පරිච්ඡේදය) දරන කර්මාන්තශාලා ආඥාපනතේ තිබෙන අර්ථය අදාළ වන්නේ ය. |

| | | |
|---|---|---|
| **කැණීම්, ඉදිකිරීම සහ කඩා දැමීම** | | |
| 16. | (i) | ගෑස්, විදුලිය, ජලය, දුරකථන යන ආදී පහසුකම් හෝ වෙනත් කවර හෝ පොදු පහසුකම් සැපයීම අරමුණු කරගෙන කුමක් හෝ පොදු ස්ථානයක්, වීදියක් හෝ පාරක් හාරන, ඉදිකරන හෝ එවැනි කටුයත්තක් හා සම්බන්ධ කැඩීම් වැනි වැඩ කටයුතුවල නිරත වන්නා වූ කවර හෝ තැනැත්තෙක් මෙම අතුරු ව්‍යවස්ථාවේ අවශ්‍යතාවයන්ට අනුකූලව නගර සභාව ලිඛිත පූර්ව අනුමැතිය ලබාගත යුතු ය. |
| | (ii) | අතර එවැනි තැනැත්තාගේ එවන් කටයුතු මගින් ඇති කිරීමට අපේක්ෂා කරනු ලබන අපද්‍රව්‍යවල ප්‍රමාණය හා එවැනි අපද්‍රව්‍ය ඉවත් කිරීමට වැය වන්නේ යැයි අපේක්ෂිත වියදම් යන කරුණු ගැන අවධානයට යොමු කරමින් ලේකම්වරයා විසින් තීරණය කරනු ලබන යම් මුදල් ප්‍රමාණයක් අපද්‍රව්‍ය ඉවත් කිරීම සඳහා වන අත්තිකාරම් මුදලක් වශයෙන් අයදුම්කරුවෙකුගෙන් නගර සභාව විසින් අය කරනු ලැබිය යුතු ය. |
| | (iii) | උප ඡේද අංක (i) හි ලබාගත් අනුමැතියට ප්‍රකාරව යම් තැනැත්තෙකු අපද්‍රව්‍ය සම්පූර්ණයෙන් හෝ එයින් එක් කොටසක් ඉවත් කිරීමට අපොහොසත් වන විට එසේත් නැත්නම් නොසලකා හැරියහොත් නගර සභාව තීරණය අනුව එවැනි අපද්‍රව්‍යයන් නගර සභාව විසින් ඉවත් කළ යුතු අතර, එම කටයුතු කිරීම මගින් නගර සභාව විසින් දරනු ලබන වියදම් උප ඡේද අංක (i) යටතේ තැන්පත් කරනු ලැබූ අත්තිකාරම් මුදලින් පියවාගත හැකි අතර ඒ සඳහා අමතර වියදමක් ඇතොත් නීත්‍යානුකූලව අය කරනු ලැබේ.<br>වෙනත් ආකාරයකින් උවමනාවන අවස්ථාවන් හැර මෙම අතුරු ව්‍යවස්ථාවේ අරමුණු උදෙසා<br>"කැනීම්, ඉදිකිරීම් හෝ කඩා දැමීම යන කටයුතුවල යෙදෙන තැනැත්තා" යන පදය එම රාජකාරි පැවරී ඇති කවරෙකු හෝ කොන්ත්‍රාත්කරු හෝ ඔහු විසින් අනුමැතිය ලබාදෙනු ලැබුවාවූ කුමන හෝ තැනැත්තෙකුවද අදාළ කරුණු ඇත.<br>"අපද්‍රව්‍ය" යනු ගොඩනැගිලි ඉදිකිරීම්වල දී ඇතිවන්නා වූ සියලු අපද්‍රව්‍යයන් ඇතුළත් වේ. |
| **ආරෝග්‍යශාලා** | | |
| 17. | (i) | රජයේ ආරෝග්‍යශාලා හැර සියලුම රජයේ නොවන ආරෝග්‍යශාලා නගර සභාවේ ලියාපදිංචි කළ යුතු අතර, සියලු ආරෝග්‍යශාලාවල හිමිකරු පරිශ්‍රය තුළ ජනනය වන්නා වූ අපද්‍රව්‍ය පහත දැක්වෙන ආකාරයට වෙන් කළ යුතු ය :-<br>(අ) ආහාර අපද්‍රව්‍ය හා වෙනත් ජීර්ණනීය අපද්‍රව්‍ය,<br>(ආ) ප්‍රතිභාවිතාකරණීය හා ප්‍රතිචක්‍රීකරණීය අපද්‍රව්‍ය,<br>(ඇ) අවශේෂමය අද්‍රව්‍ය,<br>(ඈ) උපද්‍රවකාරී සෞඛ්‍ය ආරක්ෂණ අපද්‍රව්‍ය. |
| | (ii) | මෙම අතුරු ව්‍යවස්ථාවේ (i) වැනි උපවගන්තිය යටතේ (අ), (ආ) සහ (ඇ) අයිතමයන්හි සඳහන් කර ඇති අපද්‍රව්‍ය වර්ග ක්‍රමානුකූලව ඉවත් කරන තෙක් වෙන වෙනම බහාලුම්වල තැන්පත් කර සුදුසු ස්ථානයක තබාගත යුතු ය. (i) වැනි උපවගන්තිය යටතේ (ඈ) අයිතමයන්හි සඳහන් කර ඇති අපද්‍රව්‍ය වර්ග ඒ සඳහාම සාදන ලද බඳුනක හෝ බහාලුමක තැන්පත් කර එම බහාලුම් තබා ගැනීම සඳහා සකස් කරන ලද ස්ථානයක තබා ගත යුතු අතර, එම අපද්‍රව්‍ය 1980 අංක 47 දරන ජාතික පාරිසරික පනත යටතේ එම ආරෝග්‍යශාලාවට නිකුත් කරනු ලැබූ පරිසර ආරක්ෂණ බලපත්‍රයේ දක්වා ඇති කොන්දේසිවලට අනුකූලව එම අපද්‍රව්‍ය ඉවත් කළ යුත්තේ ය. |
| | (iii) | (i) වැනි උපවගන්තියේ (අ), (ආ) සහ (ඇ) අයිතමයන්හි සඳහන් කරනු ලැබ ඇති අපද්‍රව්‍ය වර්ග බලයලත් අපද්‍රව්‍ය එක්රැස් කරන්නෙකුට හෝ නගර සභා අපද්‍රව්‍ය එක්රැස් කරන්නෙකට භාරදිය යුත්තේ ය.<br>මෙම අතුරු ව්‍යවස්ථාවේ පද සම්බන්ධය අනුව අර්ථය අවශ්‍ය වන්නේ නම් මිස,<br>"ආරෝග්‍යශාලාව" යන්නෙන් අදහස් කරන්නේ යම් රෝගයකින් හෝ දුබලතාවයකින් පෙළෙන තැනැත්තන් හෝ සතුන් පිළිගැනීම ඔවුන්ට සාත්තු කිරීම සහ ප්‍රතිකාර කිරීම සඳහා යොදා ගනු ලබන හෝ යොදා ගැනීමට අපේක්ෂා කරනු ලබන යම් පරිශ්‍රයක් වන අතර, සාත්තු නිවාසයක්, සායනයක්, වෛද්‍ය මධ්‍යස්ථානයක්, මාතෘ නිවාසයක් සහ සත්ත්ව රෝහලක්/සත්ත්ව සායන ඊට ඇතුළත් වේ.<br>"උපද්‍රව්‍යකාරී සෞඛ්‍ය ආරක්ෂණ අපද්‍රව්‍ය" යන්නෙන් අදහස් කෙරෙන්නේ සායනික අපද්‍රව්‍ය, ශරීර කොටස්, වැදෑමස්, ආසාදන වන සුළු සහ අතිශයින් ආසාදනය වන සුළු අපද්‍රව්‍ය හා උල් කටු වේ. |

| සත්ත්ව ඝාතකාගාර හා මස් වෙළඳ කුටි | | |
|---|---|---|
| 18 | (i) | යම් තැනැත්තෙකු සත්ත්ව ඝාතකාගාර ආඥාපනතේ (272 පරිච්ඡේදයේ) විධිවිධානවලට අනුකූලව නගර සභාවෙන් නිකුත් කරන ලද බලපත්‍රයක් නොමැතිව මස් වෙළඳාම් කිරීම හෝ යම් සත්ත්වයෙක් ඝාතනය කළ නොහැක. |
| | (ii) | මෙම අතුරු ව්‍යවස්ථාවේ (i) වැනි උපවගන්තිය ප්‍රකාරව ලබා දෙන බලපත්‍රය සත්ත්වයින් ඝාතනය කිරීමට අනුමත සත්ත්ව ඝාතකාගාරය, ඝාතනය කළ යුතු සතුන් වර්ග, සත්ත්ව ඝාතකාගාරය සකස් කරන පිළිවෙල සහ එහි පිරිසිදුතාවය යන කොන්දේසි සහ ලේ, බඩවැල් සහ මිනිස් භෝජනයට නුසුදුසු කොටස් සහ නගර සභාව විසින් සුදුසු යැයි තීරණය කරනු ලබන අනෙකුත් කොන්දේසි අනුකූලව විය යුතු ය. |
| | (ii) | මෙම අතුරු ව්‍යවස්ථාවේ (i) උපවගන්තියෙන් ලබා දුන් බලපත්‍රධාරියා හෝ ඔහුගේ නියෝජිතයා (මින් මතු බලපත්‍රධාරියා යනුවෙන් සඳහන් වේ). ඝන අපද්‍රව්‍ය පහත පරිදි වෙන් කළ යුතු වේ.<br><br>(අ) සත්ත්ව ශරීර කොටස්, හිසකෙස්, කුර, ඇටකට හා ජීර්ණනීය නොවන ද්‍රව්‍ය,<br>(ආ) ප්‍රතිභාවිතාකරණීය හා ප්‍රතිචක්‍රීකරණීය අපද්‍රව්‍ය,<br>(ඇ) අවශේෂමය අපද්‍රව්‍ය, |
| | (iv) | මෙම අතුරු ව්‍යවස්ථාවේ (iii) උප වගන්තියේ (අ), (ආ) සහ (ඇ) අයිතමයන්හි සඳහන් කර ඇති අපද්‍රව්‍ය වර්ග වෙන්කර තෙතමනය කාන්දු නොවන පරිදි භාජන තුළ තැබිය යුතු වන අතර, එයට මැස්සන්, මීයන්, කෘමීන් හෝ වෙනත් සතුන් ඇතුළු වීම වළකමින් නිසි ලෙස සුරක්ෂිත කර තැබිය යුතු වන්නේ ය. |
| | (v) | මෙම අතුරු ව්‍යවස්ථාවේ (iii) වැනි උපවගන්තියේ (අ), (ආ) සහ (ඇ) අයිතමයන්හි සඳහන් කර ඇති අපද්‍රව්‍ය වර්ග බලයලත් අපද්‍රව්‍ය එක්රැස් කරන්නෙකුට භාරදිය යුතු වන්නේ ය. එසේ නොමැති නම් නගර සභා එක්රැස් කරන්නෙකුට භාරදිය යුත්තේ ය. |
| | (vi) | සත්ත්ව ඝාතකාගාර මගින් ජනනය වන කුණු වතුර සම්බන්ධයේ 1980 අංක 56 දරන ජාතික පරිසර පනතේ වගන්තියට අනුව ක්‍රියා කළ යුතු වන්නේ ය.<br><br>පද සම්බන්ධය අනුව අර්ථය අවශ්‍ය වන්නේ නම් මිස මෙම අතුරු ව්‍යවස්ථාවේ -<br><br>"සත්ත්ව ඝාතකාගාරය" යන්නෙන් අදහස් කරන්නේ සත්ත්ව ආඥාපනතින් (272 පරිච්ඡේදය) අර්ථ නිරූපණයට අදාළ වේ.<br><br>"මස් වෙළඳ කුටිය" යන්නෙන් අදහස් කරන්නේ ශ්‍රී ලංකාවේ ඝාතනය කරන ලද සතුන් අලෙවි කිරීමේ කාර්ය සඳහා නිරාවරණය කර ඇති ස්ථානයකි. |
| වෙනත් පරිශ්‍ර | | |
| 19. | (i) | අංක 08 සිට 18 දක්වා වන අතුරු ව්‍යවස්ථාවන්හි සඳහන් කර නොමැති ව්‍යාපාරයක් කරගෙන යන යම් තැනැත්තෙක් හෝ මහජනතාවගේ සහභාගිත්වය ඇතිව පොදු, ආගමික, සමාජීය, සංස්කෘතික හෝ අධ්‍යාපනික ක්‍රියාකාරකමක් සංවිධානය කරන හා ක්‍රියාත්මක කරන යම් තැනැත්තෙක් එකී ක්‍රියාකාරකම නිසා හෝ එවැනි ආයතනයක් පවත්වාගෙන යාම නිසා ජනනය වන අපද්‍රව්‍ය පහත දැක්වෙන ආකාරයට වෙන් කළ යුත්තේ ය. :-<br><br>(අ) ආහාර අපද්‍රව්‍ය හා වෙනත් ජීර්ණනීය අපද්‍රව්‍ය,<br>(ආ) ප්‍රතිභාවිතාකරණීය හා ප්‍රතිචක්‍රීකරණීය අපද්‍රව්‍ය,<br>(ඇ) අවශේෂමය අපද්‍රව්‍ය,<br>(ඈ) සුවිශේෂී අපද්‍රව්‍ය. |

| | | |
|---|---|---|
| | (ii) | (i) වැනි උප වගන්තියේ සඳහන් කර ඇති යම් ක්‍රියාකාරකමක් සංවිධානය කරන කෙනෙක් එම ක්‍රියාකාරකම නිසා ජනනය වන්නා වූ අපද්‍රව්‍ය එක් කිරීමට විශේෂ වැඩ පිළිවෙලක් යෙදීමට හැකි වනු පිණිස ඒ ගැන කල්තියා නගර සභාවට දැනුම්දිය යුත්තේ ය. එම ක්‍රියාවලිය නිසා ජනනය වන අපද්‍රව්‍ය එකලස් කිරීම සඳහා නගර සභාව විසින් කලින් කලට තීරණය කරනු ලබන සේවා ගාස්තුවකට අනුකූල වේ. |
| | (iii) | වෙන් කරනු ලැබූ අපද්‍රව්‍ය ඉවත් කරගනු ලබන තෙක් වෙනම බහාලුම්වල අසුරා සුදුසු ස්ථානයක ගබඩා කළ යුත්තේ ය. |
| | (iv) | මෙම අතුරු ව්‍යවස්ථාවේ (i) වැනි උපවගන්තියේ (අ), (ආ), (ඇ) සහ (ඈ) අයිතමයන්හි සඳහන් කරනු ලැබ ඇති අපද්‍රව්‍ය වර්ග බලයලත් අපද්‍රව්‍ය එක්රැස් කරන්නෙකුට හෝ නගර සභාව විසින් කලින් කලට තීරණය කරනු ලබන පරිදි නගර සභාවට සේවා ගාස්තුවක් ගෙවීම මත නගර සභා අපද්‍රව්‍ය එක්රැස් කරන්නෙකුට භාරදිය යුත්තේ ය. |
| | | **වීදී සහ පොදු ස්ථාන** |
| 20. | (i) | ලේකම්වරයා විසින් සභාපතිවරයා සමග සාකච්ඡා කර නගර සභාවේ අනුමැතියට යටත්ව පහත දැක්වෙන කාර්යයන් සැලසුම් කිරීමට, පාලනය කිරීමට සහ පරිපාලනය කිරීමට පියවර ගත යුතු ය :-<br><br>*(අ)* නගර සභා ප්‍රදේශයේ තුළ පිහිටි වීදි පොදු ස්ථාන, මංමාවත්, පොදු කාණු, ජල මාර්ග සහ පොදු වෙළෙඳපොළවල් පිරිසිදු හා සනීපාරක්ෂක තත්ත්වයෙන් පවත්වා ගැනීම;<br><br>*(ආ)* වීදි හා මාර්ග දෙපස සහ පොදු ස්ථානයන්හි ප්‍රමාණවත් උචිත බහාලුම් සංඛ්‍යාවක් සපයා සවි කිරීම හා නඩත්තු කිරීම;<br><br>*(ඇ)* උත්සවවල හෝ විශේෂ සිදුවීම්වල දී නගර සභාව විසින් පොදු ස්ථානවල තබා ගැනීම සඳහා හෝ තීරණය කරනු ලබන සිදුවීම් අවස්ථාවල දී සැපයීම සඳහා ජංගම අපද්‍රව්‍ය බහාලුම් සැපයිය යුතු ය;<br><br>*(ඈ)* සනීපාරක්ෂක තත්ත්වයන් පවත්වා ගැනීම සඳහා නේවාසික ප්‍රදේශයන්හි අපද්‍රව්‍ය බක්කි හෝ බහාලුම් සවි කිරීම හෝ තැන්පත් කිරීම ඇතුලු අපද්‍රව්‍ය බැහැර කිරීම සම්බන්ධයෙන් අසල්වාසී නේවාසිකයන්ට පීඩාවක් නොවන ආකාරයෙන් සැලසුම් කිරීම.<br><br>*(ඉ)* පූර්වගාමී වගන්තිවල සඳහන් කර ඇති ක්‍රියාකාරකම් පිළිබඳව ලැබුණු යම් පැමිණිල්ලක් විමර්ශනය කිරීම හා අප්‍රමාදව ඒ ගැන ක්‍රියා කිරීම. |
| | | **නගර සභාවේ යුතුකම** |
| 21. | (i) | ලේකම්වරයා සභාපතිවරයා සමග සාකච්ඡා කර නගර සභාවේ, අනුමැතියට යටත්ව පහත දැක්වෙන කාර්යයන් සැලසුම් කිරීම, අධීක්ෂණය කිරීම, පාලනය කිරීම සහ පරිපාලනය කළ හැක්කේ ය. :-<br><br>*(අ)* අපද්‍රව්‍ය ජනනය වීම අඩුකිරීමට, ප්‍රතිචක්‍රීකරණයට නැවත භාවිතයට ජනතාව ධෛර්යමත් කිරීම;<br><br>*(ආ)* අපද්‍රව්‍ය තෝරා වෙන් කිරීම, එක්රැස් කිරීම, ගබඩා කිරීම, මුදාහැරීම හා බැහැරලීම සම්බන්ධයෙන් දැනුවත් කිරීමේ වැඩසටහන් පැවැත්වීම හෝ මාධ්‍ය මගින් ප්‍රචාරණය කිරීම;<br><br>*(ඇ)* ප්‍රතිභාවිතාකරණ හා ප්‍රතිචක්‍රීකරණ කටයුතුවල නියුක්ත පුද්ගලයින්ට හා කුඩා ව්‍යවසායකයින්ට සහාය සැපයීම;<br><br>*(ඈ)* අපද්‍රව්‍ය අඩු කිරීමේ, ප්‍රතිභාවිතා කිරීමේ හා ප්‍රතිචක්‍රීකරණය කිරීමේ ක්‍රියාකාරකම්වලට සම්බන්ධ වී සිටින අයට දිරි ගැන්වීම් පිරිනැමීම;<br><br>*(ඉ)* අපද්‍රව්‍ය මුදාහැරීමේ ක්‍රම පිළිබඳ වෙනස් ආකෘති නියාමනය කිරීම; |

*(ඊ)* අපද්‍රව්‍ය වෙන් කිරීම, එකතු කිරීම සහ ගබඩා කිරීම් කටයුතු සඳහා ද උපරිම ප්‍රයෝජන ලබා ගැනීම සඳහා ද, නගර සභාව විසින් තීරණය කරන ලද නියමයන් හා විවරණවලට අනුකූලව අවශ්‍ය ප්‍රමාණ මලු, උර, භාජන හා බහාලුම් අයිතිකරුවන්ට හා පදිංචිකරුවන්ට සැපයීම.

*(උ)* විවිධ ප්‍රදේශවල නොයෙකුත් අපද්‍රව්‍ය වර්ග නගර සභාව විසින් ඉවත් කිරීම සම්බන්ධයෙන් අපද්‍රව්‍ය එකතු කිරීමේ වැඩසටහන් සකස් කළ යුතු අතර, එයට එකතු කිරීමේ දිනය, වේලාව, ක්‍රමවේදයන් හා සේවා ගාස්තු ඇතුලත් විය යුතු ය. තව ද ප්‍රසිද්ධ නිවාඩු දිනයන් ද ඇතුලත් විය හැක.

*(ඌ)* බලයලත් අපද්‍රව්‍ය එක්රැස් කරන්නන්ට වෙනම භාරදෙනු නොලැබූ යම් වෙන් කරන ලද අපද්‍රව්‍යයක් කාර්යය සටහනට අනුව නියමිත වේලාවට එක්රැස් කිරීම;

*(එ)* බලයලත් අපද්‍රව්‍ය එක්රැස් කරන්නන්ට භාරදෙනු නොලැබූ අන්තරායකාරී අපද්‍රව්‍ය සහ වෙනත් යම් අපද්‍රව්‍ය සනීපාරක්ෂක ආකාරයෙන් ප්‍රවාහනය කිරීම;

*(ඒ)* අන්තරායකාරී අපද්‍රව්‍ය හෝ ලේකම්වරයා විසින් නියම කරන ලද  වෙනත් යම් අපද්‍රව්‍ය වර්ග හැර වීදි අතුගෑමෙන්, කාණු පිරිසිදු කිරීමෙන් පොදු ස්ථාන පරිසිදු කිරීමෙන් එක්රැස් කෙරෙන අපද්‍රව්‍ය පොදු බහාලුම්වල එක්රැස් කෙරෙන අපද්‍රව්‍ය සහ නගර සභාවේ කම්කරුවන් විසින් එක්රැස් කරනු ලබන අපද්‍රව්‍ය බලයලත් අපද්‍රව්‍ය එක්රැස් කරන්නෙකුට භාරදීම;

*(ඔ)* ලේකම්වරයා අනුමත කරන ආකාරයට නගර සභා අපද්‍රව්‍ය එක්රැස් කරන්නන් විසින් එක්රැස් කර වෙන් කරනු ලබන සියලු ආහාර වර්ග සහ වෙනත් ජෛව ජීර්ණනීය, මුළුමනින්ම හෝ කොටසක් ප්‍රතිභාවිතාකරණීය හා ප්‍රතිචක්‍රීකරණීය අපද්‍රව්‍ය ඇතුළු ගෙවතු අපද්‍රව්‍ය ප්‍රායෝගිකව කළ හැකිතාක් සැකසීම සහ පිරියම් කිරීම සම්බන්ධවත් එම ක්‍රියාන්විතයන්ගෙන් ප්‍රතික්ෂේප වන හා මෙම අපද්‍රව්‍ය වර්ගවල වෙනත් අවශේෂ අපද්‍රව්‍ය සම්බන්ධයෙන් යෝග්‍ය පියවර ගැනීම;

*(ඕ)* මධ්‍යම පරිසර අධිකාරිය සමග සාකච්ඡා කර නගර සභාව විසින් අනුමත කරනු ලබන ආකාරයට සියලුම අන්තරායකාරි අපද්‍රව්‍ය බැහැර කිරීම;

*(ක)* 1980 අංක 47 දරන ජාතික පාරිසරික පනතේ විධිවිධාන අනුකූලව පරිසර ආරක්ෂණ බලපත්‍රයක් හෝ වෙනත් බලපත්‍රයක් ලබා ගැනීම සහ පරිසර ආරක්ෂණ බලපත්‍රයේ හෝ වෙනත් බලපත්‍රයේ සඳහන් කර ඇති කොන්දේසිවලට යටත්ව අපද්‍රව්‍ය පිළිස්සීම හෝ සනීපාරක්ෂක බිම් පිරවුමක් නඩත්තු කිරීම;

*(ග)* අපද්‍රව්‍ය අතුගෑම, එක්කාසු කිරීම, තෝරා වෙන් කිරීම, ප්‍රවාහනය කිරීම, මාරු කිරීම හා බැහැරලීම යන කාර්යයන් හි නිරතවන සෑම සේවකයෙකුටම සුදුසු ඇඳුම්, අත් ආවරණ, මුඛ ආවරණ සහ බූට් සපත්තු සැපයීම.

*(ජ)* නිවෙසක් හෝ වෙනත් ඉදිකිරීමක් හෝ ප්‍රතිසංස්කරණය කිරීමක් අවස්ථාවේ දී සහ නගර සභාවට ඉල්ලුම් පත්‍රයක් ඉදිරිපත් කර ඇති අවස්ථාවක දී ඉදිකිරීම හෝ ප්‍රතිසංස්කරණය නිසා ජනනය වන්නා වූ ඝන අපද්‍රව්‍ය බැහැරලන ආකාරය සහ නියමිත වැඩ ආරම්භ කරන අදියරේ දී හා නිමවීමේ දී අපද්‍රව්‍ය ගබඩා කරනු, සකසනු හා බැහැරලනු ලබන ආකාරය පිළිබඳ විස්තර පරීක්ෂා කිරීම හා අනුමත කිරීම;

*(ට)* නගර සභා පරිශ්‍රය සඳහා අභ්‍යන්තර අපද්‍රව්‍ය කළමනාකරණය සැලැස්මක් පිළියෙල කිරීම;

*(ඩ)* ඝන අපද්‍රව්‍ය කළමනාකරණය පිළිබඳ ජාතික උපායමාර්ග සහ අදාළ පැනවීම්වලට අනුකූලව අපද්‍රව්‍ය කළමනාකරණ සැලැස්මක් අවම වශයෙන් සෑම වර්ෂයකම සකස් කිරීම සහ වර්ෂ 03 කට පෙර අවසාන අපද්‍රව්‍ය ඉවත් කිරීමේ සැලැස්මක් සකස්කර ක්‍රියාත්මක කිරීම සහ එකී සැලසුම් සඳහා සෑම වර්ෂයකම නගර සභාවෙන් අනුමැතිය ලබා ගැනීම.

*(න)* (අ) සිට (ඩ) දක්වා අයිතමයන්හි සඳහන් කරුණු සම්බන්ධයෙන් ලැබෙන යම් පැමිණිල්ලක් විමර්ෂණය කිරීමෙන් අනතුරුව එය ප්‍රමුඛත්වය අනුව තීරණය කර ක්‍රියාත්මක කිරීම.

| | | |
|---|---|---|
| | | **බලපත්‍ර** |
| 22. | (i) | අපද්‍රව්‍ය ප්‍රතිභාවිතයට ගන්නා වූ හෝ ප්‍රතිචක්‍රීකරණය කරන්නා වූ හෝ කොම්පෝස්ට්, ජීව වායු හෝ වෙනත් නිපැයුමක් නිර්මාණය කරන්නා වූ යම් තැනැත්තෙකුට නගර සභාව විසින් බලපත්‍රයක් නිකුත් කරනු ඇත. එම තැනැත්තා;<br><br>(අ) නගර සභාව විසින් අනුමත කරන ලද අතුරු ව්‍යවස්ථාව ප්‍රකාර නගර සභා බල ප්‍රදේශයේ ඇතුළත හෝ වෙනත් පළාත් පාලන ආයතන ප්‍රදේශයක හෝ යම් ව්‍යාපාරයක් කරගෙන යාම;<br><br>(ආ) 1980 අංක 47 දරන ජාතික පාරිසරික පනතේ විධි විධාන අනුව නිකුත් කරනු ලබන පරිසර ආරක්ෂණ බලපත්‍රයක් සතුව තිබීම;<br><br>(ඇ) එක්රැස් කරන ලද අපද්‍රව්‍ය සඳහා නගර සභාව විසින් අනුමත කරන ලද ප්‍රමිතීන්ට අනුකූලව ඉදිකරනු ලබන අපද්‍රව්‍ය එක්රැස් කිරීමේ මධ්‍යස්ථානය සැපයීම;<br><br>(ඈ) එක්රැස් කරන ලද අපද්‍රව්‍ය සඳහා නගර සභාව විසින් අනුමත කරනු ලබන පරිදි හා ජනතාවට පීඩාවක් සිදු නොවන සනීපාරක්ෂක ක්‍රමයකට ප්‍රවාහනය කිරීම සඳහා වාහන සැපයීම;<br><br>(ඉ) සැකසීමේ දී හෝ පිරියම් කිරීමේ දී ඇතිවන ප්‍රතික්ෂේප කරන ලද සහ ගෙවතු අපද්‍රව්‍ය නගර සභාව විසින් අනුමත කරනු ලබන පරිදි හා නගර සභාව විසින් කලින් කලට තීරණය කරනු ලබන පරිදි අපද්‍රව්‍ය එක්රැස් කිරීම සඳහා ගාස්තුවක් ලේකම්වරයාට ගෙවීම මත නගර සභාව විසින් අනුමත කරනු ලබන පරිදි නගර සභාවට භාරදීමට එකඟ වීම;<br><br>(ඊ) බලපත්‍රයක් ලබා ගැනීම සඳහා ඉදිරිපත් කර ඇති අයදුම්පත්‍රයක් නගර සභාව නිකුත් කිරීම ප්‍රතික්ෂේප කළ විටෙක ඉල්ලුම්කරු ඉල්ලා සිටියහොත් එසේ ප්‍රතික්ෂේප කිරීමට හේතු බලපත්‍රය සඳහා ඉල්ලුම් පත්‍රය ලැබී දින 30ක් ඇතුළත ලිඛිතව ඉල්ලුම්කරුට දැනුම් දිය යුත්තේ ය.<br><br>(උ) ලේකම්වරයා බලපත්‍රයේ වලංගු කාලය තුළ එක්රැස් කිරීමට අනුමත කරන ලද අපද්‍රව්‍ය හෝ අපද්‍රව්‍යයන්ගේ වර්ගය, එවැනි අපද්‍රව්‍යයන් එක්රැස් කිරීමට අනුමත කරන ලද ප්‍රදේශය සහ සුදුසු කොන්දේසි අවසර පත්‍රයේ දැක්විය යුතු ය.<br><br>(ඌ) උප ඡේද (උ) හි විධිවිධානවලට අනුකූලව යම්කිසි බලපත්‍රයක් අවලංගු කළහොත් කිසියම් තැනැත්තෙක් අපද්‍රව්‍ය එක්රැස් කිරීමට හෝ ලබාගැනීම නොකළ යුතු ය. මෙවැනි අවස්ථාවක දී ලේකම්වරයා එවැනි අවලංගු කිරීම් ජනතාවගේ අවධානයට ලක් කළ යුතු ය. |
| | | **අපද්‍රව්‍ය බැහැරලන ප්‍රදේශ** |
| 23. | (i) | නගර සභාව විසින් අපද්‍රව්‍ය බැහැරලීමේ කාර්ය සඳහා වෙන්කරන ලද ප්‍රදේශයට අවසර නොලත් තැනැත්තෙක් ඇතුළු නොවිය යුතු හා එහි නොගැවසිය යුතු අතර එම ප්‍රදේශයේ යම් භාණ්ඩයක් අපද්‍රව්‍යයක් හෝ ඉවතලන දෙයක් තැන්පත් කිරීම, අවුල් කිරීම හෝ ඉවත්කිරීම නොකළ යුත්තේය. |
| | (ii) | අනුමත කිරීමේ යම් කොන්දේසිවලට යටත්ව ලේකම්වරයාගේ සහ මධ්‍යම පරිර අධිකාරියේ පූර්ව ලිඛිත අනුමැතිය ඇතිව මිස කිසිම තැනැත්තෙක් නගර සභා සීමාවන් ඇතුළත පිහිටි යම් ඉඩමක් හෝ පහසුකමක් එයට පිටස්තර ස්ථානයක ජනනය වන්නාවූ අපද්‍රව්‍ය තැන්පත් කිරීම සඳහා සැපයීම හෝ භාවිතා කිරීම නොකළ යුත්තේ ය. |

| | | |
|---|---|---|
| | | **වෙනත්** |
| 24. | (i) | ලේකම්වරයාට හෝ ඔහු විසින් ලිඛිතව බලය දෙනු ලැබූ යම් තැනැත්තෙකුට සියලු සාධාරණ වේලාවන් හිදී යම් පරිශ්‍රයකට ඇතුළුවීමට සහ එහි හිමිකරු හෝ පදිංචිකරු මෙම අතුරු ව්‍යවස්ථාවන්හි විධිවිධානවලට අනුකූලව ක්‍රියා කරන්නේ දැයි පරීක්ෂා කර බැලීමට බලය ඇත්තේ ය. |
| | (ii) | එම පරිශ්‍රයේ හිමිකරු, පදිංචිකරු, භාරකරු, කළමනාකරු හෝ එහි වාසය කරන්නා වූ හෝ සේවය කරන්නා වූ යම් තැනැත්තෙක් ලේකම්වරයාට හෝ යම් බලයලත් නිලධාරියෙකුට අවශ්‍ය කරන තොරතුරු ඉදිරිපත් කළ යුත්තේ ය. |
| | (iii) | මෙම අතුරු ව්‍යවස්ථාව යටතේ ලේකම්වරයාට හෝ යම් බලයලත් නිලධාරියෙකුට සිය බලතල භාවිතා කිරීමෙහිලා කිසිම තැනැත්තෙක් බාධා නොකළ යුත්තේ ය. |
| | (iv) | මෙම අතුරු ව්‍යවස්ථාවෙහි යම් විධිවිධානයක් උල්ලංඝනය කරන යම් තැනැත්තෙක් නගර සභා පනත ප්‍රකාර වරදකට වරදකරු වන්නේ ය. |
| | | **උල්ලංඝනය කිරීම් සහ දඬුවම්** |
| 25. | (i) | අතුරු ව්‍යවස්ථාවේ යම්විධිවිධාන හෝ නියමයන් නගර සභා බලප්‍රදේශය තුළ කවර හෝ තැනැත්තෙකු විසින් උල්ලංඝනය කිරීම හෝ නොසලකා හැරීම ලේකම් විසින් කරනු ලබන ලිඛිත දැන්වීමක් මත මහෙස්ත්‍රාත් අධිකරණයක් විසින් පහත විස්තර කර ඇති දඬුවම් පැමිණවිය හැකි වරදක් වනු ඇත.<br>(අ) එවැනි උල්ලංඝණය කිරීම් හෝ නොසලකා හැරීම් සම්බන්ධයෙන් වන වරදක් සඳහා රු. 750.00ක දඩ මුදලක් ද,<br>(ආ) එවැනි උල්ලංඝණය කිරීම් හෝ නොසලකා හැරීම් අඛණ්ඩව සිදුවන්නා වූ කාල පරිච්ඡේදය තුළ දවසකට අමතර දඩ මුදලක් වශයෙන් රු. 250.00 ක මුදලක් ද ගෙවිය යුතු ය. |
| | | **අර්ථ නිරූපනය** |
| 26. | | මෙම අතුරු ව්‍යවස්ථාවන්හි කාර්යයන් සඳහා පද සම්බන්ධය අනුව අර්ථයක් අවශ්‍ය වන්නේ නම් මිස,<br>"බලයලත් එක්රැස් කරන්නා" යන්නෙන් අපද්‍රව්‍ය එක්රැස් කිරීමට හෝ ලබා ගැනීමට ලේකම්වරයාගෙන් අවසර පත්‍රයක් ලබාගන්නා තැනැත්තෙකු අදහස් කෙරේ.<br>"බලයලත් නිලධාරි" යන්නෙන් මෙම අතුරු ව්‍යවස්ථා යටතේ වන රාජකාරී ඉටුකිරීමට හෝ කරගෙන යාමට ලේකම්වරයා විසින් ලිඛිතව බලය දෙනු ලැබූ යම් තැනැත්තෙකු අදහස් කෙරේ.<br>"බක්කිය/ බඳුන් හෝ වෙනත් බහාලුම්" යන්නෙන් අතුරු ව්‍යවස්ථාවන්හි දක්වා ඇති අවශ්‍යතාවයන්ට අනුකූලව අපද්‍රව්‍ය ගබඩා කිරීම, මුදා හැරීම, එක්රැස් කිරීම හෝ ප්‍රවාහනය කිරීම සඳහා භාවිතා කරනු ලබන යම් බක්කියක්, බඳුනක්, උරයක්, මල්ලක් හෝ වෙනත් බහාලුමක් අදහස් කෙරේ.<br>"ජෛව ජීර්ණනීය අපද්‍රව්‍ය" යන්නෙන් ක්ෂුද්‍රජීවී කාරකයන් මගින් දිරාපත් කරනු ලැබිය හැකි අපද්‍රව්‍ය අදහස් කෙරේ.<br>"එක්රැස් කිරීම" යන්නෙන් බලය පවරනු ලැබුවා වූ මුදල් රැස් කරන්නෙක් විසින් කරනු ලබන මුදල් රැස්කිරීම් යනුවෙන්ද එසේ නොවූ විට නගර සභාවේ අපද්‍රව්‍ය එක්රැස්කරන්නෙකු විසින් පැටවීම හෝ බැමට, නැවත භාවිතයට ගැනීමට ප්‍රතිචක්‍රීකරණය කිරීමට හෝ පිරිසැකසුම් කිරීමට රැස්කරනු ලබන අපද්‍රව්‍ය රැස්කිරීම් යනුවෙන්ද අදහස් කෙරේ. |

"කොම්පෝස්ට් පොහොර" යන්නෙන් ක්ෂුද්‍රජීවීන් විසින් ජීර්ණයට ලක් වීමෙන් පසුව ලැබෙන අවසන් නිමැවුම අදහස් කරන අතර එය පාංශු තත්වාරක්ෂකයක් ලෙස ක්‍රියාකල හැකි හියුමස් ද්‍රව්‍යයකි.

"මුදා හැරීම" යන්නෙන් කවර හෝ තැනැත්තෙකු විසින් හෝ ඉඩකඩම්වලින් ඉවත දමනු ලබන අපද්‍රව්‍යවල කොටස් සියල්ල අදළ ඉඩම තුළින් හෝ එහි බාහිර පෙදෙසෙහි බලය ලත් අපද්‍රව්‍ය රැස් කරන්නෙකු වෙත හෝ නගර සභාවේ අපද්‍රව්‍ය රැස් කරන්නෙකු වෙත ලබාදීම සඳහා තබා ඇති ද්‍රව්‍යයන් යනුවෙන් අදහස් වේ.

"බැහැරලීම" යන්නෙන් භූමිය මත හෝ භූමි පෙදෙස තුළ නැවත භාවිතයට ගැනීම සඳහා ප්‍රතිචක්‍රීකරණය කිරීම සඳහා හෝ පිරිසැකසුම් කිරීම සඳහා ඉවත් කරන ලද අපද්‍රව්‍යයන් නියත වශයෙන් රඳවා තබා ගැනීමට අපේක්ෂිත පර්යන්තය යනුවෙන් අදහස් කෙරේ.

"ගාස්තුව" යන්නෙන් නගර සභාව විසින් කලින් කලට තීරණය කරනු ලබන්නාවූ ගාස්තු යනුවෙන් අදහස් කෙරේ.

"ආහාර අපද්‍රව්‍ය" යන්නෙන් මිනිස් පාරිභෝජනයට නුසුදුසු මස්, මාළු, බිත්තර හා එළවළු, පළතුරු සහ ආහාර වශයෙන් ගත නොහැකි සියලු ආහාර ද්‍රව්‍ය අදහස් කෙරේ.

"උපද්‍රවකාරී අපද්‍රව්‍ය" යන්නෙන් විෂ සහිත විනිවිද ගොස් වනසන, පහසුවෙන් දැවෙන සුළු ප්‍රතික්‍රියාකාරී, විකිරණශීලි ලෙස පැතිරෙන සුළු අපද්‍රව්‍ය අදහස් කෙරේ.

"සුවිශේෂී අපද්‍රව්‍ය" යන පදය භෞතික හෝ රසායනික ස්වභාවය සහිත හෝ මෙම ද්විත්වයෙන් ම සමන්විත වූ හා නගර සභා බල ප්‍රදේශය තුළ සිදුකරනු ලබන්නාවූ කඩාබිඳ දැමීම, ඉදිකිරීම් හෝ සෙසු දැව අපද්‍රව්‍ය වලින් වෙනස් වන්නාවූ විශේෂිත පරිහරණයට ලක් කළ යුතු අපද්‍රව්‍ය අදහස් කෙරේ.

"හිමිකරු හෝ පදිංචිකරු" යන්නෙන් පරිශ්‍රයේ හිමිකරු හෝ හිමිකරු වෙනුවෙන් ඇටෝර්නි බලය දරන යම් තැනැත්තෙකු හෝ හිමිකරු වලින් සිය කර්මාන්තය, කර්මාන්තශාලාව, වත්ත කළමනාකරණයට පත් කරන ලද නියෝජිතයෙකු හෝ භාරකරුවෙකු හෝ කුළියට ලබා ගන්නා අයෙකු ඇතුළත් වන අතර වෙනත් තැනැත්තෙකුගේ නියෝග යටතේ ක්‍රියා කරන කළමනාකරුවෙකු අදහස් කෙරේ.

"නගර සභාව" යන්නෙන් "කාත්තාන්කුඩි" නගර සභාව අදහස් කෙරේ.

"නාගරික ප්‍රදේශය" යන්නෙන් කිසියම් නාගරික ප්‍රදේශයක් වෙනුවෙන් ස්ථාපිත කරන ලද නගර සභාවකට අදාළවන පරිපාලන බල ප්‍රදේශයකි.

"නගර සභා බල ප්‍රදේශයේ අපද්‍රව්‍ය එක්රැස් කරන්නා" යන්නෙන් නගර සභාව විසින් අපද්‍රව්‍ය එකතු කිරීම, අතුගා දැමීම, බහාලුම්වලින් හෝ වෙනත් බඳුන්වලින් අපද්‍රව්‍ය ඉවත් කිරීම හෝ රැස් කිරීම, සඳහා නගර සභාව සමග ගිවිසගත් තැනැත්තෙකු හෝ එම රාජකාරියේ නිරත වූ නගර සභා කම්කරුවෙකු අදහස් කෙරේ.

"පොදු ස්ථානය" යන්නෙන් වීදියක්, පිට්ටනියක්, පොදු ඉඩමක්, වෙන් කරනු ලැබූ පාරක්, ක්‍රීඩා පිටියක්, පොදු ගොඩනැගිල්ලක්, සුසාන භූමියක්, දිය ගලා යන ස්ථානයක්, මුහුද, මුහුදු වෙරළ හෝ මහජනතාව විසින් පොදුවේ භාවිතයට ගන්නා වූ යම් ස්ථානයක් අදහස් කෙරේ.

"ප්‍රතිචක්‍රීකරණීය අපද්‍රව්‍ය" යන්නෙන් අපද්‍රව්‍ය භාවිතා කරමින් නව පාරිභෝජන නිෂ්පාදනයක් කිරීමට යොද ගත හැකි අපද්‍රව්‍ය අදහස් කෙරේ. මේ හේතු කරගෙන දිගු කල් ගතවෙත්ම එය අපද්‍රව්‍ය යන නාමයෙන් හඳුන්වනු නොලබයි.

"අවශිෂ්ට අපද්‍රව්‍ය" යන්නෙන් ජෛව අපද්‍රව්‍ය ලෙස සලකනු නොලබන්නාවූ හා නැවත භාවිතය හෝ ප්‍රතිචක්‍රීකරණය කිරීම සඳහා හෝ ගනු නොලබන අපද්‍රව්‍ය යනුවෙන් අදහස් කෙරේ.

"ප්‍රතිභාවිතාකරණීය අපද්‍රව්‍ය" යන්නෙන් වරක් භාවිතා කර පිරිසිදුකර හෝ සෝදා නැවත භාවිතයට ගනු ලබන්නා වූ අපද්‍රව්‍ය අදහස් කෙරේ.

| | | |
|---|---|---|
| | | "සනීපාරක්ෂක බිම් පිරවුම" යන්නෙන් සමාජයත් සමග බැඳුනු සෞඛ්‍ය සහ පාරිසරික බලපෑම් අවම කරන්නා වූ ශ්‍රී ලංකාවේ පිළිගත් ප්‍රමිතීන්ට අනුකූලව අපද්‍රව්‍ය විනාශ කරන්නාවූ ස්ථානය අදහස් කෙරේ.<br><br>"ලේකම්" යන්නෙන් නගර සභා ආඥා පනතේ (255 පරිච්ඡේදය) 27(1) වැනි වගන්තියට යටත්ව පත් කරනු ලැබූ ලේකම් වේ.<br><br>"වෙන් කිරීම" යන්නෙන් මෙම අතුරු ව්‍යවස්ථාවන්හි යොද ඇති ප්‍රභේදයන්ට අනුකූලව අපද්‍රව්‍ය විවිධ වර්ගවලට තෝරා වෙන් කිරීම අදහස් කෙරේ.<br><br>"ඝන අපද්‍රව්‍ය" යන්නෙන් පාරිභෝජනයට ගත නොහැකි අත්හරිනු ලැබුවාවූ ද, දූවිලි, කසල සහ අළු යන අපද්‍රව්‍ය අදහස් කෙරේ.<br><br>"මාරු කරන ස්ථානය" යන්නෙන් නගර සභාව විසින් නැවත භාවිතයට ගැනීමේ කාර්යය ක්‍රියාත්මක කිරීමට හෝ සැකසුම් කිරීමට හෝ ඉවත් කිරීමේ කටයුතු සාර්ථක ලෙස කුඩා ප්‍රමාණයේ වාහනවලින් ලොකු ප්‍රමාණයේ වාහන වලට මාරු කිරීම සඳහා නියම කරන ලද ස්ථානය අදහස් කෙරේ.<br><br>"ප්‍රවාහනය" යන්නෙන් මිනිස්, සත්ත්ව හෝ යාන්ත්‍රික බලය භාවිතා කර අපද්‍රව්‍ය රඳවනු ලබන ස්ථානයේ සිට එය භාවිතයට හෝ බැහැර කිරීම් කරනු ලබන ස්ථානවලටගෙන යාම අදහස් කෙරේ.<br><br>"සැකසීම" යන්නෙන් මහජනයාට හෝ පරිසරයට ඇතිවිය හැකි හානිය හෝ විනාශය අවම කිරීම උදෙසා ගනු ලබන්නාවූ හෝ ක්‍රියාත්මක කරනු ලබන්නාවූ ක්‍රියාකාරකම් අදහස් කෙරේ. |

**උපලේඛනය 01**

**සේවා ගාස්තු**

| | උප වගන්ති 10, 11, 12, 13, 14, 15, 16, 17 සහ 18 යටතේ වර්ග කරන ලද අයිතිකරුවන් සහ පදිංචිකරුවන් වර්ගය | | | | | | | | |
|---|---|---|---|---|---|---|---|---|---|
| | උප වගන්ති 10 යටතේ | උප වගන්ති 11 යටතේ | උප වගන්ති 12 යටතේ | උප වගන්ති 13 යටතේ | උප වගන්ති 14 යටතේ | උප වගන්ති 15 යටතේ | උප වගන්ති 16 යටතේ | උප වගන්ති 17 යටතේ | උප වගන්ති 18 යටතේ |
| සේවා ගාස්තු විස්තරය | (රු.) | (රු.) | (රු.) | (රු.) | (රු.) | (රු.) | (රු.) | (රු.) | (රු.) |
| කිලෝ එක සඳහා සේවා ගාස්තු | 3.5 | 3.5 | 3.5 | 3.5 | 2 | 4.5 | 2 | 10 | 3.5 |

**උපලේඛනය**

**සේවා ගාස්තු**

| | | | | | | | | | |
|---|---|---|---|---|---|---|---|---|---|
| | උපවගන්ති 08, 09 සහ 19 යටතේ වර්ග කරන ලද අයිතිකරුවන් සහ පදිංචිකරුවන් වර්ගය | | | | | | | | |
| | උප වගන්ති 08 යටතේ | උප වගන්ති 09 යටතේ | උප වගන්ති 19 යටතේ | | | | | | |
| සේවා ගාස්තු විස්තරය | (රු.) | (රු.) | (රු.) | | | | | | |
| ට්‍රැක්ටර් එක සඳහා සේවා ගාස්තු | 3,500.00 | 3,500.00 | | | | | | | |

10-268

# විවිධ දැන්වීම්

## රජ්ගම ප්‍රාදේශීය සභාව

### 2019 වර්ෂය සඳහා වෙළෙඳ බලපත්‍ර ගාස්තු පැනවීම

1987 අංක 15 දරන ප්‍රාදේශීය සභා පනතේ 147 වන වගන්තිය සමග කියවිය යුතු එකී පනතේ 149 වගන්තිය යටතේ රජ්ගම ප්‍රාදේශීය සභාවට ලැබී ඇති බලතල ප්‍රකාරව රජ්ගම ප්‍රාදේශීය සභා බලප්‍රදේශය ඇතුළත කරගෙන යනු ලබන පහත උපලේඛනයේ I වන තීරුවේ සඳහන් එක් එක් කර්මාන්ත වෙනුවෙන් එම උපලේඛනයේ II වන තීරුවේ එක් එක් කර්මාන්ත පවත්වාගෙන යනු ලබන ස්ථානයේ වාර්ෂික වටිනාකමට අනුරූප තීරුවේ නිරූපිත ප්‍රමාණයක කර්මාන්ත හෝ ව්‍යාපාර බලපත්‍ර ගස්තු 2019 වර්ෂය සඳහා පනවා අයකළ යුතු බවටත් එකී කර්මාන්ත බලපත්‍ර යටතේ තැනැත්තෙකු 2019 වර්ෂයේ අප්‍රේල් 30 වැනි දිනට පෙර රජ්ගම ප්‍රාදේශීය සභාවට ගෙවිය යුතු බවට රජ්ගම ප්‍රාදේශීය සභාවේ සභාපති ටී. නිමල් වන මා වෙත පැවරී ඇති බලතල ප්‍රකාරව තීරණය කරන බව මෙයින් දැනුම් දෙමි.

ටී නිමල්,
ලේකම්,
රජ්ගම ප්‍රාදේශීය සභාව.

2018 අගෝස්තු මස 06 වැනි දින,
රජ්ගම ප්‍රාදේශීය සභා කාර්යාලයේ දී ය.

**උපලේඛනය**

*1987 අංක 15 දරන ප්‍රාදේශීය සභා පනතේ 149 වැනි වගන්තිය යටතේ වෙළෙඳ බලපත්‍ර ගාස්තු*

| I වන තීරුව<br>කර්මාන්ත හෝ ව්‍යාපාර | II වන තීරුව<br>පරිශ්‍රයෙහි වාර්ෂික වටිනාකම | | |
|---|---|---|---|
| | රු.750.00 නොයික්මවන අවස්ථාවක | රු.750.00 ඉක්මවන එහෙත් රු. 1500.00 නොයික්මවන අවස්ථාවක | රු.1500.00 ඉක්මවන අවස්ථාවක |
| | රු. ශ. | රු. ශ | රු. ශ |
| 01. බේකරියක් පවත්වාගෙන යාම | 500.00 | 750.00 | 1000.00 |
| 02. බත්කඩ හෝ ආපනශාලා පවත්වාගෙන යාම | 500.00 | 750.00 | 1000.00 |
| 03. තේ කඩයක් හෝ කෝපි කඩයක් පවත්වාගෙන යාම | 500.00 | 750.00 | 1000.00 |
| 04. බත් කඩයක් පවත්වාගෙන යාම | 500.00 | 750.00 | 1000.00 |
| 05. ලැගුම් නිවාස පවත්වාගෙන යාම (කාමර 03ට වැඩි) | 500.00 | 750.00 | 1000.00 |
| 06. මාළු විකිණීමේ ස්ථානයක් පවත්වාගෙන යාම | 500.00 | 750.00 | 1000.00 |
| 07. ගව මස් හැර වෙනත් මස් වර්ග විකිණීමේ ස්ථානයක් පවත්වාගෙන යාම | 500.00 | 750.00 | 1000.00 |
| 08. හෝටල් පවත්වාගෙන යාම | 500.00 | 750.00 | 1000.00 |
| 09. කිරි පට්ටියක් පවත්වාගෙන යාම | 500.00 | 750.00 | 1000.00 |
| 10. කොණ්ඩා සැකසීමේ සැලුන්හල් පවත්වාගෙන යාම | 500.00 | 750.00 | 1000.00 |
| 11. අයිස් කර්මාන්තශාලාවක් පවත්වාගෙන යාම | 500.00 | 750.00 | 1000.00 |
| 12. ලොන්ඩරියක් පවත්වාගෙන යාම | 500.00 | 750.00 | 1000.00 |
| 13. ශීත කළ මස් විකිණීමේ ස්ථානයක් පවත්වාගෙන යාම | 500.00 | 750.00 | 1000.00 |
| 14. කිරි හලක් පවත්වාගෙන යාම | 500.00 | 750.00 | 1000.00 |
| 15. බේකරි නිෂ්පාදන අලෙවිකරණය | 500.00 | 750.00 | 1000.00 |
| 16. විලා හෝ බීච් හට් පවත්වාගෙන යාම | 500.00 | 750.00 | 1000.00 |
| 17. ස්නැක් බාර් එකක් හෝ කූල් ස්පොට් එකක් පවත්වාගෙන යාම | 500.00 | 750.00 | 1000.00 |

එකී උපලේඛනයේ සඳහන් කර්මාන්ත ව්‍යාපාර 1968 අංක 14 දරන සංචාරක සංවර්ධන පනතේ කාර්යය සඳහා එම හෝටලය, ආපනශාලා හෝ නවාතැන්පල ශ්‍රී ලංකා සංචාරක මණ්ඩලයේ ලියාපදිංචි කරනු ලබනු ඇත්තා වූ ද නම්ද, අනුමත කර පිළිගත්තා වූ ද එසේ කරනු ලැබූ එකී ගාස්තුව අයකරනු ලබන අවුරුද්දට පෙරාතුව අවුරුද්දේ ආදායම අනුව විය යුතු අතර එම ආදායමෙන් 1% ක් විය යුතු බවත් ය.

**උපලේඛනය**

අන්තරාදායක කර්මාන්ත ව්‍යාපාර

| *I වන තීරුව*<br>*කර්මාන්ත හෝ ව්‍යාපාර* | *II වන තීරුව*<br>*පරිශ්‍රයෙහි වාර්ෂික වටිනාකම* | | |
|---|---|---|---|
| | *රු.750.00 නොයික්මවන අවස්ථාවක* | *රු.750.00 ඉක්මවන එහෙත්. රු. 1500.00 නොයික්මවන අවස්ථාවක* | *රු.1500.00 ඉක්මවන අවස්ථාවක* |
| | *රු. ශ.* | *රු. ශ* | *රු. ශ* |
| 01. යන්ත්‍රානුසාරයෙන් කබොක්, බොරළු හෝ කලුගල් කැඩීමේ ස්ථානයක් පවත්වාගෙන යාම | 500.00 | 750.00 | 1000.00 |
| 02. කබොක්, බොරළු හෝ කළුගල් ගබඩාකර තැබීමේ ස්ථානයක් පවත්වාගෙන යාම | 500.00 | 750.00 | 1000.00 |
| 03. ගඩොල් පෝරණුවක් පවත්වාගෙන යාම | 500.00 | 750.00 | 1000.00 |

| | I වන තීරුව<br>කර්මාන්ත හෝ ව්‍යාපාර | II වන තීරුව<br>පරිශ්‍රයෙහි වාර්ෂික වටිනාකම<br>රු.750.00 නොයික්මවන අවස්ථාවක | <br><br>රු.750.00 ඉක්මවන එහෙත්. රු. 1500.00 නොයික්මවන අවස්ථාවක | <br><br>රු.1500.00 ඉක්මවන අවස්ථාවක |
|---|---|---|---|---|
| | | රු. ශ. | රු. ශ | රු. ශ |
| 04. | උළු පෝරණුවක් පවත්වාගෙන යාම | 500 0 | 750 0 | 1000 0 |
| 05. | ත්‍රීවීලර් සර්විස් පවත්වාගෙන යාම | 500 0 | 750 0 | 1000 0 |
| 06. | මෝටර් සයිකල් සර්විස් කිරීම | 500 0 | 750 0 | 1000 0 |
| 07. | ගිනිපෙට්ටි නිෂ්පාදන කිරීමේ ස්ථානයක් පවත්වාගෙන යාම | 500 0 | 750 0 | 1000 0 |
| 08. | යන්ත්‍රානුසාරයෙන් නොවන කබොක්, බොරළු හෝ කළුගල් කැඩීමේ ස්ථානයක් පවත්වාගෙන යාම | 500 0 | 750 0 | 1000 0 |
| 09. | මැතිලේඩට් ස්ප්‍රීතු නිෂ්පාදනය හෝ ගබඩාකිරීමේ ස්ථානයක් පවත්වාගෙන යාම | 500 0 | 750 0 | 1000 0 |
| 10. | කොහු හෝ වෙනත් කෙඳි වර්ග නිපදවීම ගබඩාකර තබාගැනීම හා විකිණීමේ ස්ථානයක් පවත්වාගෙන යාම | 500 0 | 750 0 | 1000 0 |
| 11. | අයිස් නිපදවීමේ ස්ථානයක් පවත්වාගෙන යාම | 500 0 | 750 0 | 1000 0 |
| 12. | අයිස් ගබඩාකිරීමේ හා විකිණීමේ ස්ථානයක් පවත්වාගෙන යාම | 500 0 | 750 0 | 1000 0 |
| 13. | ධාන්‍ය හෝ මාංශ භෝග ටොන් 05 ක ප්‍රමාණයක් ගබඩාකර තබා ගැනීමේ ස්ථානයක් පවත්වාගෙන යාම | 500 0 | 750 0 | 1000 0 |
| 14. | ස්වර්ණාභරණ නිෂ්පාදනය කිරීමේ හෝ අළුත්වැඩියා කිරීමේ ස්ථානයක් පවත්වාගෙන යාම | 500 0 | 750 0 | 1000 0 |
| 15. | ඉන්ධන මගින් ක්‍රියාකරන යන්ත්‍ර පාවිච්චි කරන ලී ඉරුම්මෝලක් හෝ දැව ගබඩාවක් පවත්වාගෙන යාම | 500 0 | 750 0 | 1,000 0 |
| 16. | යන්ත්‍රෝපකරණ පාවිච්චි කරන ඉරුම් මෝලක් පවත්වාගෙන යාම | 500 0 | 750 0 | 1,000 0 |
| 17. | කම්හලක් පවත්වාගෙන යාම (යන්ත්‍ර නොමැති) | 500 0 | 750 0 | 1,000 0 |
| 18. | අලුත් හෝ පරණ පාවිච්චි කරන ලද රබර් ටයර් හෝ ටියුබ් 50ට වැඩි | 500 0 | 750 0 | 1,000 0 |
| | ප්‍රමාණයක් ගබඩාකර තබා ගැනීමේ ස්ථානයක් පවත්වාගෙන යාම | 500 0 | 750 0 | 1,000 0 |
| 19. | සිල්ක් හා කෘත්‍රිම රෙදි විවීම | | | |
| 20. | මුද්‍රණාලයක් පවත්වාගෙන යාම | 500 0 | 750 0 | 1,000 0 |
| 21. | අත් බෝර මගින් කළුගල් කැඩීම | 500 0 | 750 0 | 1,000 0 |
| 22. | වී මෝලක් පවත්වාගෙන යාම | 500 0 | 750 0 | 1,000 0 |
| 23. | මිනිරන් ශුද්ධ කිරීමේ හෝ ගබඩාකිරීමේ ස්ථානයක් පවත්වාගෙන යාම | 500 0 | 750 0 | 1,000 0 |
| 24. | පොහොර හෝ රසායනික පොහොර නිෂ්පාදනය කිරීමට හෝ | 500 0 | 750 0 | 1,000 0 |
| | ගබඩාකර තබාගැනීම හෝ විකිණීම සඳහා ස්ථානයක් පවත්වාගෙන යාම | 500 0 | 750 0 | 1,000 0 |
| 25. | කුකුළන් 500ට වැඩි ගණනක් සඳහා කුකුළු ගාලක් ඇතුළු කොරටුවක් පවත්වාගෙන යාම | 500 0 | 750 0 | 1,000 0 |
| 26. | බැටළුවන්, එළුවන්, හෝ ඌරන් 10ට වැඩි ගණනක් සඳහා මඩුවක් හෝ ගාලක් පවත්වාගෙන යාම | 500 0 | 750 0 | 1,000 0 |
| 27. | කුකුළන්, කිකිළියන් 100ට වැඩි ගාලක් හෝ කොරටුවක් පවත්වාගෙන යාම | 500 0 | 750 0 | 1,000 0 |
| 28. | සම් භාණ්ඩ විකිණීම සඳහා ස්ථානයක් පවත්වාගෙන යාම | 500 0 | 750 0 | 1,000 0 |
| 29. | හම් පදම් කරන ස්ථානයක් පවත්වාගෙන යාම | 500 0 | 750 0 | 1,000 0 |
| 30. | රබර් නිෂ්පාදනය කිරීම හෝ ගබඩාකර තබා ගැනීමේ ස්ථානයක් පවත්වාගෙන යාම | 500 0 | 750 0 | 1,000 0 |
| 31. | පුවක් සකස් කිරීම හෝ ගබඩාකර තබා ගැනීමේ ස්ථානයක් පවත්වාගෙන යාම | 500 0 | 750 0 | 1,000 0 |
| 32. | වෛද්‍ය රසායනාගාරයක් පවත්වාගෙන යාම | 500 0 | 750 0 | 1,000 0 |
| 33. | වඩු මඩුවක් හෝ ලී මඩුවක් සඳහා ස්ථානයක් පවත්වාගෙන යාම | 500 0 | 750 0 | 1,000 0 |

| | I වන තීරුව<br>කර්මාන්ත හෝ ව්‍යාපාර | II වන තීරුව<br>පරිශ්‍රයෙහි වාර්ෂික වටිනාකම | | |
|---|---|---|---|---|
| | | රු.750.00 නොයික්මවන අවස්ථාවක | රු.750.00 ඉක්මවන එහෙත්. රු. 1500.00 නොයික්මවන අවස්ථාවක | රු.1500.00 ඉක්මවන අවස්ථාවක |
| | | රු. ශ. | රු. ශ | රු. ශ |
| 34. | ඇසිඩ් වර්ග නිපදවීමේ හෝ ගබඩාකිරීමේ ස්ථානයක් පවත්වාගෙන යාම | 500 0 | 750 0 | 1,000 0 |
| 35. | විනාකිරි නිපදවීමේ හෝ ගබඩාකිරීමේ ස්ථානයක් පවත්වාගෙන යාම | 500 0 | 750 0 | 1,000 0 |
| 36. | හුණුගල් හෝ හුණු ගබඩාකිරීම සඳහා ස්ථානයක් පවත්වාගෙන යාම | 500 0 | 750 0 | 1,000 0 |
| 37. | හුණු පිළිස්සීම හෝ සකස් කිරීම හෝ ගබඩාකිරීම සඳහා ස්ථානයක් පවත්වාගෙන යාම | 500 0 | 750 0 | 1,000 0 |
| 38. | සෝඩා නිපදවීමේ ස්ථානයක් පවත්වාගෙන යාම | 500 0 | 750 0 | 1,000 0 |
| 39. | සම් භාණ්ඩ නිෂ්පාදනය සඳහා කර්මාන්ත ශාලාවක් පවත්වාගෙන යාම | 500 0 | 750 0 | 1,000 0 |
| 40. | යන්ත්‍රානුසාරයෙන් ධාන්‍ය හෝ මාංශ, භෝග කෙටීම (වී මෝලක්) පවත්වාගෙන යාම | 500 0 | 750 0 | 1,000 0 |
| 41. | බේකින් පවුඩර් නිපදවීමේ ස්ථානයක් පවත්වාගෙන යාම | 500 0 | 750 0 | 1,000 0 |
| 42. | කළුගල් පිපිරවීමේ ස්ථානයක් පවත්වාගෙන යාම | 500 0 | 750 0 | 1,000 0 |
| 43. | ඉටිපන්දම් නිපදවීමේ ස්ථානයක් පවත්වාගෙන යාම | 500 0 | 750 0 | 1,000 0 |
| 44. | බතික් රෙදි නිපදවීමේ ස්ථානයක් පවත්වාගෙන යාම | 500 0 | 750 0 | 1,000 0 |
| 45. | රසායන ද්‍රව්‍ය පාවිච්චි කොට (කුරුඳු, කරදමුංගු) එනසාල් හෝ දෙහි වර්ග සකස් කිරීමේ ස්ථානයක් පවත්වාගෙන යාම | 500 0 | 750 0 | 1,000 0 |
| 46. | ගිනිකෙලි භාණ්ඩ හෝ රතිඤ්ඤා විකිණීමේ හා ගබඩාකිරීමේ ස්ථානයක් පවත්වාගෙන යාම | 500 0 | 750 0 | 1,000 0 |
| 47. | බැටරි චාර්ජ් කිරීම හෝ අලුත්වැඩියා කිරීමේ ස්ථානයක් පවත්වාගෙන යාම | 500 0 | 750 0 | 1,000 0 |
| 48. | මෝටර් වාහන අළුත්වැඩියා කිරීම හෝ මෝටර් සර්විස් කිරීම සඳහා වැඩපලක් පවත්වාගෙන යාම | 500 0 | 750 0 | 1,000 0 |
| 49. | බෝට්ටු සෑදීමේ හෝ අළුත්වැඩියා කිරීමේ ආයතනයක් පවත්වාගෙන යාම | 500 0 | 750 0 | 1,000 0 |
| 50. | යන්ත්‍රානුසාරයෙන් ලෝහ කුඩු කිරීමේ ආයතනයක් පවත්වාගෙන යාම | 500 0 | 750 0 | 1,000 0 |
| 51. | බෙලෙක් වැඩපලක් පවත්වාගෙන යාම | 500 0 | 750 0 | 1,000 0 |
| 52. | කෘෂි රසායන ද්‍රව්‍ය නිපදවීමේ හෝ ගබඩාකර තබා ගැනීමේ ස්ථානයක් පවත්වාගෙන යාම | 500 0 | 750 0 | 1,000 0 |
